# නියමුවා

ISSN 1391 - 1031
2018 අප්‍රේල්
23 වෙළුම 12 කලාපය

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

ආධාරය රු 30/=

පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී


"ජයග්‍රහණ අත්පත් කර ගැනීම සඳහා, කම්කරුවන් හා දුප්පත් ගොවි ජනතාව බලය අල්ලාගනු දැකීම සඳහා, එම බලය රැකගනිමින් එයින් නිසි ප්‍රයෝජන ගනු සඳහා ඔබට සංවිධානය, නැවතත් සංවිධානය තව තවත් සංවිධානය අවශ්‍ය වනු ඇත."

**ලෙනින්**
**තෝරාගත් කෘති,**
**05වැනි වෙළුම,**
**141 පිටුව**

## සදා සමරමු සොහොයුරෝ

**මේ ගණඳුරු**
**පැය පරදන**
**ගමනේ මහ**
**දිරිය නුඹයි...**

**පිස එරබදු**
**එන මඳ නළ**
**අලුත් මඟට**
**නවෝදයයි...**

**නුඹ පණ නළ**
**පිදූ දෙරණ**
**සිවු කොණ රතු**
**මල් පූදියි...**

**හෙට අරුණළු**
**නැගෙන පැයේ**
**නුඹ පැතූ ඒ**
**ලොව බිහිවෙයි...**



47 වැනි අප්‍රේල්
විරු සමරුව නිමිත්තෙනි

# විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීමේ යෝජනාව ජ.වි.පෙ.න්

විධායක ජනාධිපති ධුරය අහෝසි කරන බවට ජනතාවට පොරොන්දු වී වසර තුනක් ගතවී තිබෙන නමුත් එ.ජා.ප.යට හෝ මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයාට විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම වෙනුවෙන් සංශෝධනයක් ගෙනඒමට වුවමනාවක් නැති බව පෙනීයන බැවින් විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීමේ 20වැනි සංශෝධනය පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් ලෙස ඉදිරිපත් කිරීමට ජනතා විමුක්ති පෙරමුණ සූදානම් වේ.

1994 සිට මේ වන තෙක් විධායක ජනාධිපති ධුරයට පත්වූ සියලු දෙනා ජනාධිපතිවරණයන්හිදී විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීමට ජනවරම ඉල්ලා සිටිමේ ඉතිහාසයක් ඇත. චන්ද්‍රිකා බණ්ඩාරනායක මහත්මිය 1994දී එම දුරය අහෝසි කරන බවට පොරොන්දු වූ අතර ඒ සඳහා දිනද නියම කර තිබිණි. අනතුරුව මහින්ද රාජපක්ෂ මහතා අවස්ථා තුනකදී අපේක්ෂකයෙකු ලෙසත් 1994දී සහ 2000දී චන්ද්‍රිකාගේ පාර්ශ්වකරුවෙකු ලෙසත් විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීම නියෝජනය කළ අතර 2005දීත් ඒ බවට පොරොන්දු විය. විධායක ජනාධිපති ධුරය නිර්මාණය කළ එක්සත් ජාතික පක්ෂයද විවිධ අවස්ථාවලදී විධායක ජනාධිපති ධුරය අහෝසි කරන බව ප්‍රකාශ කර තිබේ. එ.ජා.ප.ය තිස්සමහාරාමයේදී පැවැත්වූ පක්ෂ සමුළුවකදී විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීමේ යෝජනාවක් සම්මත කර තිබිණි. එසේම මේ වන විට ඇතිවී තිබෙන තත්වය අනුව රනිල් වික්‍රමසිංහට ජනාධිපති ධුරයට පත්වීමට නොහැකි නිසාම ඔහු විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීමට සහය දෙනු ඇතැයි විශ්වාස කෙරේ. මෛත්‍රීපාල සිරිසේන නායකත්වය දෙන කණ්ඩායමටද ඔවුන් විසින් රටට දෙන ලද එකඟතාව අනුව විධායක ජනාධිපත් ක්‍රමය අහෝසි කිරීමට පක්ෂව කටයුතු කිරීමට සිදුවනු ඇත. මේ තත්වය තුළ ජ.වි.පෙ. විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාව සම්මත කර ගැනීමේලා වැඩි ඉඩකඩක් පවතින බව දේශපාලන ආරංචි මාර්ග සඳහන් කරයි.

**02 වැනි පිටුවට**




**2018 මාර්තු 09**
**ජාතිවාදයට එරෙහිව විහාරමහා දේවි උද්‍යානය ඉදිරිපිට**


**05 ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදය...**



මේ මොහොතේ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමේ යෝජනාවක් සම්මත කරගැනීමේ...

**07 රටේ ආර්ථිකයේ පැවැත්ම...**



මෙහි අපූර්ව දේ වන්නේ, රජයේ ණය අවශ්‍යතාවයන්ට සීමා බාධක නොතකා ණය ගැනීමට හැකියාව...

**11 ජාතිවාදය ගැන...**



අපේ රටේ මිනිස් ඝාතන, රිය අනතුරු, පැහැරගෙන යාම්, ස්ත්‍රී දූෂණ ළමා අපචාර ...

| | |
|---|---|
| සංවාදය........................ | 03 |
| තරුණ........................... | 04 |
| ආවර්ජනා....................... | 06 |
| ජාත්‍යන්තර ...................... | 08 |
| දැනුම........................... | 09 |
| කාන්තා........................... | 10 |
| කාලීන - 71 අරගලය ........ | 12 |
| වේදිකාව........................ | 13 |


***යුක්තිගරුක දේශයක්! සාධාරණ සමාජයක්!! නිවහල් මිනිසෙක්!!!***

# සටන් බිම

## විශ්වවිද්‍යාල අකර්මණ්‍ය නොකොට වහාම විසඳුම් දෙනු!

### ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානය

විශ්වවිද්‍යාල අනධ්‍යයන සේවකයින්ගේ වැටුප් හා අනෙකුත් ඉල්ලීම්වලට වහා විසඳුම් ලබාදෙන ලෙසට ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ සභාපති ලාල්කාන්ත සහෝදරයා විසින් උසස් අධ්‍යාපන අමාත්‍ය කබීර් හෂීම් මහතා වෙත ලිඛිත දැනුම්දීමක් කර ඇත. ඉල්ලීම් මුල්කර ගනිමින් පෙබරවාරි 18 ආරම්භ කරන ලද විශ්වවිද්‍යාල අනධ්‍යයන සේවකයින්ගේ වැඩවර්ජනය විසඳීමට උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව ප්‍රමාණවත් මැදිහත්වීමක් කර නොමැති බවද එහි සඳහන්ය.

මෙම කාර්මික ආරවුල තවදුරටත් උත්සන්න වීමට පෙර වහාම මැදිහත්ව විසඳුම් ලබාදෙන ලෙසත්, අඩපණව ඇති සරසවි සිසුන්ගේ අධ්‍යාපන කටයුතු හා විශ්වවිද්‍යාල සේවාවේ අනෙකුත් කටයුතු යථාවත් කරන ලෙසත් එමගින් තවදුරටත් දන්වා තිබේ.

## නීති විරෝධී ගුරුමාරුවලට එරෙහි වෘත්තීය ක්‍රියාමාර්ග

### ලංකා ගුරුසේවා සංගමය

අධ්‍යාපන අමාත්‍යාංශය නීති විරෝධිව ගුරු සේවයේ ස්ථානමාරු සිදුකළහොත් එම ගුරුවරුන් සමග වෘත්තීය ක්‍රියාමාර්ගවලට එළැඹෙන බව ලංකා ගුරුසේවා සංගමය අධ්‍යාපන ඇමතිවරයාට අනතුරු අඟවා තිබේ.

ඇමතිවරයා වෙත යොමු කරන ලිපියක් මගින් සංගමය පවසන්නේ, ජාතික ගුරුමාරු ප්‍රතිපත්තිය, ආයතන සංග්‍රහය හා කාර්ය පටිපාටික රීති උල්ලංඝනය කරමින් නීති විරෝධිව ස්ථානමාරු කර ඇති බවත් මෙය නීතිය ඉදිරියේදී අභියෝගයට ලක්වීම වැළැක්වීමට අවස්ථාවාදී වෘත්තීය සමිති කිහිපයක් යොදාගෙන ඇති බවත්ය. ස්ථාන මාරුවීම් නිත්‍යානුකූලව සිදුකළ යුතු බවත් ගුරුමාරු මණ්ඩල නිර්දේශ ලබාගැනීමෙන් පසු විනිවිදභාවයෙන් යුතු ස්ථාන මාරු ලබාදිය යුතු බවත් එම ලිපියේ වැඩිදුරටත් දන්වා ඇත.

## ලංවිම වෘත්තීය සමිති නායක මර්දනයට එරෙහිව මානව හිමිකම් කොමිසමට පැමිණිලි

සේවකයින්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් සහ විදුලිබල මණ්ඩලය තුළ සිදුවන වංචා දූෂණවලට එරෙහිව සටන් කළ ලංකා විදුලිබල මණ්ඩලයේ වෘත්තීය සමිති නායකයින් 07 දෙනෙකු වහාම ක්‍රියාත්මක වන පරිදි අත්තනෝමතික ලෙස වැඩ තහනමකට ලක්කර ඇති අතර ඊට එරෙහිව මානව හිමිකම් කොමිෂමට පැමිණිලි කර තිබේ. නීතිඥ සුනිල් වටගලගේ ප්‍රධානත්වයෙන් ලංවිම ඒකාබද්ධ වෘත්තීය සමිති සන්ධානයේ නියෝජිතයින්ගේ සහභාගීත්වයෙන් මෙම පැමිණිලි කිරීම සිදුවිය.

## බහාලුම් සේවක සටනට ජය

දින දෙකක් පුරා පැවති බහලුම් ප්‍රවාහන සේවක වැඩ වර්ජනය ජයග්‍රහණයෙන් අවසන්වූ බව සමස්ත ලංකා බහාලුම් ප්‍රවාහන සේවක සංගමයේ කැඳවුම්කරු බී.අයි. ආබ්දීන් සහෝදරයා පවසා සිටී.

වැඩවර්ජනයට අදාළ ඉල්ලීම් සම්බන්ධ වරාය අධිකාරියේ හා ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ බලධාරින් හා කළ සාකච්ඡාවේදී විසඳුම් ලැබුණු හෙයින් වැඩ වර්ජනය අවසන් කිරීමට තීරණය කළ බවද ආබ්දීන් සහෝදරයා නියමුවා වෙත දැනුම් දුන්නේය.

## රෝගී බිල්පත් නිකුත් කිරීම හරහා සෞඛ්‍ය සේවාව විකිණීමේ සැලසුමක්

### සමස්ත ලංකා හෙද සංගමය

රජයේ රෝහල් වලින් ප්‍රතිකාර ලබන රෝගීන්ගේ පරීක්ෂණ, ඖෂධ, ඇතුළු කාර්යය මණ්ඩල වෙනුවෙන් වැය වූ මුදල් සඳහා බිල්පත් ලබා දීම මගින් සෞඛ්‍ය සේවාව විකිණීමේ සැලසුමක් පවතින බව සමස්ත ලංකා හෙද සංගමය පවසා සිටී. මෙම බිල්පත ලබා දීම මගින් ආණ්ඩුවේ වුවමනාව වී ඇත්තේ ප්‍රතිකාර ලැබ රෝහලින් පිටව යන රෝගියා වෙනුවෙන් ආණ්ඩුව මෙපමණ මුදලක් වැය කර තිබේ යන සිතුවිල්ල රෝගීයාත් රෝගියා හා පවුලෙ අය තුළත් ජනිත කොට යම් කාලයකින් රජය රෝගියාට වියදම් කළ මුදලින් යම් මුදලක් හෝ ප්‍රතිශතයක් විවිධ හේතුන් දක්වමින් අය කර ගැනීම සඳහා උත්සහා දරන බවද එම සංගමය කියා සිටී.

මෙරට සෞඛ්‍ය සේවාව ජනතාව දුක් මහන්සියෙන් උපයන මුදල්වලින් ලබා ගන්නා බදු මුදලින් නඩත්තු කරන බවත් පසුගිය කාලයේ රට පාලනය කල ආණ්ඩු මෙන්ම වර්තමාන ආණ්ඩුවද රටේ ජනතාවගේ සෞඛ්‍ය සේවය සඳහා අයවැයෙන් වෙන් කරන මුදල විශාල වශයෙන් කප්පාදු කරමින් සිටින බවත් එහි ප්‍රතිඵලයක් ලෙස ඩෙංගු වැනි වසංගත රෝග රට පුරා පැතිර යාමේ සිට රටේ ජනතාව වකුගඩු රෝග දියවැඩියාව වැනි බෝ නොවන රෝග හා විවිධ ලෙඩ රෝගවලට ගොදුරු වීම දිනෙන් දින වැඩි වෙමින් තිබෙන බවත් පවසන සමස්ත ලංකා හෙද සංගමය එම අර්බුදය විසනවා වෙනුවට දැනට පවතින සෞඛ්‍ය සේවාවත් විකිණීමේ සැලසුමක් ආණ්ඩුව ක්‍රියාත්මක කරමින් සිටින බවද පවසයි.

එබැවින් මෙරට නිදහස් සෞඛ්‍ය සේවාව මිල කිරීමට ඇමතිවරයා ප්‍රමුඛ ආණ්ඩුව දරන උත්සාහය පරාජය කිරීම සඳහා හෙද හෙදියන් කටයුතු කරන බවත් ඒ සඳහා රටේ ප්‍රගතිශීලී වෘත්තීය සමිති මෙන්ම ජනතාවද දැනුවත් කිරීමට කටයුතු කරන බවද සමස්ත ලංකා හෙද සංගමය පවසා සිටී.

# එතෙරින්...

## "වර්ණවත් ලොවකට ජාතිවාදය එපා" රෝමයේදී




"වර්ණවත් ලොවකට ජාතිවාදය එපා" මැයෙන් පසුගිය මාර්තු 25වැනිදා ජනතා විමුක්ති පෙරමුණේ රෝම කමිටුව විසින් සංවිධානය කළ සංවාදාත්මක වැඩසටහනක් රෝමයේදී පැවැත්විණි. මෙම අවස්ථාවට රෝමයේ ධර්මාශෝක විහාරයේ විහාරාධිපති නේපාලයේ නන්ද හිමියන්ද ඉතාලියේ ජාතිවාදයට එරෙහි ප්‍රගතිශීලී සංවිධාන රැසක නියෝජිතයෝද මෙම අවස්ථාවට සහභාගි වූහ.

## කටාර්හි ජාතිවාදයට එරෙහිව ශ්‍රී ලාංකික හමුවක්!



පසුගියදා ශ්‍රී ලංකාවේ ඇතිවූ ජාතිවාදී නැගිටීම්වලට එරෙහිව කටාර්හි වෙසෙන සියලු ජාතිකත්වයන් නියෝජනය කරන ජනතා නියෝජිතයින්ගේ හමුවක් පසුගියදා කටාර්හි ශ්‍රී ලංකා තානාපති කාර්යාල පරිශ්‍රයේදී පැවැත්විණි. කටාර් 'එතෙර අපි' සංවිධානය විසින් සංවිධානය කළ මෙම හමුවට කටාර් ශ්‍රී ලංකා සම්බන්ධීකරණ කමිටුව, කටාර්හි ශ්‍රී ලාංකේය ව්‍යාපාරික ප්‍රජාව, මුස්ලිම් ප්‍රජාවේ නියෝජිතයින්, කටාර්හි ශ්‍රී ලංකා දහම් පාසලේ නියෝජිතයින් සහ දෙමළ සහෝදර පිරිස්ද සහභාගි වී ඇත. කටාර්හි ශ්‍රී ලංකා තානාපති ඒ.එස්.පී. ලියනගේ මහතාද සහභාගි වී ඇත.

## නිහාල් ගලප්පත්ති ඕමානයේ සංචාරයක



ශ්‍රී ලංකා පාර්ලිමේන්තු නියෝජිත කණ්ඩායමක් පසුගියදා ඕමානයේ සංචාරය කළ අතර එහිදී ජනතා විමුක්ති පෙරමුණ පාර්ලිමේන්තු මන්ත්‍රී නිහාල් ගලප්පත්ති සහෝදරයා ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ පවතින රැඳවුම් මධ්‍යස්ථානයද නිරීක්ෂණය කළ අතර එහි රඳවා සිටින ශ්‍රී ලාංකිකයින් හමුවී ඔවුන්ගේ ගැටලු සාකච්ඡා කරන ලදී. ඊට අමතරව ඕමානයේ 'එතෙර අපි' ශාඛාවේ නියෝජිතයින් සමග ජ.වි.පෙ. ඕමාන කමිටුවේ සාමාජිකයින්ගේ සාකච්ඡා කිහිපයකටද ඔහු සහභාගි විය.

## විජිත හේරත් ජපානයට



ශ්‍රී ලංකා පාර්ලිමේන්තු නියෝජිත කණ්ඩායමක් ජපානයේ සිදු කළ සංචාරයක් අතරතුර ජනතා විමුක්ති පෙරමුණේ ජපන් - ටෝකියෝ කමිටුව විසින් සංවිධානය කළ ශ්‍රී ලාංකිකයින්ගේ හමු කිහිපයකට ජ.වි.පෙ. ප්‍රචාරක ලේකම් පාර්ලිමේන්තු මන්ත්‍රී විජිත හේරත් සහෝදරයා සහභාගි විය. මෙහිදී ලංකාවේ වත්මන් දේශපාලන තත්වය පිළිබඳව ජපානයේ ශ්‍රී ලාංකිකයින් සමග සංවාදයක් ඇතිකරගැනීමට හැකි විය.

## විධායක ජනාධිපති...

පළමු පිටුවෙන්

ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහෝදරයා විසින් විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීමේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳ අදහස ඉදිරිපත් කරන ලද්දේ, පසුගිය 19වැනි දින ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන කාර්යාලයේදී පවත්වන ලද මාධ්‍ය හමුවකදීය.

මෙහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ අනුර දිසානායක සහෝදරයා මෙසේද ප්‍රකාශ කළේය.

"අපේ රටේ දේශපාලනයේ විශේෂ ව්‍යාකූල තත්වයක් මතුවී තිබෙනවා. හැමදාමත් අපේ රටේ ජනතාවට විවිධ ජයග්‍රහණ ලබාගන්න හැකියාව ලැබුණේ එවැනි ව්‍යාකූල තත්වයන් මතුවූ අවස්ථාවලයි. ඒ අනුව රටටත් ජනතාවටත් හිතකර ප්‍රජාතන්ත්‍රවාදී නීති සංශෝධන සම්මත කරගන්න පුළුවන් වෙලා තිබෙනවා. උදාහරණයක් හැටියට 2001 වසරේදී ජ.වි.පෙ. මන්ත්‍රී කණ්ඩායම රටේ පැවති අස්ථාවර තත්වය උපයෝගී කරගෙන 17වැනි සංශෝධනය සම්මත කරගන්න කටයුතු කළා. පසුගිය 2015 වර්ෂයේදී එක්සත් ජාතික පක්ෂ අග්‍රාමාත්‍යවරයාත් ශ්‍රීල.නි.ප. ජනාධිපතිවරයාත් නියෝජනය කළ සුළුතර ආණ්ඩුව සහ විපක්ෂයේ වැඩි පිරිසක් නියෝජනය කරන අවස්ථාවේදී ප්‍රජාතන්ත්‍රවාදයට හිතකර 19වැනි සංශෝධනය සම්මත කරගන්න හැකියාව ලැබුණා.

එනිසා මෙවැනි දේශපාලන අස්ථාවර තත්වයන් ජනතාවට හිතකර තත්වයකට පත්කර ගැනීමට විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීම සඳහා ව්‍යවස්ථාවට 20වැනි සංශෝධනය ගෙනඒමට ජනතා විමුක්ති පෙරමුණ තීරණය කර තිබෙනවා. මොකද විධායක ජනාධිපති ධුරය ආපු වෙලාවේ සිටම වමේ ව්‍යාපාර, ප්‍රජාතන්ත්‍රවාදය අගයන ව්‍යාපාර විධායක ජනාධිපති ධුරය අහෝසි කළ යුතු බවට ප්‍රකාශ කළා. ජනතා විමුක්ති පෙරමුණ පළමුවැනි විධායක ජනාධිපතිවරයා බිහිවූ දා සිටම එම ධුරය අහෝසි කරන්න කියලා සටන් කළා." අනුර දිසානායක සහෝදරයා අවධාරණය කළේය.

නියමුවා
ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත
464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com

## අලුත් අවුරුද්ද හා වෙළඳපොළ...

අප්‍රේල් මාසය ජ.වි.පෙ.ට විශේෂ වන්නේ, 1971 අප්‍රේල් නැගිටීමේ සමරුව අප්‍රේල් මාසයට යෙදෙන නිසාය. අප්‍රේල් මාසය පොදු ජනතාවටද වැදගත්ය. ඒ, සිංහල-දෙමළ අලුත් අවුරුද්ද අප්‍රේල් මාසයේදී යෙදෙන නිසාය. එය අපේ රටේ වසන්ත සැණකෙළිය ලෙසද ඇතැම්හු හඳුන්වති.

අලුත් අවුරුද්ද අතීතයේදී ලාංකිකයාගේ සරල ආර්ථිකය හා බැඳී තිබිණි. පූර්ව ධනවාදී සමාජයේ හා ධනවාදයේ ආරම්භක අවධියේ අලුත් අවුරුද්ද සමරනු ලැබුයේ වාණිජකරණයෙන් තොරවය. සාමාන්‍යයෙන් අලුත් අවුරුද්ද යෙදෙන්නේ, කෘෂිකර්මාන්තයෙන් අස්වනු නෙළා ගනීමෙන් පසුවය. එසේම ගහ කොළ එල බරවී තිබීමද විශේෂයකි. සිය වගාවේ අස්වනු නෙළාගත් පසු යළි වගා කටයුතු ආරම්භ කරන තෙක් ලැබෙන නිදහස් කාලය අවුරුදු උත්සවයට පදනම් වී තිබේ. එවිට තම අස්වැන්න සහල්, උඳු ආදී කුමන ධාන්‍ය වර්ගයක් වුවද ජනතාව තමන් වගා කළ තමන්ට ආවේණික ධාන්‍යවලින් පිටි සකසා, පොල්වලින් තෙල් හිඳ, පැණි හෝ හකුරු යොදා රසකැවිලිද, කිරිබත්ද ආදී ආහාර තමන්ම සකසා ගත්හ. එවිට අලුත් අවුරුදු උත්සවය ස්වභාවික උත්සවයකි. මන්ද ඊට අවශ්‍ය හැමදේම තම තමන්ම නිපදවා ගන්නා නිසාය.

එහෙත් දැන් ධනවාදයේ කොල්ලකාරී අවධිය තුළ සියල්ල වාණිජකරණයට ලක්වන තත්වය තුළ අවුරුදු උත්සවයද වාණිජකරණයට ලක්ව තිබේ. එක් අතකින් නාගරිකව රැකියාවල නිරත වන මිනිසුන්ට අලුත් අවුරුද්දේ කෑම බීම තමන් විසින්ම සාදා ගැනීමට වේලාවක් නැත. එසේම දැන් හැමදෙනාම කෘෂිකර්මාන්තයේ නියැලෙන අය නොවන නිසා තමන්ගෙ’ම ධාන්‍ය, තෙල්, පිටි, පැණි ආදිය නැත. එහෙත් අවුරුදු නොකාද බැරිය. මේ අර්බුදයේදී ජනතාවට ‘පිහිට වීමට’ වෙළෙන්දා ඉදිරිපත් වේ. ජනවාරි, පෙබරවාරි වනවිටම රූපවාහිනිය හා පුවත්පත් මගින් වෙළෙන්දෝ අවුරුදු මතක් කිරීම අරඹති. බැංකු හිමියෝ අලුත් අවුරුද්ද වෙනුවෙන් අලුත් බැංකු ගිණුම් හඳුන්වා දෙති. රක්ෂණ සමාගම් නව අලුත් අවුරුදු රක්ෂණ ක්‍රම හඳුන්වා දෙති.

මේ අතර මහා පරිමාණ ඇඳුම් නිෂ්පාදකයෝ වසරක් පුරා ගොඩග'සී තිබූ තමන්ගේ ඇඳුම් හා රෙදි විකුණාගැනීමට ‘අවුරුදු සේල්’ ආරම්භ කරති. කේක් හා රසකැවිලි නිෂ්පාදකයෝ සිය පැරණි සියලු නිෂ්පාදන ජනතාවට අලෙවි කර ගන්නා අතර, ඒ සඳහා ‘විශේෂ වට්ටම්’ද ලබාදෙති. රස කැවිලි ඇතුළු ආහාර නිෂ්පාදකයෝ වැඩි ලාභ සඳහා ඉතාම අපිරිසිදු ලෙස හා තත්වයෙන් බාල ලෙස රසකැවිලි හා ආහාර නිපදවා, තොග පිටින් වෙළඳපොළට මුදාහරිති. ඒ අනුව අලුත් අවුරුදු කෑම මේසය නතුව තිබෙන්නේ, වෙළෙන්දන්ගේ ග්‍රහණයටය. මෙහිදී වෙළඳාමේ හා ආහාර නිෂ්පාදනයේ අවම සදාචාරය රකින අයද ඉඳහිට නැතුවා නොවේ. එහෙත් බහුතරය එසේ නොවේ.

මෙය තවත් බරපතළ වන්නේ, රටේ පාලකයින් මේ පිළිබඳව අන්ධව සිටීමය. උත්සව සමයේ ජනතාවට පහසු මිලකට භාණ්ඩ ලබා ගැනීම සැලැස්වීමට හෝ තත්වයෙන් හොඳ භාණ්ඩ වෙළඳපොළට ඒම සහතික කිරීමට ආණ්ඩුවට කිසිදු සැලැස්මක් හෝ යාන්ත්‍රණයක් හෝ වුවමනාවක් නැත. ඒ නිසා උත්සව සමයේදී ජනතාව විවිධ ජාවාරම්කරුවන්ගේ ගොදුරු බවට පත්වේ. දස අතේ ණය වී තත්වයෙන් බාල හා පරිභරණයට නුසුදුසු ආහාරද රසකැවිලිද ඇඳුම්ද මිලදීගෙන ඉන් පීඩාවට පත්වීමට ජනතාවට සිදුවේ. “අප අවුරුද්ද කනවා නොව අවුරුද්ද අපව කනවා” යයි පැවසීමට ජනතාව පුරුදුවී සිටින්නේ මේ නිසාය.

අනෙක් අතට ධනවාදය පරිසරය විනාශ කර දමා ඇත. අලුත් අවුරුද්ද එන බවට අතීතයේ ගමට දැනුණු සංකේත වූ රතු එරබදු මල් දැන් නැත. ඒ, එරබදු ගස් කපාදමා ඇති නිසාය. ගස් නැති තැන්වල කොවුලන්ද නැත. එහෙත් ඊට ගැටලුවක් නැත. මන්ද රූපවාහිනි නාලිකා හා එෆ්එම් නාලිකා එම අඩුව පිරවීමට සූදානම් නිසාය. දැන් ජනතාව එරබදු මල් දකින්නේත් කොවුල් හඬ අසන්නේත් රූපවාහිනී තිර මගිනි. දැන් අලුත් අවුරුද්ද යනු අතීතයේ තිබූ ස්වාභාවික, වසන්ත උත්සවය නොව වෙළෙන්දන් හා රූපවාහිනී නාලිකා විසින් තිර රචනය කොට නිෂ්පාදනය කොට, ජනතාව මත පටවා ජනතාවගේ තුට්ටු දෙක කඩා ගන්නා දෙයක් බවට පත්ව තිබේ.

මිනිසා සංස්කෘතික සත්වයෙකි. සිරිත්, විරිත්, උත්සව, විනෝදය, සාමූහික ක්‍රියා ආදිය නැතිව ඔහුට පැවතිය නොහැක. එහෙත් ඒ සඳහා මිනිසුන් නිර්මාණය කරගත් ඉතාමත් සුන්දර ස්වභාවික උත්සව ධනවාදය විසින් වාණිජකරණය කරනු ලැබ විනාශ කර තිබේ. උත්සව වැනි මානව ක්‍රියාකරකම් යළිත් ස්වභාවික දේ වන්නට නම්, අලුත් අවුරුදු උළෙල සැබැවින්ම අලුත් අවුරුදු උළෙලක් වීමට නම්, එය ධනවාදයේ ග්‍රහණයෙන් මුදාගත යුතුය. ධනවාදය පවතිද්දී අවුරුදු උත්සවය ඉන් මුදාගත නොහැකි නිසා අප කළ යුත්තේ, ධනවාදය අවසන් කොට මිනිසා ධනවාදී බන්ධනයන්ගෙන් නිදහස් කර ගැනීමට කටයුතු කිරීමය.

# වැඩකරන ජනතාව සූදානම්නම් මේ විෂම චක්‍රය නිමාකරන්න පුළුවන්කම තියෙනවා



ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ සභාපති,
ජ.වි.පෙ. දේශපාලන මණ්ඩල සභික
**ලාල්කාන්ත සහෝදරයා**

***නියමුවා:- ජාත්‍යන්තර වැඩකරන ජනතා දිනය ආසන්න වෙමින් තිබෙන මොහොතක රටේ ඇති වී තිබෙන ව්‍යාකූලත්වය ඔබ විග්‍රහ කරන්නේ කොහොමද?***

*ලාල්කාන්ත සහෝදරයා:-* රටේ තියෙන්නේ බරපතළ ආර්ථික අර්බුදයක්. ලංකාවේ පසුගාමී ධනපති පංතියට බලය ලැබුණේ 1948 පෙබරවාරි 04වැනිදා. ඒ බලය ලැබෙන වෙලාවෙ අපේ ණය බිංදුවයි. නමුත් මේ වෙනකොට ගෙවා ගත නොහැකි ණයකරුවෙක් බවට ලංකාව පත්කරලා තියෙන්නේ. ලබන වසරේ ණය වාරිකය රුපියල් ට්‍රිලියන 03ක් වෙනවා. ජාතික සම්පත් විශාල ප්‍රමාණයක් විදේශ රටවල් වලට විකුණන්නෙ නැතිව ණය ගෙවන්න ඩොලර් නැහැ. ලංකාවට ආයෝජකයෝ ආවේ නැහැ. ඒ නිසා ඩොලර් වැඩිවුණේ නැහැ. දවස ගානේ රුපියල කඩා වැටෙනවා. ජනතා සුභසාධන කප්පාදු කරලා. රාජ්‍ය සේවක විශ්‍රාම වැටුප අහෝසි කරලා. ඒ වගේම හම්බන්තොට වරාය වික්කා. කොළඹ වරාය නැගෙනහිර ජැටිය විකුණන්න තීන්දු කරලා. ත්‍රිකුණාමලයේ තෙල් ටැංකි විකුණන්න ගිවිසුම අත්සන් කිරීම පමණයි දැන් ඉතිරිවෙලා තියෙන්නේ. ඒ විතරක් නෙමෙයි, විදුලිබල මණ්ඩලය කැබලි කර විකිණීම සඳහා මේ වන විට සාකච්ඡා පවත්වමින් තිබෙනවා. එට්කා ගිවිසුම අත්සන් කිරීමට එකඟතාවයට පැමිණ අවසන්.

මේ ඔක්කොම ආර්ථික අර්බුදයේ ප්‍රතිඵල. ආර්ථික අර්බුදයේ අලුත්ම ප්‍රතිඵලය තමයි දේශපාලන අරාජිකත්වය. පසුගිය පළාත් පාලන ඡන්දය එන වෙලාවේ වෙනකොටත් දේශපාලනය අස්ථාවර වෙලා තිබුණේ. දැන් අස්ථාවරභාවය දේශපාලන අරාජිකත්වයක් බවට පත්වෙලා. එතකොට ආර්ථික අර්බුදය තවත් වැඩිවෙලා. එතකොට දේශපාලන අරාජිකත්වයත් තවතවත් වැඩිවෙනවා. දැන් මේ චක්‍රයට රට ගමන් කරලා අවසන්. මෙහෙම තත්වයක් ඇතිවුණාම සමාජ අර්බුද වැඩිවෙනවා. ඒවා පාලනයකින් තොරව ඉදිරියට යනවා. එහි තර්කානුකූල ඊළඟ අවස්ථාව ලෙස ආර්ථික, දේශපාලන, සමාජ, සංස්කෘතික අර්බුද බවට පත්වෙනවා. තවදුරටත් පාලකයන්ට පරණ ක්‍රමයට යන්න බැරි කරනවා. යූඑන්පී ආණ්ඩුවක් හදන කතාව, රනිල් නැති හවුල් ආණ්ඩුවක් හැදීම මෛත්‍රී-මහින්ද එකතුව ආණ්ඩුවක් හැදීම කියන මාතෘකාවලින් ජනතාවට මේක තේරුම් ගන්න පුළුවන්.

වැඩකරන පංතියත්, පීඩිත ජනතාවත්, ප්‍රගතිශීලී බලවේගත් සූදානම් වෙන්න ඕනෑ ජනතාවට වාසිදායක තැනක් නිර්මාණය කරගන්න. ජනතාව සූදානම් නම් ඇති වී තිබෙන තත්වය ජයග්‍රහණ ලබා ගැනීම සඳහා යොදාගන්න පුළුවන්. පක්ෂයේ මඟපෙන්වීමට අනුව කටයුතු කළොත් මේ විෂම චක්‍රය නිමාකරන්න පුළුවන්කම තියෙනවා. අපි ඒ වෙනුවෙන් ජනතාව සූදානම් කරමින් ඉන්නේ. එවැනි සූදානම් කිරීම් සහිත මොහොතක ජාත්‍යන්තර වැඩකරන දිනයත් පංතියේ ජයග්‍රහණ ජනතාවට දිනාදීම සඳහා යොදාගන්නා අපි සූදානම්.

***නියමුවා:- ජාත්‍යන්තර වැඩකරන ජනතා දිනය වෙනුවෙන් ජ.වි.පෙ. සූදානම කෙබඳුද?***

*ලාල්කාන්ත සහෝදරයා:-* ජාත්‍යන්තර වැඩකරන ජනතා දිනය, වැඩකරන පංතිය ඇතුළු පීඩිත ජනතාවගේ වැදගත්ම දිනයක්. එයට සැබෑ අර්ථය දෙන්නේ ජනතා විමුක්ති පෙරමුණ පමණමයි. රටේ ඇතිවී තිබෙන දේශපාලන අර්බුදය නිමා කරලා, ආර්ථික සමාජ සංස්කෘතික අර්බුදයන්ට උත්තරයක් සෙවීම හදිසි කාර්යයක් බවට පත්වෙලා තියෙනවා. මෙවර ජාත්‍යන්තර වැඩකරන ජනතා දිනය ඒ වෙනුවෙන් යොදා ගන්නවා.

පළාත් පාලන ඡන්දයෙන් ලැබුණු ජයග්‍රහණයත් වැඩකරන පංතිය ප්‍රමුඛ පීඩිත ජනතාවගේ බලයත් සංවිධානත්මකව පෙළගස්වන්න ඕනෑ. අපේ පළාත් පාලන මන්ත්‍රීවරු හිටියේ 74යි. දැන් ඉන්නවා 437ක්. මේ මහජන නියෝජිතයින් මගින් විශාල මහජන බලයක් ගොඩනගලා ඔවුන් වැඩකරන ජනතා දිනයට සම්බන්ධ කරවන්න පුළුවන්. ඒ වගේම කුඩා ඡන්ද කොට්ඨාසයකට අපේ අපේක්ෂකයන් ඉන්නවා. ඔවුන්ට පුළුවන් ගමේ බලයක් ගොඩනගන්න. එම බලය ජාත්‍යන්තර වැඩකරන ජනතා දිනයට එකතු කිරීමට අපි සූදානම්. එපමණක් නොවෙයි, පංති බලවේග වෙනදා වගේම වඩා වැඩි ජවයකින් මෙවර ජාත්‍යන්තර වැඩකරන ජනතා දිනයට සූදනම් කරමින් තිබෙන්නේ. කම්කරු, ගොවි, තරුණ, ශිෂ්‍ය කාන්තා වගේම භික්ෂු බලවේගයත් මෙවර ජාත්‍යන්තර වැඩකරන ජනතා දිනයට ඔවුන්ගේ බලවේග සූදානම් කරමින් සිටිනවා.

> “වැඩකරන පංතිය ප්‍රමුඛ පීඩිත ජනතාව එක්විය යුත්තේ ජවිපෙ සමග පමණායි. පවතින දේශපාලන පක්ෂ ඔක්කොම වාගේ කුණුවෙලා ගඳගහද්දී ජනතාවට අලුත් බලාපොරොත්තුවක් ඉතිරි කරලා තියෙන්නේ ජනතා විමුක්ති පෙරමුණ පමණායි. ඒ වගේම සංවිධානාත්මක බවත් විනයත් සහිතව අර්ථයක් ඇතිව මැයි දින පවත්වන්නේ ජනතා විමුක්ති පෙරමුණ පමණායි. ඒ අර්ථයෙන් ගත්තත් වැඩකරන ජනතාව ප්‍රමුඛ පීඩිත පංතිය එක්විය යුත්තේ ජවිපෙ සමග පමණායි.”

***නියමුවා:- වැඩකරන ජනතාවගෙන් සාතිශය බහුතරයක් මැයි දිනය සමරන්නේ ධනපති පක්ෂ සමගයි. එහි ගැටලුවක් තියෙනවා නේද?***

*ලාල්කාන්ත සහෝදරයා:-* මැයි දිනය විතරක් නොවෙයි වැඩකරන පංතියේ අය ගොඩක් දේවල් කරන්නේ ධනපති පංතියේ දේශපාලන පක්ෂ සමග එකතුවෙලා. ඡන්දෙ දෙන්නෙත් එහෙම තමයි. මේක තමයි අපට තියෙන එක අභියෝගයක්. ආකල්පවලින් නීතියෙන් හෝ අධිකරණයෙන් වගේම සුබසාධන වැඩවලින්, අල්ලස් දීමෙන් වරදාන වරප්‍රසාද ප්‍රදානයන්ගෙන් සහ අනාගත බලපොරොත්තුවල වංචනික ලෙස හිරකරමින් වැඩකරන පංතිය ප්‍රමුඛ පීඩිත ජනතාව ධනපති පංතියේ ඔඩොක්කුවේ දාගෙන ඉන්නේ. සිල් රෙද්දෙන් අරක්කු

15 වැනි පිටුවට



**YES WE CAN**

# බක්මහේ නැගි අරුණැල්ල

අප්‍රේල් මාසය අරම්භයත් සමගම එළැඹෙන සිංහල හින්දු අලුත් අවුරුද්ද මුළුමහත් සමාජයම ඒ වෙත නතුකර ගන්නේ කිසිවෙකුට ඉන් මඟහැර සිටිය නොහැකි අයුරිනි. ගම මෙන්ම නගරද වෙනසකින් තොරව  අලුත් අවුරුද්ද හා අත්වැල් බැඳගනුයේ එය තම ජීවිතයේ නැතුව බැරි අංගයක් වී ඇති පරිද්දෙනි. අතීතයේ මෙන්ම වර්තමානයේදීද එදිනෙදා සිදුකරන වැඩකටයුතුවලට විරාමයක්දී නැවුම් ආරම්භයක් ගැනීම අරමුණු කොට ගෙන අපි කවුරුත් පාහේ පැරණි දේ අත හැර අලුත් අවුරුද්දේ අලුත් දේ එක්කර ගනිමු.

එලෙසින්ම මෙයින් වසර 47කට පෙරාතුව අප රටේ පැවති අධිරාජ්‍ය ගැති ධනපති ක්‍රමයත් එකී ක්‍රමයට නායකත්වය දුන් ධනපති පාලකයින් එක්ව පවත්වාගෙන ගිය කෲර පාලනයට එරෙහිව රටේ තරුණයින් පිරිසක් පෙළගැසෙන්නේ බක්මහේ ඉහත කී අරුතින්මය. යල්පැන ගිය පාලනය වෙනස් කොට වඩා සාධාරණ යහපත්වූ සමාජයක් නිර්මාණය කරණු අටියෙන්මය. ඒ අනුව 1971 අප්‍රේල් තරුණ නැගිටීම සිහිපත් කළ හැක්කේ ඒ අයුරින්මය. එවකට පැවති සාම්ප්‍රදායික යල්පැන ගිය සමාජ ක්‍රමය ප්‍රතික්ෂේප කරමින් නව සමාජ ක්‍රමයක් ලාංකේය භූමිය වෙත ඉල්ලා සිටි එකී අරගලය සටහන් වන්නේ සමාජමය අර්ථයෙන් ලාංකේය ඉතිහාසයේ සිදුවූ ප්‍රගතිශීලීම අරගලය ලෙසටය.

71 අරගලය එදවස සාක්ෂාත් කරගැනීමට නොහැකි වූවද ඒ උදෙසා එම පරම්පරාව සිදුකළ කැපකිරීම අති මහත්ය. "දණින් වැටී ජීවත්වනවාට වඩා දෙපයින් සිට මියයාම උතුම්ය" යන්න ඔවුන් නියෝජනය කළ සටන්පාඨ අතර ඉදිරියෙන්ම විය.

එකී තරුණ නැගීටීම තුළින් කියා පෑ යල්පැන ගියාවූ සාම්ප්‍රදායික අධිරාජ්‍ය ගැති ධනවාදී පාලකයිනුත් එකී ක්‍රමයත් සහමුලින්ම ලාංකේය භූමිය තුළ පරාජය කිරීම වර්තමානයටද ඒ අයුරින්ම වලංගු වන්නේය.

එයින් වසර 47 ඉක්ම ගොස් පැවතුණද ඒ මොහොතේ එකී තරුණ පරම්පරාව සටන් වැදුණු වහල්භාවයට, දීනත්වයට තවදුරටත් රට ඇදගෙනයාම විනා ධනවාදී පාලකයන්ට කළ හැකිවූ අන් යමක් අදටද නොමැත.

වර්තමාන යල්පැනගිය ධනවාදී පාලනය විසින් රටට නිර්මාණය දී ඇත්තේ අර්ථික පීඩනය, දරිද්‍රතාවය, මන්දපෝෂණය, විරැකියාව, ජාතිවාදී ගැටුම් යනාදී ගැටලු රැසක් පමණි.

බක්මහේ අරුතින් ගත්කල රටේ පවතින වැරදි සමාජ ආර්ථික ක්‍රමය වෙනස් කිරීම වර්තමාන තරුණ පරපුරේ අනිවාර්ය ලෙසම ඉටුකළ යුතු වගකීමක් බවට පත්ව ඇත. එබැවින් මේ බක්මහේ අපි සියලු දෙනාගේම දැඩි අදිටන විය යුත්තේ එයයි.

තරුණ

# කළු කුහරයන් ආලෝකමත් කළ විඥානවාදයට එරෙහි ප්‍රහාරකයා



නූතන භෞතික විද්‍යාවේ පියා ලෙස සලකන ගැලීලියෝ ගැලීලිගේ මරණයෙන් හරියටම වර්ෂ 300ක් සපිරෙන දිනයේ එනම්, 1942 ජනවාරි 08වැනි දින බ්‍රිතාන්‍යයේ ඔක්ස්ෆර්ඩ් ප්‍රදේශයේ උපත ලබා ඔක්ස්ෆර්ඩ් සරසවියෙන් හා කේම්බ්‍රිජ් සරසවියෙන් උගැනුම ලැබූ ස්ටීවන් හෝකින් පසුගිය මාර්තු 14වැනි දින ලොව පුරා වඩාත් කතාබහට ලක්වූයේ, ඔහු 76 වසරක දිවිගමනට සමුදී ලොව හැරගිය තවත් එක් මිනිසෙකු පමණක් නොවන නිසාය. වයස අවුරුදු 21 අවසන් වෙත්ම චාලක නියුරෝන ක්ෂය වීමේ (ALS) දරුණු රෝගයට ගොදුරුවූ හෝකින් දෙවසරක් තුළ මිය යනු ඇතැයි යන වෛද්‍යවෙරුන්ගේ අනාවැකි මුසාවක් කරමින් ඉනික්බිති වසර 54ක් තුළ ඔහු කළ මෙහෙවර අගයන්නට  මෙම සටහන ප්‍රමාණවත් නොවේ.

A Brief History of Time, Univers in a Nutshell වැනි ග්‍රන්ථ 10ක් පමණ ලියන ලද ලේඛකයෙකුද වන ඔහු දෙවැනි අයින්ස්ටයින් නොහොත් 21වැනි සියවසේ ප්‍රාඥයා ලෙස හැඳින්වීමට දෙවරක් සිතිය යුතු නොවේ. A Brief History of Time ග්‍රන්ථය පමණක් පිටපත් මිලියන 10කට වඩා අලෙවි වී ඇති බව සඳහන් වේ. එම කෘතිය ඊළඟ වාර්තාව තබනු ලැබුවේ චීනයේය. චීන බසින් ලියැවුණු එම ග්‍රන්ථ ඉංග්‍රීසි බසින් ලියැවුණු පිටපත හා සමගාමීව වේගයෙන් පාඨකයන් අතරට ගියේය. චීන පාඨකයා හෝකින් වැළඳ ගත්තේය. හෝකින් වඩාත්ම ප්‍රියකළ රට, සංස්කෘතිය චීනය බව ඔහු විටෙක පවසා තිබේ. ඔහු වරක් චීනය පිළිබඳව මෙසේ කියයි. "චීන මිනිසුන් කාර්ය ශූරයි, කාන්තාවන් ඉතාම ලස්සනයි. දරුවන් ඉගෙනීමට අති දක්ෂයි. තරුණයින්ගේ අනාගතය සුභයි. ලෝකය වෙනස් කිරීමට චීන තරුණයින්ට හැකියි." යනුවෙනි.

ඉතාම සුවිශේෂී කාරණය වන්නේ, හෝකින් සතුවූ විශේෂ ගති ලක්ෂණයි. ඔහු වීර්යය, අප්‍රතිහත ධෛර්ය මෙන්ම ලොවට ආදරය සහිත පූර්ණ මිනිසෙකු විය. ඔහු වසර දෙකක් තුළ මියයන බව දැනගත් වහාම ඔහු විසින් තීරණය කරනු ලැබුවේ එම වසර දෙක තුළ තම ආචාර්ය උපාධිය සම්පූර්ණ කිරීමටය. 1985 දී දරුණු ලෙස නියුමෝනියා රෝගය වැළඳී ස්වසන ආබාධයක් වූයෙන් ස්වාසනාලයට කෘත්‍රිම බටයක් සවි කරනු ලැබීමෙන් කථන හැකියාවද අහිමි විය. එහිදීද ඔහු දැඩි සත්කාර ඒකකයේ සිටින විට වෛද්‍යවරුන් විසින් ඔහු බේරාගත නොහැකි බව පවසා තිබේ. බිරිඳගේ බලපෑමෙන් ඔහු නැවත පණ ලැබීය. ටික කලෙකින් බිරිඳ හෝකින් හැර ගියාය. හෝකින්ගේ දෙවන බිරිඳ වූයේ ඔහුගේ උපස්ථායිකාව වූ දෙදරු මවකි. ඇයද වසර 11කට පසු හෝකින්ට විවිධ චෝදනා එල්ලකොට ඔහු හැර ගියාය. ඒ කිසිදු පුද්ගලික ගැටලුවක් හෝකින් තම පර්යේෂණ, සොයාගැනීම්, පොත් ලිවීම්, හා සොබාදහම අධ්‍යයනය කිරීම් කිසිවකට බාධාවක් කර නොගත්තේය. ඒ කිසිම ගැටලුවකදී හෝකින් ලොවට දායාද කළ දේ අහිමිවීමට ඉඩකඩ තැබුවේ නැත. Theory of Everyting චිත්‍රපටයේ එඩී රෙඩ්මෙනි, හෝකින්ගේ චරිතයේ එවැනි ගුණාංග ලොවට කියා පෑවේ එබැවිනි. හෝකින්ගේ කැපකිරීම, පරිත්‍යාගයන් පෘථිවිවාසීන්ට විශ්වයේ ඇති ඥාතීත්වය කෙබඳුදැයි කියා පෑවේය.

කළු කුහර තුළින් නිකුත් වන විකිරණ, අවකාශය හා කාලය පිළිබඳ දැවැන්ත විද්‍යාත්මක පර්යේෂණ සඳහා මියෙන තුරුම තම කාලය වැය කළා පමණක් නොව තම උගත් සියලු දේ තම පරපුරේ දැනුමට එකතු කිරීමට දෙවරක් නොසිතා කටයුතු කළ පරාර්ථකාමියෙකි. නැවත ඉපදීම පිළිබඳව වූ විඥානවාදයේ හරයට එරෙහිව දැවැන්ත ප්‍රහාර එල්ල කළ දාර්ශනිකයෙකි.

1879 මාර්තු 14 දින ඇල්බට් අයින්ස්ටයින්ගේ උපන් දිනය විය. ඊට වසර 139ක් සපිරෙන 2018 මර්තු 14 දින දෙවන අයින්ස්ටයින් නොහොත් 21 වන සියවසේ මහා ප්‍රාඥයා මෙලොවින් සමුගත්තේ අයින්ස්ටයින්ගේ ආයුකාලය වූ වසර 76කට කාලය සිය ජීවිතය ගෙවා අවසන් කිරීමෙනි. ගැලීලියෝ ගැලීලිගේ අනුස්මරණයත්, 20වැනි සියවසේ ප්‍රාඥයා වූ අයින්ස්ටයින්ගේ ජන්ම දිනයත් සමග හෝකින් මුළු ලොව පුරා ආලෝකය විහිදුවා අවිද්‍යාවේ අඳුර දුරලීමට ගත් පරිශ්‍රමය යථාර්ථයක් කළ යුතුය.

ඔහු චීනයේ සුප්‍රකට ගායන ශිල්පියෙකු වූ වැංග් ජුනිකායිගේ රසිකයෙකුද විය. වෑංග් ජුන්කායි තම සමාජ ජාල අඩවි ගිණුමේ මෙසේ සඳහන් කොට තිබුණි.

"ඔබ සදහටම මේ විශ්වයට සහ තාරකාවලට අයිතියි. ඔබේ ඉගැන්වීම් මගේ හදවතේ තැන්පත්ව තිබෙනු ඇත."

මුදල්, එහි ඇති සුවිශේෂී හුවමාරු හැකියාව නිසා විශ්වීය ගුණයක් ගනී. එහෙත් එය ජීවිතය සහ ජීවිතයේ අරුත අතර අතරමැදියෙක් වීම ඛේදවාචකයකි.

කාල් මාක්ස්



ජීවිතේ එක් දොරක්
වැසුණොත් තවත්
දොරක් කොහේ හෝ
අප වෙනුවෙන් විවෘත
වෙනු ඇති නමුත්
වැසුණු දොර ගැන
සිතා පසුතැවුනහොත්
විවෘත වූ දොරද අපට
මගහැරී යනු ඇති

තෝමස් අල්වා එඩිසන්



# ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදය හා විධායක ජනාධිපති ක්‍රමය

ලොව පැවතිය හැකි හොඳම ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමය නිර්ධන පංති ප්‍රජාතන්ත්‍රවාදය වේ. ඒ " බහුතරයේ කැමැත්ත" සැබැවින්ම ක්‍රියාවට නැගෙන්නේ ඒ තුළ නිසාය. එහෙත් නිර්ධන පංති ප්‍රජාතන්ත්‍රවාදය බිහිවෙන තුරු, ධනේශ්වර ඒකාධිපතිවාදයට වඩා ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදය හොඳ බව වමේ අර්ථයෙන් ගත් විට පවා පිළිගත යුතුය. ධනවාදය තුළ ක්‍රියාත්මක වන වමේ හා ප්‍රගතිශීලි බලවේග ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් නිතර හඬ නගන්නේ ඒ නිසාය. එය ලංකාවටද අදාළය.

ලංකාවේ 1978 සිට පවතින විධායක ජනාධිපති ක්‍රමය ලොව කිසිදු රටක නැති අන්දමේ, ප්‍රජාතන්ත්‍රවාදය හකුළා දමන්නකි. 19වැනි සංශෝධනය විසින් ඇති කළ කුඩා සීමාකම් නිසාත්, වත්මන් ජනාධිපතිවරයාට පාර්ලිමේන්තුවේ ආණ්ඩුබලය තනිවම ලැබී නොමැති නිසාත් විධායක බලය ක්‍රියාත්මක වීමේ අඩුවක් වත්මන් පාලනය තුළ පැවතියද ආණ්ඩු බලය සහිත තත්වයකදී ලංකාවේ ජනාධිපති යනු ඒකාධිපතියෙක්ම වේ. ලංකාවේ විධායක ජනාධිපති අධිකරණයට පවා වග නොකියන බලයක් හොබවන කෙනෙකි. එය ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදයේම මූලධර්මය වූ බලය "සංවරණය හා තුලනය" විය යුතුය යන සංකල්පය බිඳ දමා ඇත. ලංකාවේ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කළ යුතු වන්නේ ඒ නිසාය. ලංකාවේ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමට එය බිහිවූදා සිටම ජ.වි.පෙ. හඬ නගමින් උත්සාහ කළද චන්ද්‍රිකා කුමාරතුංගගේ සිට සියලු ජනාධිපතිවරුන් එය අහෝසි කරන බවට පොරොන්දු දුන්නද තවමත් විධායක ජනාධිපති ක්‍රමය අහෝසි නොවී පවතී.

ලංකාව මේ වනවිට ධනවාදය තුළ ඉතාම බරපතළ සමාජ, ආර්ථික, දේශපාලන හා සංස්කෘතික අර්බුදයකට මුහුණදී සිටී. රට මුහුණදී තිබෙන සියලු අර්බුදවල මූලය ආර්ථික අර්බුදය වේ. රට තුළ කලක් තිස්සේ නිෂ්පාදන මාර්ග බිහි නොකිරීම, පැවති නිෂ්පාදන මාර්ග බිඳවැටීම හා ඵලදායී නොවීම, රටට ණය මත පැවැතීමට සිදුවීම, ලංකාවේ පාලනයකින්, මූල්‍ය විනයකින් තොරව ණය ගැනීම නිසා ණය උගුලක රට හසුව තිබීම, විදේශ වත්කම් පහළ වැටීම, රුපියල බාල්දුවීම ආදිය මගින් මේ අර්බුදය නිර්මාණය වී තිබේ. කොල්ලකාරී විවෘත ආර්ථිකය තුළම තවදුරටත් ගමන් කිරීමට පාලකයන් දරන උත්සාහයත් රට තුළ මහා පරිමාණයෙන් සිදුවන වංචා හා දූෂණත් මේ අර්බුදය තීව්‍ර කිරීමට හේතුවී තිබේ.



එලෙස රට ආර්ථික වශයෙන් අර්බුදයට ගොස් තිබෙන තත්වයක් තුළ ධනපති දේශපාලනයද පවතින්නේ, ඉතිහාසයේ මෙතෙක් නොවූ තරමේ අර්බුදයකය. එක් අතකින් ධනපති පක්ෂ එකකටවත් තනි ආණ්ඩුවක් පිහිටුවීමට ජනතා කැමැත්ත ලැබී නැති නිසා දැන් පවතින්නේ හවුල් ආණ්ඩුවකි. එය ඉතාම අරාජික වුවත් වී තිබෙන අතර රටේ පාලනයද අරාජික වී ඇත. ධනපති පංතියේ ප්‍රබලම පක්ෂය වූ එ.ජා.ප.ය රනිල්ගේ නායකත්වය තුළ බරපතළ පිරිහීමකට ලක්ව කඩාවැටී තිබේ. එ.ජා.ප.ය ප්‍රබල නායකත්වයක් නැති පක්ෂයක් බවට පත්ව ඇත. රනිල් විරෝධයක් (ආණ්ඩු බලය පවතිද්දීමත්) පක්ෂය තුළ වර්ධනය වී තිබේ.

එසේම මහින්ද රාජපක්ෂ කණ්ඩායමට වැඩි බලය තිබුණත් ශ්‍රීල.නි.ප.යද දෙකඩ වී බෙදී ඇත. රාජපක්ෂ කණ්ඩායමද තවම තනිව ආණ්ඩුවක් පිහිටුවීමට තරම් ශක්තිමත් තත්වයක නැත. පසුගිය පළාත් පාලන ඡන්ද ප්‍රමාණය අනුව බලන විට රාජපක්ෂ කණ්ඩායමට පාර්ලිමේන්තුවේ ලබා ගත හැක්කේ මන්ත්‍රී ධුර 100 පමණ ප්‍රමාණයකි. මේ අතර අගමැතිවරයාට එරෙහිව විශ්වාසභංග යෝජනාවක්ද ඉදිරිපත්ව තිබේ. ධනවාදී දේශපාලනය එකම අර්බුදයක් බවට පත්ව තිබේ.

ධනවාදය මෙලෙස අර්බුදයට පත්ව, ධනපති පක්ෂ දුර්වල වී කිසියම් අරාජිකත්වයක් නිර්මාණය වන විට එය දරාගැනීමට සමාජයට නොහැක. ධනවාදී අර්බුදයෙන් පීඩාවට පත්වන ජනතාව තම පීඩාව කුමන හෝ ආකාරයකින් මුදා හැරීමට උත්සාහ දරති. මේ තත්වය උපයෝගී කර ගැනීමට තරම් වමේ සහ ප්‍රගතිශීලී ව්‍යාපාර ශක්තිමත් නොමැති නම් එම පීඩනය අන්තවාදී ජාතිවාදී ආගම්වාදී අන්තයන් කරා තල්ලුවීම සිදුවේ. අර්බුදයට පත් ධනපති පක්ෂ තම ගැලවීම හා බලය සඳහා මෙම තත්වය උපයෝගී කර ගනී. දැන් අපේ රටේ අප දකින ජාතිවාදී හා ආගමික අන්තවාදයේ හිස එසවීම හා ප්‍රචණ්ඩ හැසිරීම පිටුපස රාජපක්ෂ කල්ලිය සිටීමෙන් මෙය පැහැදිලි වේ.

රටක සමාජ ආර්ථික අර්බුද උග්‍රවී මිනිසුන් පීඩාවට පත්වන විටත් ඒ සමගම ධනවාදී පාලනයේ දුර්වලතාව අරාජිකත්වයක් නිර්මාණය කරන විටත් සමාජය තුළින් දැඩි පාලනයක් ඉල්ලා සිටීමේ ප්‍රවණතාවයක් මතුවේ. දැන් ලංකාවේද මේ තත්වය වර්ධනය වෙමින් තිබේ. "දුර්වල පාලනයක්" වෙනුවට "ප්‍රබල පාලනයක" වුවමනාව සමාජය තුළ මතුවේ. මෙහිදී සම්ප්‍රදායික ධනපති පක්ෂ අර්බුදයට ගොස් අසමත්ව සිටින විට මෙම දැඩි පාලනයක අවශ්‍යතාවය පිරවීමට ඉදිරියට එන්නේ ජාතිවාදී හා අන්තවාදී බලවේග පෙරටුකොට ගත් ධනපති පංතියේ හා සුළු ධනපති පංතියේ පාදඩ ලක්ෂණ සහිත කණ්ඩායමකි. එය ඉතාම අනතුරුදායක තත්වයකි. මේ දිනවල රාජපක්ෂ කල්ලියේ සමහරු ගෝඨාභය මීළඟ ජනාධිපති කිරීමට ඉදිරිපත් කරන්නේ, මෙම දේශපාලන තත්වයට අනුවය. එවිට ජාතිවාදී, අන්තවාදී පිරිස් පෙරටුකර ගත් ධනේශ්වර සම්ප්‍රදායික පාලනයට වෙනස් පාදඩ පන්නයේ ඒකාධිපති පාලනයක් බිහිවේ. ඉතාලියේ ෆැසිස්ට් පාලනය බිහිවූයේද මීට සමාන වටපිටාවක් තුළය. ඉතාලියේ 1920 හා 1930 දශකවල ඉතාලිය පිරිහීමට ලක්ව ධනපති පාලනය දුර්වල වීමත් වමේ ව්‍යාපාරය පැතිරී ගොස් එහෙත් බලය ලබා ගැනීමට තරම් ශක්තිමත් තැනක නොසිටීමත් යන තත්වය තුළ පාදඩ සමාජ ස්ථරයන් හා ජාතිවාදී කොටස් මගින් ෆැසිස්ට්වාදය බිහිවූ බව දේශපාලන විචාරකයෝ පවසති. ලංකාවේ ෆැසිස්ට් පාලනයක් බිහිවීමට ඉඩක් නැති වුවද එම පන්නයේ ඒකාධිපති පාලනයකට අවශ්‍ය පසුබිම වර්තමාන ධනවාදී අර්බුදය හා අරාජිකත්වය විසින් නිර්මාණය කර තිබේ. රාජපක්ෂවරු බලයට ඒමට උත්සාහ කරන්නේ එම තත්වය උපයෝගී කර ගෙනය.

ලංකාවේ පවතින ධනේශ්වර දේශපාලනයේ අර්බුදය හා දුබලකම හා අරාජිකත්වය ඒකාධිපති පාලනයකට අවශ්‍ය සමාජ වටපිටාව නිර්මාණය කරනවා සේම, ඒකාධිපති ක්‍රමයක් බිහිවීම වැළක්වීම සඳහා අවශ්‍ය තත්වයන්ද බිහිකර තිබේ. ඒ වත්මන් ධනපති ආණ්ඩුව දුර්වල හා තනි බලයක් නැති පාලනයක් වන නිසාත් ආණ්ඩුවේ දුබල නායකයින්ට ජනාධිපතිවරණයකින් ජයගත නොහැකි බව තහවුරුවී ඇති නිසාත්ය. එනම් ලංකාවේ ඊළඟ ජනාධිපති වරණයෙන් රාජපක්ෂ කල්ලිය අපේක්ෂකයෙක් බලයට ගෙන ඒමට ඉඩ තිබෙනවා මෙන්ම ඒ වෙනුවට විධායක ජනාධිපති ක්‍රමය අහෝසිකිරීමේ ඉඩද මතුව තිබේ. ධනවාදයේ අර්බුදය එක් අතකින් ප්‍රජාතන්ත්‍රවාදය සීමාකරන ඒකාධිපතියෙක් සඳහා පසුබිම නිර්මාණය කරන්නාක් මෙන්ම අනෙක් අතට එවැන්නක් බිහිවීම වැළක්වීම සඳහා වන දේශපාලන බල තුලනයක්ද නිර්මාණය කර තිබේ. ලංකාවේ දැන් පවතින තත්වයේ විශේෂය එයයි.

මෙහිදී ජනතාවගේ පැත්තෙන් බැලුවත්, වමේ හා ප්‍රගතිශීලී බලවේගයන්ගේ පැත්තෙන් බැලුවත්, ප්‍රජාතන්ත්‍රවාදයේ පැත්තෙන් බැලුවත්, රටට යහපත් වන්නේ ඒකාධිපතියෙක් නිර්මාණය කර ගැනීම නොව එවැන්නෙක් නිර්මාණය වීමට තිබෙන ඉඩ අහෝසි කර දැමීම හා ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කර ගැනීමය. ආණ්ඩුකරන පක්ෂ දෙකම දුර්වලව පැවතීමත් ඔවුනට මීළඟ ජනාධිපතිවරණයකින් ජය ගැනීමට නොහැකි බව තහවුරුව තිබීමත් මහින්ද රාජපක්ෂට නෛතිකව ඊළඟ ජනාධිපතිවරණයට ඉදිරිපත්වීමට නොහැකිවීමත් යන සාධක නිසා මේ මොහොතේ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමේ යෝජනාවක් සම්මත කරගැනීමේ ඉඩක් පාර්ලිමේන්තුව තුළ විවර වී තිබේ. එහෙත් එවැනි උත්සාහයකට **15 වැනි පිටුවට**

> මේ මොහොතේ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමේ යෝජනාවක් සම්මත කරගැනීමේ ඉඩක් පාර්ලිමේන්තුව තුළ විවර වී තිබේ. එහෙත් එවැනි උත්සාහයකට බාධාවන් නැතුවාම නොවේ. ඊළඟ ජනාධිපතිවරයාට උදව්කර ඔහු යටතේ බලය හා වරප්‍රසාද භුක්තිවිඳීමට හීන මවන අන්ත ජාතිවාදී හා පාදඩ කණ්ඩායම්වල ප්‍රධානීන් මීට බාධාකිරීමට ඉඩ තිබේ. එහෙත් එකී බාධා මැද වුවද විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරගැනීම සඳහා දැන් පවතින ඉඩ යොදාගැනීම මඟහැර යා නොහැකි කාර්යයක්ව තිබේ. ඒ, මෙම දේශපාලන බල තුලනය දිගුකල් පවතින්නේ නැති නිසාය.



"ධනපති ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවය හා සමාජවාදී විප්ලවය අතර වෙනස තරයේ ගෙනහැර දැක්වූයේ බොල්ෂෙවික්වරුන්ය. එයින් මුලින් සඳහන් විප්ලවය කෙළවර දක්වා ගෙන යාමෙන් ඔවුහු සමාජවාදී විප්ලවයට පරිවර්තනය වීම සඳහා දොර විවෘත කළහ. විප්ලවවාදී සහ මාක්ස්වාදී වූ එකම ප්‍රතිපත්තිය එය විය."

**ලෙනින්**
**තෝරාගත් කෘති**
**9වැනි වෙළුම,**
**102 පිටුව**

# ජාතිවාදය එපා

**"ජාතිවාදය අති සාධාරණ, අති පිරිසිදු, අතිශෝධිත සත්‍ය නාමකරණයක් යටතේ පැමිණියද මාක්ස්වාදයට ඒ සමග කිසිසේත්ම සමාදාන විය නොහැක." - වී. අයි. ලෙනින්**

පසුගිය මාර්තු මස මුල් සතියේ මහනුවර දිගන සහ තෙල්දෙණිය යන ප්‍රදේශවල ඇතිවූ ජාතිවාදී කලබැගෑනිය පුදුම විය යුතු කරුණක් නොවේ. වියළි කොළ රොඩු ගොඩකට භූමි තෙල් ඉස ගිනිකූරක් ගැසූ විට එය වඩාත් හොඳින් ඇවිලේ. එසේ නොඇවිලේ නම් ගැටලුවකි. පසුගියදා මහනුවර ඇති වූ සිද්ධි දාමයත් එසේ විග්‍රහ කර ගත හැක. ජ.වි.පෙ. ප්‍රමුඛ ඇතැම් වාමාංශික දේශපාලන පක්ෂ සහ ප්‍රගතිශීලී සංවිධාන හැරෙන්නට එ.ජා.ප.ය, ශ්‍රීල.නි.ප.ය, මහින්ද කණ්ඩායම මෙන්ම ජාතිවාදී පදනමින්ම පිහිටවා ගත් සිංහල, දෙමළ සහ මුස්ලිම් දේශපාලන පක්ෂද තම ඡන්ද ගොඩ වැඩි කර ගැනීම සඳහා අඛණ්ඩව සිදු කරනු ලැබුවේ මේ ජාතිවාදී බීජ වැපිරවීමය.

මේ ඇවිලුණු ජාතිවාදී ගැටුම් කඩිනමින් සමතකයට පත් කිරීමටත් ඉදිරියේදී මෙවන් තත්වයක් ඇති වීම වළක්වා ගැනීමත් අරමුණු කරගනිමින් ජ.වි.පෙ. වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කර තිබේ.

එහි එක් ක්‍රියාමාර්ගයක් ලෙස පසුගිය මාර්තු 09 වෙනිදා කොළඹ විහාර මහා දේවී උද්‍යානය ඉදිරිපිටදී දිගන ප්‍රදේශයේ ඇති වූ සිංහල- මුස්ලිම් ජාතිවාදී ගැටුම්වලට විරෝධය




පළකිරීමටත්, එම සිද්ධීන්ට සම්බන්ධ වූවන්ට එරෙහිව වහා නීතිය ක්‍රියාත්මක කරන ලෙස ආණ්ඩුවට බල කිරීමටත් ජ.වි.පෙ. මූලිකත්වයෙන් සත්‍යග්‍රහ ව්‍යාපාරයක් පවත්වන ලදී. මේ අවස්ථාව සඳහා සිවිල් සංවිධාන ක්‍රියාකාරීන්, කලාකරුවන්, විශ්වවිද්‍යාල ආචාර්යවරුන්, භික්ෂූන් වහන්සේලා මෙන්ම මුස්ලිම් සංවිධානවල නියෝජිතයින්ද සහභාගී වී තිබුණි.

# පළාත් පාලන මන්ත්‍රී හමුව



පසුගිය පළාත් පාලන මැතිවරයේ තරග කළ අපේක්ෂක අපේක්ෂිකාවන් සඳහා ආචාර ධර්ම පද්ධතියක් ඉදිරිපත් කරන ලද්දේ ජ.වි.පෙ. පමණි. 2017 දෙසැම්බර 17වැනිදා කොළඹ සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගණයේදී පැවති සමුළුවකදී සියලුම පළාත් පාලන අපේක්ෂකයෝ එයට එකඟ බවට ප්‍රතිඥා ලබා දුන්හ.

ජ.වි.පෙ. පැවසූ ආකාරයටම පළාත් පාලන මැතිවරණයෙන් පසුව ආණ්ඩුව පවත්වාගෙන යාමට නොහැකි මට්ටමේ අර්බුදයකට පත්ව තිබේ. එසේම මෛත්‍රී, රනිල් සහ මහින්ද යන කණ්ඩායම් පළාත් පාලන ආයතනවල බලය තහවුරු කර ගැනීම සඳහා මන්ත්‍රීවරුන් මිලදී ගැනීම් කර ගැනීම පිළිබඳව නිල හා නොනිල ආකාරයකට සාකච්ඡාවල නිරත වන තත්වයක් තුළ ජ.වි.පෙ. පසුගිය මාර්තු 03වැනිදා පළාත් පාලන නියෝජිතයින් ලෙස පත්වූවන් සඳහා ඡන්දයට පෙර එකඟ වූ ආචාර ධර්ම පද්ධතියද නැවත සිහි ගන්වමින් සැබෑ පළාත් පාලන නියෝජිතයින් ලෙස කටයුතු කරන ආකාරය පිළිබඳව විශේෂ වැඩමුළුවක් කොළඹ ක්‍රීඩා අමාත්‍යංශ ශ්‍රවණාගාරයේදී පැවත්වන ලදී.

මෙම අවස්ථාව සඳහා ජ.වි.පෙ. නියෝජනය කරමින් අනුර දිසානායක, ටිල්වින් සිල්වා, සුනිල් හඳුන්නෙත්ති ,බිමල් රත්නායක, යන සහෝදරවරුන්ද මීට අමතරව සාහිත්‍යවේදී කමල් පෙරේරා, හිටපු අමාත්‍යංශ ලේකම් ඒ.පී.ඒ. ගුණසේකර යන මහත්වරුන් ඇතුළුව ජ.වි.පෙ. පළාත් පාලන නියෝජිතයෝ සියලු දෙනාම සහභාගි වී සිටියහ.

# කාන්තා දින සැමරුම: 'අදේශපාලනය හමුවේ ඇයගේ දේශපාලනය'

අප වැනි පසුගාමී ධනේශ්වර සංවර්ධනයක් තිබෙන රටක ජනතාවගේ ආකල්පද පසුගාමීය. එවැනි සමාජයක කාන්තාවගේ තත්වයද එයටද එහා ගොස් ඇත. ඔවුහු තමන්ට හිමි දෙවෙනි තැනය යන සංකල්පය තුළ ජීවිතය හැඩ ගස්සවා ගෙන සිටිති.

එසේම මෙරට පාලක පංතියද කාන්තාව ඒ තත්වය තුළ තබා තම පටු දේශපාලන වුවමනා ඉටු කර ගැනීමට දිගින් දිගටම කටයුතු කරන ලදී. මෙවන් සංදර්භයක් තුළ කාන්තාවන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනීසිටීමට නොයෙක් සිවිල් සංවිධාන බිහිවී ඇත. ඒ අතුරින් බොහෝ සංවිධාන කාන්තාවන් පීඩාවට පත්වන මූලික කාරණාව මඟ හැර එක්කෝ පිරිමියාට එරෙහිව නැතහොත් වෙනත් කාරණයකට එරෙහිව ඔවුන් පෙළගස්වනු ලබයි.

එහෙත් එම සංවිධාන අතුරින් කාන්තාවන්ගේ සැබෑ ප්‍රශ්න නියෝජනය කරන සංවිධානයක් ලෙස අයිතීන් උදෙසා කාන්තාවෝ සංවිධානය ඉදිරියට පැමිණ තිබේ. එම සංවිධානය විසින් ජාත්‍යන්තර කාන්තා දිනය සමරුනු වස් මාර්තු 08 වැනිදා කොළඹ මහජන පුස්තකාල ශ්‍රවණාගාරයේදී "අදේශපාලනය හමුවේ ඇගේ දේශපාලනය" යන මැයෙන් සම්මන්ත්‍රණයක් පවත් වන ලදී. මෙහි ආරාධිත දේශනය පවත්වන ලද්දේ, ජ.වි.පෙ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා




විසිනි.

අනෙකුත් දේශන ශ්‍රී ලංකා කියුබානු තානාපතිනි ජුආනා එලේනා රැද්‍රිගු, අයිතීන් උදෙසා කාන්තාවෝ සම සභාපතිනියන් වන සමන්මලී ගුණසිංහ, සරෝජා සාවිත්‍රි පෝල් රාජ් පැවත්වූ අතර ප්‍රවීණ රංගන ශිල්පිනී දීපානි සිල්වා මහත්මිය ඇතුළු විශාල පිරිසක් මේ අවස්ථාවට සහභාගී වී සිටියහ.

# "අපි මිනිස්සු"




පසුගිය මස අම්පාර සහ මහනුවර දිගන යන ප්‍රදේශවල ජාතිවාදී පදනමින් ඇතිවූ ගැටුම්කාරී තත්වය පිළිබඳව රටේ පොදු ජනතාව තුළ ඇත්තේ එතරම් ප්‍රසාදයක් නොවේ. එහෙත් සෑම ජාතිකත්වයක් තුළ සිටින අන්තවාදී කල්ලි, කණ්ඩායම් එම පොදු මතය යට කර තම ජාතිවාදී, ආගම්වාදී මත ජනතාවට පොම්ප කිරීම සඳහා සංවිධානාත්මක වැඩ පිළිවෙලක් දියත් කර තිබේ.

එබැවින් ඔවුන්ගේ සංවිධානාත්මක ජාතිවාදී මත පරාජයක කිරීම සඳහා එයට වඩා ප්‍රබල සංවිධානාත්මක ව්‍යාපාරයක් වුවමනා කර ඇත. එය දවසේ ප්‍රබල අභියෝගයක් වී ඇති බැවින් මේ සඳහා දේශපාලන පක්ෂ, සිවිල් සංවිධාන සහ උගතුන් බුද්ධිමතුන් පෙරට ආ යුතු තත්වයක් මතුව තිබේ.

මෙකී රික්තය පිරවීම සඳහා ඇරඹුම සංවිධානය විසින් "අපි මිනිස්සු" නමින් ජාතික සමගි කථිකාවතක් දිවයිනේ ප්‍රධාන නගර ඉලක්ක කර ගනිමින් පැවැත්වීමට කටයුතු යොදා තිබේ. මෙහි පළමු කථිකාවත කොළඹ මහජන පුස්තකාල ශ්‍රවණාගාරයේදී පසුගිය මාර්තු 22 වෙනිදා පැවැත්වුණි.

ජාතික භික්ෂු පෙරමුණ, ශ්‍රී ලංකා මුස්ලිම් කවුන්සිලය, ජනතා විමුක්ති පෙරමුණ , මානවාදී කලාකරුවෝ, අලුත් පරපුර, ජනතා මෙහෙවර උදෙසා රාජ්‍ය සේවකයෝ, සමාජ සමානාත්මතාව උදෙසා විශ්වවිද්‍යාල ආචාර්යවරු යන සංවිධානවල නියෝජිතයෝ මේ අවස්ථාවවේ මුලසුන ගෙන සිටියහ.

ජ.වි.පෙ. නායක අනුර දිසානායක, මහාචාර්ය එස්.ජේ. යෝගරාජා, කථිකාචාර්ය හරිනි අමරසූරිය, ශ්‍රී ලංකා මුස්ලිම් කවුන්සිලයේ කැඳවුම්කරු මවුලවි මුනීර් මුලප්පන්තුමා, අලුත් පරපුර සංවිධානයේ සමනලී ෆොන්සේකා, උතුරු නැගෙනහිර හිටපු පළාත් ආණ්ඩුකර ලයනල් ප්‍රනාන්දු, ධර්ම පර්යේෂණ මධ්‍යස්ථානාධිපති ශාස්ත්‍රපති හැගොඩ විපස්සි හිමියෝ මෙහිදී දේශන පැවැත්වූහ.

# රටේ ආර්ථිකයේ පැවැත්ම අහෝසි කරන

# මූල්‍ය අරමුදලේ අණපනත් කරළියට

ලංකාවේ ආර්ථිකය හැසිරවීමේ ස්වාධීන බලයක් ජනතාව විසින් පත් කරගනු ලබන පාර්ලිමේන්තුවට හෝ කැබිනට් මණ්ඩලයට ඇතැයි කවුරුන් හෝ කියන්නේ නම් එය බරපතළ ප්‍රබන්ධයකි. ආර්ථිකයේ තීන්දු තීරණ අණපනත් ලෙස පාර්ලිමේන්තුව මගින් සම්මත කළද, ඒවා සඳහා මූලික යෝජනා ඉදිරිපත් කරන්නේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව, ලෝක වෙළඳ සංවිධානය හා එවැනි ජාත්‍යන්තර අධිරාජ්‍යවාදී ප්‍රාග්ධනය හසුරුවනු ලබන ආයතන විසිනි. විටෙක මිත්‍රශීලී ලෙසත් තවත් අවස්ථාවක තර්ජනාත්මකවත් අවසානයේ කෙසේ හෝ ඔවුන් තමන්ගේ ප්‍රාග්ධනයට නිදහසේ අප වැනි රටවල් සූරාකෑම පහසු කරන යෝජනා ජනතාව "නිල වශයෙන්" පත් කරගන්නා 'මහජන' නියෝජිතයින් ලවා පාර්ලිමේන්තුව මගින් ක්‍රියාවට නංවනු ලබයි.

අධිරාජ්‍යවාදී අතපෙවීම්වල මුළු මහත් ඉතිහාසය මෙබඳුය. රටක් ආර්ථික වශයෙන් ඉබාගාතේ යාම, අර්බුදයට පත්වීම තම යෝජනා ක්‍රියාවට නගා ගැනීමට මූල්‍ය අරමුදල වැනි ජාත්‍යන්තර බූවල්ලන් හට පහසු කරවයි. ලංකාවද මේ වන විට පත්ව සිටින්නේ, එවැනි ආර්ථික අර්බුද අදියරකටය. විවෘත ආර්ථිකයේ දෙවැනි ඉනිම ලෙස ඇතැමුන් අර්ථ දැක්වූ ධනවාදී ආර්ථික ප්‍රතිසංස්කරණයන්ගේ තීරණාත්මක යෝජනා රැසක් මේ වන විට වේගයෙන් ක්‍රියාවට නගමින් තිබේ.

විශ්වාසභංග, ජාතිවාදී කෝලාහල, පාතාල නායකයන් අතර ගැටුම් වැනි මාධ්‍ය මඟින් වේගයෙන් ජනතා ආකර්ෂණය දිනා ගත හැකි මාතෘකා වැඩිපුර සාකච්ඡාවට ලක් කෙරුණද, එම එදිනෙදා මාතෘකාවලින් යටපත් කළ නොහැකි දැවැන්ත ආර්ථික අර්බුදයක් සමාජය වෙලා ගනිමින් පවතී. වරින්වර දේශපාලන අර්බුද ලෙස නොනිමී ඇවිලෙන්නේ එම ආර්ථික අර්බුදයේම ප්‍රකාශනයන්ය.

### ආර්ථික අර්බුදයේ ස්වභාවය

අප ගත කරන්නේ 2018 වර්ෂයේ පළමු කාර්තුව අවසානයේය. වසර දෙක ලෙස 2017 සහ 2018 ආර්ථිකයේ මුහුණුවර මූලික දර්ශක කිහිපයකින් සැසඳීමෙන් අප හට මේ අර්බුදයේ ගැඹුර පිළිබඳව දළ වැටහීමක් ලබාගත හැකිය.

| දර්ශකය | 2016 | 2017 |
|---|---|---|
| ආර්ථික වර්ධන වේගය | 4.8 | 3.3 |
| උද්ධමනය | 4% | 7.3% |
| ණය මුළු බිලියන | 9387 | 10,163 |
| ණයවල වෙනස | 776 - බිලියන | |
| ඍජු විදේශ ආයෝජන ලැබීම් (ඩොලර් මිලියන) | 898 | 397 |

2016 වසරේදී 4.8%ක්ව පැවැති අර්ථික වර්ධනයේ වේගය 2017 දී 3.3%ක් දක්වා කඩා වැටුණි. නමුත් ආණ්ඩුව 2017දී 5%ක වර්ධනයක් අපේක්ෂාවෙන් සිටියේය. ආර්ථිකයේ වර්ධන වේගයේ කඩා වැටීම නිෂ්පාදනය කඩා වැටීම, සේවා සැපයීම් අඩාලවීම, රැකියා අර්බුද ඇතිවීම, ඇති නැති පරතරය තවදුරටත් වර්ධනය ආදී තවත් ආර්ථික සාධක



ගණනාවක වෙනස්වීම් සඳහා හේතු වේ.

උද්ධමනයද දෙගුණයකට ආසන්න ලෙස 4% සිට වසරක් තුළ 7.3%ක් දක්වා ඉහළ යාමේ ප්‍රතිඵලය සෑම භාණ්ඩ හා සේවාවන්හි මිල ගණන් ඉහළ යාමයි. ආදායම ඉහළ නොගොස් මිල ඉහළ යාම, රුපියල බාල්දුවීම ජනතාවගේ ජීවන මට්ටම කෙරෙහි ඍජුවම බලපායි. ඇති නැති පරතරයද තව තවත් පුළුල් ලෙස අසමානතාවය වර්ධනයේ දිශාවට ගමන් කරයි. ආයෝජනද ඩොලර් මිලියන 500ක පමණ ඌනතා පරතරයක් එක් වසරක් තුළ අත්පත් කර ගැනීමට සමාන්තර රු. කෝටි 77,600ක් පමණ අලුතින් ණය ගැනීමට එම වසර තුළදීම සිදුවීම තුළින් රටක් ලෙස ලංකාව මුහුණ දෙන අර්බුදයේ තරම තේරුම් ගත හැකිය.

ආයෝජන බිඳ වැටීම, ණය ඉහළ යාම, මිල මට්ටම ඉහළ යාම, රුපියල කඩා වැටීම වැනි සාධක සියල්ලම එකවර සක්‍රීය වන විට එම ආර්ථිකයේ පැවැත්ම, නැතිනම් අර්බුදයට යාම හුදු දේශපාලන උප්පරවැට්ටි මගින් කළමනාකරණය කිරීම සිතීමටවත් නොහැකිය.

IMF - අණපනත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ඍජු බලපෑම යටතේ විටෙක ආර්ථිකය කළමනාකරණය මුවාවෙන් රාජ්‍ය සම්පත් විකිණීමට අණපනත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ආණ්ඩුවම තවත් විටෙක "ආයෝජන දිරිගැන්වීමට" මුවාවෙමින් විදේශ ප්‍රාග්ධනයට දොර විවෘත කරයි. "ණය කළමනාකරණය" මුවාවෙමින්ද සිදු කරන්නේ යළි යළිත් ණය උගුලේම ගැටගසන යෝජනා ඉදිරිපත් කිරීමය. එවැනි නියෝග, අණපනත් කිහිපයක්ම පසුගියදා පාර්ලිමේන්තුවේ ජනතා විමුක්ති පෙරමුණ ඇතුළු විපක්ෂයේ විරෝධතා මධ්‍යයේ සම්මත කරන ලදී. එවැනි පනත් ගැන අවබෝධයක් ලැබීම අර්බුදයේ දිග පළල තේරුම් ගැනීමට අත්‍යාවශ්‍ය වනු ඇත.

### ප්‍රපාතන විරෝධී ප්‍රතිතෝලන බදු පනත

(Anti Dumping and Countervalling Duties Bill)

ආණ්ඩුවේ ඉදිරි ආර්ථිකය විවෘත කිරීමේ දැක්ම තනි වාක්‍යයකට ගතහොත් "තීරු බදු නොවන සියලු බදු අහෝසි කිරීම" ලෙස දැක්විය හැකිය. අප රටේ තීරු බදුවලට අමතරව තවත් බදු වර්ග රැසක් පනවනු ලබයි. සමහර බදු රජයට ආදායමක් ලබා ගැනීමේ ඍජු අවශ්‍යතාවය සඳහාම පනවන අතර, තවත් බදු ආදායමට අමතරව දේශීය නිෂ්පාදන කර්මාන්ත සඳහා විදේශීය සමාන නිෂ්පාදනවලින් එල්ලවන තර්ජන පාලනයට ද යොදා ගනී. උදාහරණ ලෙස දේශීය බිස්කට් නිෂ්පාදනය ආරක්ෂා වී ඇත්තේ විදේශීය බිස්කට් දේශීය පාරිභෝගිකයන් අකමැති නිසා නොවේ. විදේශීය බිස්කට් කිලෝවකට රු. 200ක පමණ අමතර බද්දක් (ආරක්ෂණ සෙස්) පනවන නිසාය. පාවහන් ඇතුළු භාණ්ඩ රැසක ජාතික නිෂ්පාදනය රැකී ඇත්තේ එලෙසිනි. රජය එම බදු ඉවත් කිරීමට තීරණයක් ගතහොත් අඩු තාක්ෂණයකින්, දුප්පත් ප්‍රාග්ධනයකින් හා බොහෝ අඩු පහසුකම් යටතේ නිෂ්පාදනයක් කරගෙන යන දේශීය කර්මාන්තකරුවා ජාත්‍යන්තර වෙළඳපොළේ බොහෝ පහසුකම් යටතේ අඩු වියදමින් නිෂ්පාදනය කරන තරගකරුවන් සමඟ සමාන පදනමකින් තරග කළ යුතු වේ.

ජාත්‍යන්තර වෙළඳ සංවිධානය (WTO) 2001 වසරේ සිට උත්සාහ දරන්නේ මෙම අප වැනි රටවල් ජාතික වෙළඳපොළ ආරක්ෂා කරන බදු නීති සියල්ල ඉවත්කර ජාත්‍යන්තර තරගකරුවන්ට අප වෙළඳපොළවල් අත්පත් කර ගැනීමට ඉඩ සැලැස්වීමයි. 2001 සිට දරන ලද උත්සාහය අවස්ථා කිහිපයකදී පරාජය කළද පසුගියදා එම පනත සංශෝධන සහිතව නමුත් පැරණි අරමුණින්ම පාර්ලිමේන්තුවේදී සම්මත කරනු ලැබ ඇත.

මෙම පාර්ලිමේන්තුවේ සම්මත කළ පනතේ අරමුණු එළිපිට දක්වන ලද්දේ දේශීය කර්මාන්තකරුවන්ට ඇති තර්ජනවලින් ඔවුන් ආරක්ෂා කිරීමේ පනතක් ලෙසටය. එසේම, ජාත්‍යන්තර වෙළඳපොළේ ඇති භාණ්ඩ නිෂ්පාදන මිල අඩුවෙන් සටහන් කර (under value), ලංකාවට ගෙන්වීමට ඇති ඉඩ වැළැක්වීම ලෙසටයි. නමුත් සිදුවන්නේ හාත්පසින්ම වෙනස් ප්‍රතිඵලයකි. එනම්, දෙශීය කර්මාන්තකරුවා මුළු වෙළඳ පොළේ සියලු දත්ත තොරතුරු එක්රැස් කර, (තමන් විසින්ම) තමන්ට සමාන විදේශීය සමාගමක නිෂ්පාදන මගින් තර්ජනයක් වන්නේ යැයි ඔප්පු කළ යුතුය. ඔප්පු කළහොත් පමණක් විදේශීය කර්මාන්තයෙන් වන තර්ජනයෙන් ඔහු ආරක්ෂා කිරීමට බද්දක් අදාළ වන අතර, එය ආරක්ෂා කිරීමේ පියවර ( safe gaurd tax) බද්ද ලෙස හැඳින්වේ. එසේ ඔප්පු කිරීමට නොහැකි වන්නේ නම්, මෙතෙක් එම දේශීය නිෂ්පාදනය ආරක්ෂා කිරීමට සමාන විදේශ නිෂ්පාදන වෙත පනවා ඇති බදු ඉවත් කෙරේ. තාවකාලික ලෙස දින 200කුත් උපරිම ලෙස ඉදිරි වසර 3කුත් දැනට ක්‍රියාත්මක දේශීය නිෂ්පාදන සඳහා ආරක්ෂණ සෙස් බදු ක්‍රියාත්මක වන අතර, ඉන්පසු "ආරක්ෂණ පියවර" මුවාවෙන් භාණ්ඩ වර්ගීකරණ 1200ක (භාණ්ඩ 1200ක් නොවේ. භාණ්ඩ ලෙස ඊට වැඩි) ප්‍රමාණයක තීරු බදු නොවන සියලු බදු නිදහස් කර ජාත්‍යන්තර වෙළඳ පොළට ලංකාවේ ආර්ථිකය විවෘත කර දෙනු ඇත. පාර්ලිමේන්තුවේ මෙම ආරක්ෂණ පියවර හා ප්‍රවාහන - ප්‍රතිතෝලන බදු පනත් සම්මත කරවන පොරොන්දුව පිටම (සම්මත කිරීමටත් කලින්ම) සිංගප්පූරුව සමඟ අගමැතිවරයා පසුගියදා නිදහස් වෙළඳ ගිවිසුමක් අත්සන් කරන ලදී. එම ගිවිසුම අත්සන් කර ඇත්තේ මෙවැනි බදු නිදහස් කිරීම සඳහා පනත් පාර්ලිමේන්තුවේ සම්මත කර දෙන පොරොන්දුව පිටය.

> "මෙහි අපූර්ව දේ වන්නේ, රජයේ ණය අවශ්‍යතාවයන්ට සීමා බාධක නොතකා ණය ගැනීමට හැකියාව මෙන්ම, එසේ ණය ගැනීමට මැදිහත් වන මහ බැංකුවේ හෝ අදාළ අමාත්‍යාංශයේ නිලධාරියෙකු එම ණය ගැනීමේ කටයුත්ත නිසා කිසිදු අධිකරණයක කුමන හෝ ආකාරයකින් වැරදිකරුවෙකු කිරීමට ලක් නොවීමය, එම වගන්තිය යොදා ඇත්තේම අර්ජුන මහේන්ද්‍ර වැනි ණය මුවාවෙන් රාජ්‍ය ධනය ඉදිරියේදීත් මංකොල්ල කන ගජ මිතුරන්ට නීතියේ රැකවරණ ලබාදීමය."

### සක්‍රීය බැරකම් කළමනාකරණ පනත

ශ්‍රී ලංකාව රටක් ලෙස 2017 වසරේදී ගෙවිය යුතු මුළු ණය ප්‍රමාණය රු:කෝටි 10,16,390කි. (රු. බිලියන 10,163කි). එය 2016 වසරට වඩා රු:කෝටි 88,200ක වැඩිවීමකි. එසේ ණය බර කෝටි ලක්ෂයකට පමණ ආසන්නව වසරකට ඉහළ යන විට ආයෝජන ලෙස මුදල් ගලා ඒමක් රට තුළට සිදු නොවේ. නමුත්, ණය වාරික හා පොලී වාරික ගෙවීම රටක් ලෙස අනිවාර්යෙන්ම කළ යුතුවේ. ආණ්ඩුවේ දේශපාලන කයිවාරු ඉක්මවා රජයක් ලෙස මුහුණ දෙන අභියෝගය වන්නේ, ණය ගෙවීමට මුදල් සොයා ගන්නේ කෙසේද යන්නයි.

භාණ්ඩාගාර බිල්පත්, සුරැකුම්පත්, වාණිජ පොලී මත ණය ගැනීම, බැංකු හා වෙනත් බැංකු නොවන මූලාශ්‍ර ආදී ලෙස ණය ගැනීමේ උපකරණ රැසක් තිබුණත් රජයකට තමන්ට රිසි පරිදි ණය ගැනීමේ අවසරයක් මෙතෙක් පාර්ලිමේන්තුවෙන් ලබාදී නොතිබුණි. අයවැය යෝජනා ඉදිරිපත් කරන

15 වැනි පිටුවට



"නිවැරදි අදහස් එන්නේ කොහෙන්ද? ඒවා අහසින් වැටෙනවාද? නැත. ඒවා හිත තුළ ඉබේම පහළ වෙනවාද? නැත. ඒවා එන්නේ සමාජ භාවිතයෙන්ය. එයින් පමණක්මය. ඒවා තුන් වර්ගයක සමාජ භාවිතයෙන් එයි; එනම් නිෂ්පාදනය පිණිස කරන අරගලය, පංති සටන සහ විද්‍යාත්මක පර්යේෂණයයි."

**මාඕ සේතුං**

**උදෘත පාඨ, 236 පිටුව**

# එක්සත් ජනපදය: යුද උණුසුම මැද සාම සාකච්ඡා සූදානමක්



පසුගිය මාර්තු 13වැනි දා එක්සත් ජනපද ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් විසින් එරට රාජ්‍ය ලේකම් රෙක්ස් ටිලර්සන් එම ධූරයෙන් ඉවත් කොට CIA අධීක්ෂක මයික් පොම්පියෝ එම ධූරයට පත් කරනු ලැබීය.

රාජ්‍ය ලේකම් රෙක්ස් ටිලර්සන් ධූරයෙන් ඉවත් කිරිම හදිසියේ සිදු වූවක් නොවේ. කලක සිට ඩොනල්ඩ් ට්‍රම්ප් හා ටිලර්සන් අතර නොගැලපීම් ප්‍රකාශයට පත් වුණි. කිසියම් ප්‍රශ්නයකදී ඔවුන් දෙදෙනා එකිනෙකට පරස්පර තීරණවලට එළඹිනි. රෙක්ස් ටිලර්සන් ඊට පෙර EXXON MOBIL නැමැති එක්සත් ජනපද තෙල් සමාග මේ ප්‍රධාන විධායක අධ්‍යක්ෂකවරයා කටයුතු කළේ ය.

අභිනවයෙන් තේරීපත් වූ රාජ්‍ය ලේකම්වරයා CIA අධ්‍යක්ෂ ධූරය දැරීමට ප්‍රථම එක්සත් ජනපදයේ හමුදා නිලධාරියෙකු ලෙස කටයුතු කළ අයෙකි.

CIA සංවිධානයේ නව අධ්‍යක්ෂකවරයා ලෙස පත් කර ඇත්තේ ගිනා හස්බෙල්ය. ඇය CIA සංවිධානයේ ප්‍රථම කාන්තා අධ්‍යක්ෂකවරිය ලෙස ඉතිහාස ගත වනු ඇත. ඇය මීට 17 වසරකට ඉහතදී තායිලන්තයේ රහසිගත සිර කඳවුරකදී ත්‍රස්තවාදීන් දෙනෙකුට දරුණු වධබන්ධන ලබා දීම සම්බන්ධයෙන් හා ඊට අදාළ වීඩියෝ පට විනාශ කිරීම සම්බන්ධයෙන් චෝදනා ලැබ ඇති තැනැත්තියකි.

උතුරු කොරියානු නායක කිම් ජෝන් අන් සහ එක්සත් ජනපද ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් අතර හමුවක් සිදු වීමට ඇති ඉඩකඩද මේ දිනවල ජාත්‍යන්තර ක්ෂේත්‍රයේ ප්‍රධාන මාතෘකාවක් බවට පත් වී තිබේ. මාධ්‍ය වාර්තාවලට අනුව මෙම හමුවීම මෙම වසරේ මැයි මාසයේදී සිදු වීමට බොහෝදුරට ඉඩ තිබේ.

එහි නවතම සිදුවීම වාර්තා වූයේ, පින්ලන්තයේ හෙල්සින්කි නුවරිනි. මාර්තු 21වැනිදා උතුරු කොරියාවත් දකුණු කොරියාවත් එක්සත් ජනපදයත් අතර නිල නොවන සාකච්ඡාවක් හෙල්සින්කි නුවරදී පැවති බව පින්ලන්ත විදේශ කටයුතු අමාත්‍යංශය නිවේදනය කළේය.

කොරියානු අර්ධද්වීපය තුළ මතුවූ යුද උණුසුම සමනය කිරීමට පටන් ගැනුණේ 2018 වසරේ මුල සිටය. උතුරු කොරියාව හා දකුණු කොරියාව අතර සාකච්ඡා ආරම්භ වීමත් පෙබරවාරියේ දී පැවති 23වැනි ශීත ඔලිම්පික් උළෙලට උතුරු කොරියාව සහභාගි වීමත් සමග එය සිදු විය. ශීත ඔලිම්පික් උළෙලට සහභාගි වන කාල සීමාව තුළ උතුරු කොරියාව සිය න්‍යෂ්ටික අත්හදා බැලීම් නතර කර දැම්මේය. ඒ අතර එක්සත් ජනපදයත් දකුණු කොරියාවත් සිය ඒකාබද්ධ යුද අභ්‍යාසය අප්‍රේල් මාසය දක්වා කල් දැමීමට තීරණය කළහ.

ඉන්පසුව දකුණු කොරියානු විශේෂ නියෝජිත පිරිසක් උතුරු කොරියාව බලා පිටත්ව ගිය අතර එහිදී ඔවුන් හා උතුරු කොරියානු නායක කිම් ජෝන් අන් අතර සාකච්ඡාවක් සිදු විය. මෙම සාකච්ඡාව සඳහා යැවුණ නියෝජිත පිරිසේ ප්‍රධානියා වූයේ දකුණු කොරියානු ආරක්ෂක උපදේශක චුන් ඊ යොන්ග්ය. මෙම හමුවේදී අතරමග නැවතුණ උතුරු හා දකුණු කොරියානු සාකච්ඡා (අන්තර් කොරියානු සාකච්ඡා) යළි අප්‍රේල් අගදී ආරම්භ කිරීමට යෝජනා කර තිබුණි. (පළමු හා දෙවන අන්තර් කොරියානු සාකච්ඡා පැවැත්වූයේ 2000 හා 2007 යන වසරවලදීය. ඉන්පසු දකුණු කොරියානු නැවක් ගිල්වීම සම්බන්ධයෙන් උතුරු කොරියාවට චෝදනා එල්ල කිරීමත් සමග එකී සාකච්ඡා අඩාල වූ අතර එතැන් සිට මේ වසර මුල දක්වා කොරියානු අර්ධද්වීපය තුළ යුද උණුසුම වර්ධනය විය.

මේ අතර පසුගිය මාර්තු 09වැනිදා උතුරු කොරියානු ජනාධිපතිවරයා මුණ ගැසීමට තමා සූදානම් බව වත්මන් එක්සත් ජනපද ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් ප්‍රකාශ කළේය. උතුරු කොරියානු හා එක්සත් ජනපද ජනාධිපතිවරුන් අතර ඉක්මන් හමුවක් ගැන මාධ්‍ය වාර්තා කිරීමට පටන් ගත්තේ ඉන් පසුවය. මේ අතරතුර මාධ්‍ය තවදුරටත් වාර්තා කර සිටියේ එක්සත් ජනපද යුද විශේෂඥයන් කොරියානු අර්ධද්වීපයේ යුද උණුසුම තුරන් කර දැමීම සඳහා මැදිහත් වන ලෙස ඩොනල්ඩ් ට්‍රම්ප්ගෙන් ඉල්ලා ඇති බවය. එහිදී එක්සත් ජනපද නාවුක යුද පාසලේ ලයිල් ගෝල්ඩ්ස්ටයින් ප්‍රකාශ කර තිබුණේ එක්සත් ජනපදය උතුරු කොරියාවේ ආරක්ෂක අවශ්‍යතා ගැනද සැලකිලිමත් විය යුතු බවයි. මේ නිසා දකුණු කොරියාවෙන් එක්සත් ජනපද හමුදා නාමිකව ඉවත් කිරීම නොව සැබෑ ලෙසම අඩු කිරීම පිළිබඳවත් යම් යම් ආර්ථික සහන උතුරු කොරියාවට ලබා දීම පිළිබඳවත් සිතා බැලිය යුතු බව ඔහුගේ අදහසයි.

උතුරු කොරියාව සම්බන්ධයෙන් එක්සත් ජනපදය මේ වන විට කිසියම් වෙනස් පිළිවෙතක් අනුගමනය කරනු පෙනෙන්නට තිබේ. මීට පෙර එක්සත් ජනපදය උතුරු කොරියාව වෙත බරපතළ පීඩනයක් එල්ල කරනු ලැබුවේ විවිධාකාරයේ සම්බාධක පැනවීමෙනි. උතුරු කොරියාවට එරෙහිව යුද ශක්තිය වර්ධනය කිරීමෙනි. එහි ප්‍රතිඵලය වූයේ උතුරු කොරියාව තව තවත් න්‍යෂ්ටික අත්හදා බැලීම් සිදු කිරීමයි. එහි දී උතුරු කොරියාව සැලකිය යුතු ජයග්‍රහණ ප්‍රමාණයක්ද අත්පත් කර ගත්තේය. මේ වන විට මිනිත්තු කිහිපයකදී ජපානයේ ටෝකියෝ නුවරට දකුණු කොරියාවේ සෝල් අගනුවරට හෝ න්‍යෂ්ටික පහරදීමක් සිදු කිරීමේ හැකියාව එරටට ඇත. ඊට අමතරව එක්සත් ජනපදයට වුවද පහර දීමේ හැකියාව එරට වර්ධනය කර ගත්තේය. එක්සත් ජනපදයට සිය උපක්‍රම වෙනස් කිරීමට එක් අතකින් බල කරන්නේ මෙම තත්වයයි.

අනෙක් අතට උතුරු කොරියාව පිළිබඳ ප්‍රශ්නය හුදෙකලා එකක් නොවේ. එය දකුණු චීන මුහුදේ නාවුක ගමනාගමනය හා දූපත් පිළිබඳ අර්බුදයත්, දකුණු කොරියාව තුළ THAAD මිසයිල පද්ධතිය ස්ථාපිත කිරීම පිළිබඳ අර්බුදයත්, ජපන් දූපත් පිළිබඳ අර්බුදයත්, එසේම එක්සත් ජනපදය විසින් චීනයට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ගයන් විශේෂයෙන් චීනයේ මුහුදු ගමන් මාර්ග අවහිර කිරීමේ සැලැස්මත් සමග මෙය අන්තර් සම්බන්ධය.

උතුරු කොරියාවට එරෙහි සම්බාධක පැනවීම සඳහා එක්සත් ජනපදය ආරක්ෂක මණ්ඩලයට ගෙන ආ යෝජනාවට චීනයත් රුසියාවත් පක්ෂව ඡන්දය ප්‍රකාශ කළේ සම්බාධක පැනවීමට තමන් එකඟ වන්නේ වෙනස් කොන්දේසි යටතේ බව ප්‍රකාශ කරමිනි. එකී දෙරට එහිදී ප්‍රකාශ කළේ උතුරු කොරියාවේ න්‍යෂ්ටික අත්හදා බැලීම්වලට තම දෙරට විරුද්ධ නමුත් පළමුව සිදු කළ යුත්තේ, එසේ න්‍යෂ්ටික අත්හදා බැලීම් සිදු කිරීමට උතුරු කොරියාවට සිදු වී ඇත්තේ ඇයිද යන්න සොයා බලා එම තත්වයන් නැති කිරීමට කටයුතු කිරීම බවය. එබැවින් කොරියානු අර්ධද්වීපයේ මෙම අර්බුදය එක්සත් ජනපදය ප්‍රමුඛ බටහිර අධිරාජ්‍යවාදී කඳවුරේ සහ චීනය හා රුසියාව ප්‍රමුඛ නැගී එන බල කඳවුරක ප්‍රතිවිරෝධතාව ප්‍රකාශයට පත් කිරීමකි. මේ නිසා කොරියානු අර්ධද්වීපයේ අර්බුදය විසඳීමේදී ඊට පාදක වූ සියලු ගැටුම් හා අර්බුදයන්ද අදාළ කර ගැනීමට සිදු වනු ඇත.

කෙසේ වෙතත් උතුරු කොරියානු හා එක්සත් ජනපද නායකයන්ගේ හමුවීම ඉදිරියේදී සිදුවුවහොත් එය ඓතිහාසික සිදුවීමක් වනු නොඅනුමානය. එවැනි හමුවකදී පහසුකම් සැලසීමට රුසියාව දැනටමත් කැමැත්ත පළ කර තිබේ. හමුව තම රට තුළ දී සිදු කිරීමට අවශ්‍ය ඉඩකඩ ලබා දීමට රුසියාව සූදානම්ව සිටියි.

එසේ වුවත් එක්සත් ජනපද හා උතුරු කොරියානු නායකයන්ගේ හමුවකට තවත් බොහෝ දුර යා යුතු බව සමහරුන්ගේ මතයයි.

## කියුබාව: සමාජවාදී පාලනයේ පරම්පරා වෙනසක්



ඉදිරි වසර පහ සඳහා කියුබානු පාර්ලිමේන්තුවට නියෝජිතයන් පත් කර ගැනීමේ මැතිවරණය මාර්තු 11වැනි දින පැවැත්වුණි. එහිදී ඡන්ද දායකයන් මිලියන 7.3ක් ඡන්දය පාවිච්චි කළ අතර එය ලියාපදිංචි ඡන්ද දායකයන්ගෙන් 82.9%ක් විය. මෙහිදී නියෝජිතයන් 605 දෙනෙකු තෝරා පත් කර ගැනුණි.

තේරි පත් වූ සභිකයන් අතරින් 53.22%ක් කාන්තාවන් වූ අතර 13.22%ක් තරුණ නියෝජිතයෝ වූහ. 40.51%ක් අප්‍රිකානු සම්භවයක් සහිත නියෝජිතයන්ය.

මෙවර මැතිවරණය සඳහා කියුබානු වත්මන් ජනාධිපති රාවුල් කස්ත්‍රෝ ඉදිරිපත් නොවුණි. මේ නිසා දේශපාලන විචාරකයන් මේ මැතිවරණය හැඳින්වූයේ කියුබානු සමාජවාදී පාලනයේ පරම්පරා වෙනසක් ඇති වූ මැතිවරණයක් ලෙසය. ඉදිරි කාල වකවානුව සඳහා කියුබානු පාර්ලිමේන්තුවේ ප්‍රධානියා ලෙස කටයුතු කරනු ඇත්තේ 57 හැවිරිදි ඉංජිනේරුවරයෙකු වන ඩයස් කානල් යැයි ඔවුහු පවසති.

කියුබානු පාර්ලිමේන්තුවේ මීළඟ සැසිවාරය ආරම්භ වීමට නියමිතව ඇත්තේ අප්‍රේල් 19වැනි දිනය.

## රුසියාව: බල තුලනය ශක්තිමත් කරන පුටින්ගේ මැතිවරණ ජය



රුසියානු ජනාධිපතිවරයා ලෙස එරට හිටපු ජනාධිපති ව්ලැඩිමීර් පුටින් යළිත් වතාවක් තේරී පත් විය. එරට ඡන්ද දායකයන්ගෙන් 67.49%ක් මෙවර ජනාධිපතිවරණයේදී ඡන්දය පාවිච්චි කර තිබූ අතර ඉන් 76.67%ක ප්‍රතිශතයක් දිනා ගැනීමට ඔහුට හැකි විය. ව්ලැඩිමීර් පුටින් රුසියානු ජනාධිපතිවරයා ලෙස තේරී පත් වූයේ සිව්වැනි වතාවටය.

ජනාධිපතිවරණයෙන් දෙවැනියා වූයේ කොමියුනිස්ට් පක්ෂයේ අපේක්ෂක පාවෙල් ගෘඩිනින්ය. (PAWEL GRUDININ) ඔහු ලබා ගත්තේ 11.8%ක ප්‍රතිශතයකි.

පුටින්ගේ ප්‍රධාන ප්‍රතිවාදියා වූ ඇලෙක්සි නවාල්නි (ALEXEI NAVALNY) මෙවර ජනාධිපතිවරණයට තරඟ නොකළේය. ඔහු ජනාධිපතිවරණය ඉලක්ක කර ගනිමින් මැතිවරණ ව්‍යාපාරය ආරම්භ කළද රුසියානු මැතිවරණ කොමිසම ඔහුගේ නාම යෝජනාව ප්‍රතික්ෂේප කළේ ඔහුට විරුද්ධව එරට ශ්‍රේෂ්ඨාධිකරණය ගෙන තිබූ නඩු තීන්දුවක් සලකා බැලීමෙනි.

කෙසේ වෙතත් ලෝකයේ දේශපාලන බල තුලනය පිළිබඳ සලකා බැලීමේදී පුටින්ගේ ජයග්‍රහණය සැලකිය යුතු වැදගත්කමක් දරයි. පුටින් සමාජවාදී විරෝධියෙකු වුවද එක්සත් ජනපදයට හා යුරෝපයට එරෙහි කඳවුර ශක්තිමත් කිරීමේදී පුටින්ගේත් රුසියාවේත් කාර්යභාරය වැදගත් වී තිබේ. රුසියාව BRICS සංවිධානයේද ප්‍රබල සාමාජිකයෙකි.

## ස්ටීවන් හෝකින්ස්: රෝගී බව පරදවා මිය ගිය සියවසක බුද්ධිමතා




ඇල්බර්ට් අයින්ස්ටයින්ගෙන් පසුව බිහිවූ විශිෂ්ටතම විද්‍යාඥයා ලෙසට සැලකෙන බ්‍රිතාන්‍ය භෞතික විද්‍යාඥ ස්ටීවන් හෝකින්ස් මාර්තු 14 වැනි දින අභාවයට පත් විය. මිය යන විට ඔහුගේ වයස අවුරුදු 76කි.

වයස අවුරුදු 22 දී ඔහු දරුණු ස්නායු ආබාධයකට (Amyotrophic Lateral Sclerosis) ගොදුරු වූ අතර ඔහුගේ චින්තනයේ වෙනසක් සිදු නොවුණද එක් ඇසක් හා ඇඟිල්ලක් හැරුණ කොට සමස්ත සිරුරම අප්‍රාණික විය. අවුරුදු 54ක් ඔහු ගත කළේ එම තත්වයෙනි. එහෙත් රෝගී තත්වය නිසා ඔහු තමන්ගේ විද්‍යාත්මක කාර්යභාරය අත් නොහැරියේ ය. ඔහු අවකාශ කාල ඒකත්වයේ නියමය ඉදිරිපත් කළේය. හෝකින්ස් විකිරණය නම් සංකල්පය ඉදිරිපත් කළේ ය. විසි වන සියවසේ ශ්‍රේෂ්ඨතම නියමයන් ද්විත්වය වන සාපේක්ෂතාවාදය හා ක්වොන්ටම් යාන්ත්‍රණය එක්සත් කළේය. ඔහුගේ අවසන් කාර්යභාරය වූයේ විශ්වයන් කිහිපයක පැවැත්ම පිළිබඳ මතය ඉදිරිපත් කිරීමය.

ඔහු සිය ජීවිත අරමුණු ගැන මෙසේ ප්‍රකාශ කළේ ය.

"මගේ අරමුණ ඉතා සරල දෙයක්. එනම් විශ්වය පිළිබඳ අංග සම්පූර්ණ දැනුමක් ලබා ගැනීම. එය මෙසේ වූයේ ඇයිද හා එය මේ ආකාරයෙන් පවතින්නේ ඇයිද යන්න දැන ගැනීමයි."

ඔහු අදේවවාදියෙක් වූ අතර ප්‍රගතිශීලියෙක්ද විය. රෝගී තත්වය මැද තරුණ වියේදී වියට්නාම් යුද විරෝධී උද්ඝෝෂණයකටද ඔහු එක්ව තිබිණි.

## වෙනිසියුලාව: පෙට්‍රෝ ඩොලරයට ට්‍රම්ප්ගෙන් පොල්ලක්




එක්සත් ජනපද ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් මාර්තු 19වැනිදා වෙනිසියුලාවේ පෙට්‍රෝ ඩොලරයට එරෙහි විධායක නියෝගයකට අත්සන් තැබීය. ඒ අනුව වෙනිසියුලානු ආණ්ඩුව විසින් නිකුත් කරනු ලබන පෙට්‍රෝ ඩොලර් වැනි ඕනෑම ඩිජිටල් (අන්තර්ජාල) මුදල් ඒකකයක් හා ගනුදෙනු කිරීම තහනම් වේ.

වෙනිසියුලානු ආණ්ඩුව පසුගිය පෙබරවාරි 20වැනිදා 'පෙට්‍රෝ ඩොලර්' නමින් ඩිජිටල් මුදල් ඒකකයක් හඳුන්වා දුන්නේ ජාත්‍යන්තර වෙළඳාමේදී ඩොලරය හිමි කර ගෙන ඇති ඒකාධිකාරය අහෝසි කිරීමේ අරමුණින් හා වෙනිසියුලාවට එරෙහි එක්සත් ජනපදයේ හා එහි සගයන්ගේ ආර්ථික සම්බාධකවලින් ගැලවීමේ මඟක් ලෙසටය. පෙට්‍රෝ ඩොලරය ලෝකයේ ප්‍රථම රාජ්‍ය අනුග්‍රහය ලබන අන්තර්ජාල මුදල් ඒකකයකි.

ඉහත විධායක නියෝගය අනුව වෙනිසියුලාවේ මෙම අන්තර්ජාල මුදල් ඒකකය සමඟ ගනුදෙනු කරන කිසිවෙකුට එක්සත් ජනපදය සමග ගනුදෙනු කළ නොහැකිය.

කෙසේ වෙතත් ටයිම්ස් සඟරාවට අනුව මෙම අන්තර්ජාල මුදල් ඒකකය හුදු වෙනිසියුලානු නිපැයුමක් නොවේ. එය රුසියානු - වෙනිසියුලානු බද්ධ ව්‍යාපාරයකි.

# සමාජවාදය සහ කාන්තා නිදහස

සෑම මාර්තු 08වැනිදාවක්ම ලොව පුරා කාන්තා සංවිධානවලට විශේෂ දිනයක් වන්නේ, එදින ජාත්‍යන්තර කාන්තා දිනය වන නිසාය. එදිනට කවුරුත් කාන්තා පීඩනය හා කාන්තා අයිතිවාසිකම් ගැන කථා කරති. ඒවා වහ වහා ලබා දෙන ලෙසට බල කරති. එහෙත් සැබෑ ලෙසම කාන්තා අයිතිවාසිකම් දිනා ගත හැක්කේ කෙසේද යන්න සාකච්ඡාවෙන් බැහැර වීමට බොහෝ දෙනෙක් උත්සාහ කරති. අනෙක් අතට බොහෝ රාජ්‍ය නොවන කාන්තා සංවිධාන හා ආණ්ඩු ජාත්‍යන්තර කාන්තා දිනය සමරන්නේ විලාසිතාවක් ලෙසට පමණි.

මිනිස් ඉතිහාසය තුළ ලොව කිසියම් හෝ රාජ්‍යයක් කාන්තා නිදහස වෙනුවෙන්, කාන්තා විමුක්තිය වෙනුවෙන් සංවිධිත වැඩපිළිවෙළක් ප්‍රකාශයට පත් කළා නම් හා ක්‍රියාත්මක කළා නම් එය ප්‍රථම වරට සිදු කරනු ලැබුවේ සමාජවාදී රුසියාව විසිනි. ඒ දක්වා අනෙකුත් සියලුම කාන්තා සංවිධාන සටන් වැද තිබුණේ කාන්තාවන්ට වැඩි දේශපාලන අයිතිවාසිකම් දිනා ගැනීම වෙනුවෙන් පමණකි. සමාජවාදය කාන්තාවගේ සැබෑ නිදහස දිනා ගැනීම වෙනුවෙන් ඉතිහාසයේ ප්‍රථම වතාවට ප්‍රායෝගිකව මැදිහත් විය. සමාජවාදය කාන්තාවට ප්‍රබලතම දේශපාලන අවස්ථා උදා කර දුන්නා පමණක් නොව ක්‍රියාකාරකම්වලද විප්ලවීය වෙනසක් ඇති කරනු ලැබී ය. කාන්තාවට සමාජ, දේශපාලන, ආර්ථික හා සංස්කෘතික ක්‍රියාකාරීත්වයේ සමාන අවස්ථා සහතික කළේය. සමාජවාදය මානව ඉතිහාසයේ දැවැන්තම ජයග්‍රහණ රැසක් කාන්තාවට දිනා දුන්නේ ය.

බොහෝ කාන්තා සංවිධාන සමාන වැඩට සමාන වැටුප්, සමාන අධ්‍යාපනික හා රැකියා අවස්ථා, මූල්‍ය හා නෛතික නිදහස, ප්‍රචණ්ඩත්වයට හා ලිංගික හිංසනයට එරෙහි නිදහස ආදී සටන් පාඨවලට පිවිසෙන්නේ ඉන් පසුවය. අද දවස තුළ වුවද ඔවුන් එකී ඉල්ලීම් ඉල්ලා සිටිනුයේ ධනේශ්වර සමාජයෙනි. ධනේශ්වර ක්‍රමයට තවදුරටත් කාන්තාවට සැබෑ නිදහස දිනා දිය නොහැකි බව ඔවුහු නොදනිති; නැතහොත් එය වුවමනාවෙන්ම අමතක කරති.

**කාන්තාව හා දේශපාලන අයිතිවාසිකම්**

කාන්තාවට හිමි දේශපාලන අයිතිවාසිකම් සැබෑ ලෙසම තහවුරු කරනු ලැබුවේ සමාජවාදය විසිනි. බලය ලබා ගැනීමට පෙර සිටම වමේ ව්‍යාපාරය කාන්තාවන් දේශපාලනය වෙත කැඳවා ගැනීම සඳහා අඛණ්ඩ අරගලයක් සිදු කළේය. සමාජවාදය පිහිටුවීමෙන් පසු සමාජවාදී ව්‍යවස්ථාවෙන්ම කාන්තාවන්ට දේශපාලනය කිරීමට, වෘත්තීය සමිතිවලට බැඳීමට ඇති අයිතිය තහවුරු කරනු ලැබී ය. සමාජවාදය තුළ දී කාන්තාව සමාජ ක්‍රියාකාරිත්වයට කැඳවන ලදී. ඔවුන්ටද පිරිමින්ට මෙන් කරට කර සමාජ ක්‍රියාකාරිත්වයේ නියැලීමට ඉඩකඩ නිර්මාණය කර දෙනු ලැබිය. උදාහරණයක් ලෙස කියුබාවේ වයස අවුරුදු 14ට වැඩි කාන්තාවන්ගෙන් 90.6% ක් කියුබානු කාන්තා සමිති සම්මේලනයේ සාමාජිකාවන් ලෙස සමාජ ක්‍රියාකාරිත්වයේ නියැලෙති. කියුබානු පාර්ලිමේන්තුව තුළ කාන්තා නියෝජනය 53.22%කි. එය දෙවෙනි වන්නේ රුවන්ඩාවට පමණි. එක්සත් ජනපද කොංග්‍රසය තුළ කාන්තා නියෝජනය යන්තම් 17%ක් පමණි. පාර්ලිමේන්තුව තුළ කාන්තා නියෝජනයේ ලෝක සාමාන්‍යය වන්නේ 23.4%කි.

| රට | පාර්ලිමේන්තුව තුළ කාන්තා නියෝජනය (%) |
|---|---|
| 1.රුවන්ඩාව | 61.3 |
| 2.කියුබාව | 53.22 |
| 3.ආර්ජන්ටිනාව | 38.1 |
| 4.ඉක්වදෝරය | 38 |
| 5.ලෝක සාමාන්‍යය | 23.4 |
| 6.චිලිය | 22.6 |
| 7.එක්සත් ජනපදය | 17 |

**කාන්තාව හා රැකියා අවස්ථා**

කාන්තාව සමාජ ක්‍රියාකාරිත්වයට කැඳවීමට නම් එක් පූර්ව කොන්දේසියක් වන්නේ, ඇය වෙත පැවරුණ පවුලේ සහ දරුවන්ගේ කටයුතුවලින් ඇය නිදහස් කිරීමයි. ආහාර පිසීම, දරුවන් රැකබලා ගැනීම සමාජමය කටයුත්තක් බවට පත් කිරීමයි. සමාජවාදය විසින් ඒ සඳහා පළමු පියවර තබනු ලැබිණි. ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන, ළදරු පාසැල්, පොදු ආපන ශාලා සමාජවාදය විසින් ගොඩනගන ලදී. සෞඛ්‍ය පහසුකම් සහ අධ්‍යාපන පහසුකම් රජයේ වගකීමක් ලෙස නොමිලයේ සැපයිණි. එවන් වටපිටාවක් තුළ කාන්තාවන්ට පිරිමින් හා සමානව අනෙකුත් රැකියාවන්හි නිරත වීමට ඉඩකඩ විවර විය.

| ක්ෂේත්‍රය | කාන්තා සහභාගිත්වය (%) |
|---|---|
| 1.ජාතික ආර්ථිකය තුළ | 33.4 |
| 2.මහා පරිමාණ කර්මාන්ත තුළ | 38.3 |
| 3.ගොඩනැගීමේ ක්ෂේත්‍රය | 19.7 |
| 4.ප්‍රවාහන ක්ෂේත්‍රය | 16.6 |
| 5.වෙළෙඳ හා මහජන කටයුතු | 39.4 |
| 6.අධ්‍යාපන/ සෞඛ්‍යය/ පරිපාලන | 48.8 |
| 7.කෘෂි කර්මාන්තය | 27 |

1935 වසරේ දී සමාජවාදී රුසියාවේ එක් එක් රැකියා ක්ෂේත්‍රය සඳහා කාන්තා සහභාගිත්වය පහත සඳහන් අයුරින් විය.

කියුබාවේ රාජ්‍ය සේවයේ නියුතු අයගෙන් 48%ක් කාන්තාවන්ය. පරිපාලන ක්ෂේත්‍රයේ රැකියාවන්ගෙන් 48%ක් කාන්තාවන් විසින් සිදු කරනු ලබයි. නීති ක්ෂේත්‍රයේ රැකියාවන්හි නියුතු අයගෙන් 80%ක්ම කාන්තාවන්ය. විප්ලවයට පෙර කියුබාවේ ඉංජිනේරුවරියන් සිටියේ 5%කි. දැන් එය 24% දක්වා වර්ධනය වී තිබේ. එක්සත් ජනපදයේ ඉංජිනේරු ක්ෂේත්‍රයේ රැකියාවන්හි නියුතු අයගෙන් කාන්තා ප්‍රතිශතය 11%ක් පමණි.

මීට අමතරව සමාජවාදය විසින් සමාන වැඩට සමාන වැටුප් ගෙවීම තහවුරු කරන ලදී. එසේ ම අනතුරුදායක රැකියාවලින් කාන්තාව හැකි සෑම විටම මුදවනු ලැබිණි.

**විවාහය, පවුල හා කාන්තාව**

විවාහය තුළදී කාන්තාවට මුහුණ පෑමට සිදු වූ අසමාන හා පීඩාකාරී තත්වයන්ද සමාජවාදය විසින් තීරණාත්මක වෙනසකට ලක් කරනු ලැබිණි. විවාහය හුදු පුරුෂාධිපත්‍යයේ ප්‍රකාශනයක් නොව දෙපාර්ශවයේ කැමැත්ත මත සිදු කිරීමටත් දැවැද්ද අහෝසි කිරීමටත් පියවර ගැනුණි. දික්කසාද වීමේ අයිතිය පිරිමියාට පමණක් නොව කාන්තාවන්ටද හිමි විය. ධනවාදයේදී පවුලේ දේපළ පිරිමියා සතු වුවද සමාජවාදය තුළදී එය දෙදෙනාටම පොදු දෙයක් බවට පත්කෙරිණි. වෙන්ව යාමේදී තම තමන්ගේ දේපළ තම තමන්ට හිමි විය. පවුල හැර යන්නා විසින් දරුවන්ගේ නඩත්තුව වෙනුවෙන් වන්දි ගෙවිය යුතු විය. එවන් පවුල් වෙනුවෙන් සමාජවාදය තුළ දී සමාජ ආරක්ෂණ වැඩපිළිවෙලක් තිබුණද වන්දි ගෙවීම අනිවාර්යය විය.

දික්කසාදයට ඉඩ දුන් පමණින් ධනවාදයේදී මෙන් සමාජවාදයේදී පවුල නැමැති ඒකකය කිසිදු වැදගැම්මකට නැති දෙයක් සේ සැලකීමට ඉඩ නොතබන ලදී. යහපත් පවුල් ජීවිතයක් ගත කිරීමටත් යහපත් පවුල් වටපිටාවකදී දරුවන් ඇති දැඩි කිරීමටත් දිරිගන්වනු ලැබිණි.

ගබ්සාව නිත්‍යානුකූල කළ පළමු රට වන්නේ සමාජවාදී සෝවියට් දේශයයි. විප්ලවයට පෙර කියුබාව තුළ ගබ්සාව නිතිවිරෝධී නොවුණි. එහෙත් එය මිල අධික විය. මේ නිසා සාමාන්‍ය කියුබන් කාන්තාන්වට ගබ්සාව සිදු කර ගැනීමට සිදු වූයේ අනතුරුදායක තත්වයන් යටතේය. සෞඛ්‍යාරක්ෂිත නොවන නුපුහුණු පිරිස් අඩු මුදලට ගබ්සාව සිදු කළ අතර මේ නිසා සිදු වූ මරණ ප්‍රතිශතය ඉතා විශාලය. සමාජවාදී කියුබාවේද ගබ්සාව නීතිවිරෝධී නොවේ. එහෙත් ගබ්සාව කාන්තාවගේ කැමැත්තෙන් තොරව සිදු වුවහොත්, එය මුදල් අය කරමින් සිදු කළ හොත්, නුපුහුණු පුද්ගලයන් විසින් සිදු කරනු ලැබූවොත් හෝ කියුබාවේ සෞඛ්‍යය සේවාවට අයත් නොවන ආයතනයක් තුළ සිදු කළ හොත් එය නීති විරෝධී වන්නේය. කියුබාව තුළ උපත් පාලන ඖෂධ හා උපකරණ, ගබ්සා කිරීමට අවශ්‍ය සේවාවන් රාජ්‍යය විසින් නොමිලයේ ලබා දෙන්නේ දරුවන් පිළිබඳව කාන්තාව සතු අයිතියට ගරු කරමිනි.





**අධ්‍යාපන අවස්ථා හා කාන්තාව**

සමාජවාදය තුළදී රටේ සියලු ජනතාවට භේදයකින් තොරව අධ්‍යාපන පහසුකම් සමාන ලෙස ලබා දෙයි. එහි උපරිම වාසිය ලබා ගන්නේ කාන්තාවයි. උදාහරණයක් ලෙස කියුබාවේ සරසවි සිසුන් අතරින් 80%ක්ම කාන්තාවන්ය. එහෙත් එක්සත් ජනපදයේ සරසවි සිසුන් අතරින් කාන්තාවන් සිටින්නේ 57%ක් පමණි. කියුබාවේ උපාධිධාරීන් අතරින් 68%ක් කාන්තාවන් වන අතර එක්සත් ජනපදයේ එය 57%කි. විද්‍යා පර්යේෂණ ක්ෂේත්‍රයේ නිරත වූවන් අතරින් 50%ක් කාන්තාවෝ වෙති. උසස් පුහුණු තාක්ෂණ ශිල්පීන් හා වෘත්තිකයන් අතරින් 66%ක්ම කාන්තාවන්ය.

**ක්‍රීඩාව හා කාන්තාව**

සමාජවාදය විසින් කාන්තාව පිරිමින් සේම සෑම ක්ෂේත්‍රයකම ජයග්‍රාහකයන් බවට පත් කරනු ලැබීය. විශේෂයෙන් ක්‍රීඩා ක්ෂේත්‍රයේදී, කාන්තාව සිටියේ ඉතාම පසුගාමී මට්ටමකය. සෝවියට් දේශය තුළ 1935 පමණ වෙද්දී කාන්තාවද ක්‍රීඩා ක්ෂේත්‍රයේ සැලකිය යුතු සහභාගිත්වයක් පෙන්නුම් කළේය. විප්ලවයට පෙර ඉතාම පසුගාමී තත්ත්වයක සිටි කාන්තාව 1935 පමණ වෙද්දී ක්‍රීඩා ක්ෂේත්‍රයට කැඳවා ජාත්‍යන්තර වාර්තා හිමිකර ගත් කාන්තාවන් 03 දෙනෙකු බිහිකිරීමට සමාජවාදී සෝවියට් දේශයට හැකි විය. එනම් මීටර් 300/400/500 සඳහා ජාත්‍යන්තර වාර්තා හිමිකර ගත් බුයිකෝවා, හෙල්ල විසි කිරීම සඳහා වාර්තා තැබූ මැස්ලෝවා සහ හිම මත ලිස්සා යාම සඟා ලෝක වාර්තාව තැබූ කැස්නෙට්සෝවා යන අයයි.

සෝවියට් දේශය පළමු වරට ඔලිම්පික් උළෙලකට සහභාගි වන්නේ 1952දීය. එතැන් සිට 1988 දක්වා පැවති ඔලිම්පික් උළෙල අතරින් එක් උළෙලකට හැර අනෙකුත් සියලුම උළෙලයන්ට එරට සහභාගි විය. මෙම කාලය තුළ සෝවියට් දේශය ජිම්නාස්ටික් ක්‍රීඩා ඉසව්ව සඳහා කාන්තාවන් 41 දෙනෙකු ඉදිරිපත් කළ අතර ඔවුහු සෝවියට් දේශයට පදක්කම් 88ක් දිනා දුන්හ.

15 වැනි පිටුවට

> මිනිස් ඉතිහාසය තුළ ලොව කිසියම් හෝ රාජ්‍යයක් කාන්තා නිදහස වෙනුවෙන්, කාන්තා විමුක්තිය වෙනුවෙන් සංවිධිත වැඩපිළිවෙළක් ප්‍රකාශයට පත් කළා නම් හා ක්‍රියාත්මක කළා නම් එය ප්‍රථම වරට සිදු කරනු ලැබුවේ සමාජවාදී රුසියාව විසිනි. ඒ දක්වා අනෙකුත් සියලුම කාන්තා සංවිධාන සටන් වැද තිබුණේ කාන්තාවන්ට වැඩි දේශපාලන අයිතිවාසිකම් දිනා ගැනීම වෙනුවෙන් පමණකි. සමාජවාදය කාන්තාවගේ සැබෑ නිදහස දිනා ගැනීම වෙනුවෙන් ඉතිහාසයේ ප්‍රථම වතාවට ප්‍රායෝගිකව මැදිහත් විය.



"එබඳු අලුත්, දුෂ්කර සහ ශ්‍රේෂ්ඨ කටයුත්තකදී අඩුපාඩුකම්, දුර්වලකම්, වැරදීම් සිදුවීම වැළැක්විය හැකි නොවේ. සමාජවාදය ගොඩනැගීමේ දුෂ්කරතාවයන්ට බිය වන අය, ඒවායින් තමන් බිය වැදීමට ඉඩ තබන අය, බලාපොරොත්තු සුන් කර ගන්නා සහ බියගුළු ලෙස විමති වන අය, සමාජවාදීහු නොවෙති.''

**ලෙනින්**
**තෝරාගත් කෘති, 10වැනි වෙළුම, 129 පිටුව**

# ඒ මේ අතට විකිණෙන මන්ත්‍රීවරියන්

දැන ගියොත් කතරගම, නොදැන ගියොත් අතරමග යන්න සනාථ කෙරෙන සිදුවීම් මේ දිනවල අපට දිගින් දිගට විවිධ මාධ්‍ය හරහා ඇසේ. පසුගිය පළාත් පාලන මැතිවරණයේදී කාන්තාවන් ලෙස අප ගත් තීන්දු තීරණවල ප්‍රතිඵල දැන් පෙනෙන්නට පටන් ගෙන තිබේ. එළිපත්තේ ඉන්න බළලුන් මෙන් ඒ අතට මේ අතට විකිණෙමින් තුට්ටුවට දෙකට වැටෙන මන්ත්‍රීවරුන් හා මන්ත්‍රීවරියන් තෝරා පත්කර යැවූ ජනතාව නැවතත් සුපුරුදු පරිදි අතරමංව කරකියා ගත නොහැකි තත්වයකට පත්ව ඇත.

ලිපිය ලියන මේ මොහොත වනවිට පළාත් පාලන ආයතනවල බලය ලබා ගැනීම සඳහා ජන්ද විමසීම් පැවැත්වෙමින් තිබේ. බහුතරයක් ආයතනවල තනි පක්ෂයකට බලය ලැබී නොමැති බැවින් නිලතල තෝරා ගැනීමේදී වෙනත් පක්ෂ හා කණ්ඩායම්වල සහාය ලබා ගැනීමට සිදුව ඇත. එනිසා නියෝජිත මහත්වරුන්, මහත්මියන් මේ දිනවල මුදලට අලෙවි වෙමින් ඇති බව ප්‍රසිද්ධ රහසකි.

''මහින්ද පිලේ මන්ත්‍රීවරිය ලක්ෂ 2කට එජාපයට විකිණෙයි'', එජාපයේ මන්ත්‍රීවරිය අල්ලස් ලබාගෙන සභාවට නොපැමිණෙයි'' මේ පසුගිය 28 වන දින මන්ත්‍රීවරියන් සම්බන්ධයෙන් පළ වූ පුවත් දෙකකි. එක් මන්ත්‍රීවරියක් මේ වනවිට තමන් මුදල් ලබාගත් බව මාධ්‍ය ඉදිරියේ පිළිගෙනද තිබේ. ඉදිරි සති කිහිපය තුළ මෙවැනි පුවත් තව තවත් අසන්නට දකින්නට හැකි වනු ඇත. ඉන් නොනැවතී තීරණාත්මක අවස්ථාවලදීද මෙලෙසම ඔවුන්ට මිලක් නියම වනු ඇත. වැඩිම මිලක් ලබාදෙන ධනපති පක්ෂයට ඔවුන්ගේ අත් එසවෙනු ඇත.



පුද්ගල ප්‍රතිරූප වන්දනාමානය කෙතරම්ද කිවහොත් එක්තරා දේශපාලනඥයෙක් ප්‍රකාශ කර සිටියේ යම් පුද්ගලයකු විසින් පොල් ලෙල්ලක් ඉදිරිපත් කළද ජනතාව ජන්දය ලබාදෙන බවය. ඒ ලංකාවේ ජන්දදායකයා විශේෂයෙන් කාන්තා ජන්දදායිකාවන් හැසිරෙන ආකාරය ගැන කියාපෑමකි. තමාගේ ජන්දයෙන් පත්වන්නේ ඊට සුදුසු පුද්ගලයන්ද, ඔවුන් කරන්නේ මොනවාද යන්න පිළිබඳව බහුතරයක් කාන්තාවන්ට වගේ වගක් නැත. අවසානයේ සිදුවන්නේ උන්මාදයෙන් වැළඳ ගත් පුද්ගල ප්‍රතිරූපවලට අනුව කටයුතු කිරීමය.

එලෙස කටයුතු කිරීම තුළ 25%ක කාන්තා නියෝජනයටද වැඩි වශයෙන් පත්ව ඇත්තේ කිසිදු දේශපාලන ක්‍රියාකාරිත්වයක නොයෙදුනු කාන්තාවන්ය. ඊට සුදුසු, කුසලතාවක් සහිත කාන්තාවන් පත් කර යැවීම වෙනුවට සිදුව ඇත්තේ 25% ඔළු ගෙඩි ගණනින් පමණක් පූර්ණ වීමය. වෙනත් අයගේ බලපෑමට ලක් වී දුර දිග නොබලා කටයුතු කිරීමෙන් බහුතරයක් කාන්තාවන් පොල් ලෙලි ගණනට වැටුණා සේම අද දවසේ ධනපති දේශපාලන පක්ෂවලින් පත් වූ නියෝජිතවරියන්ට සිදුව ඇත්තේද එයමය.

51%ක කාන්තාවන් නියෝජනය කරමින් යවනු ලැබූ මෙවැනි කාන්තා මන්ත්‍රීවරියන් යම් සාධනීය කාර්ය භාරයක් ඉටු කරාවි යැයි අපේක්ෂා කළ නොහැකිය. යම් ප්‍රතිපත්තියක් මත පිහිටා තීන්දු තීරණ නොගෙන, පුද්ගල සාධක මත, භෞතික වරප්‍රසාද මත, ස්වාර්ථකාමය මත තම දේශපාලනය දෝලනය වන්නට ඉඩ හරින කුමන හෝ පක්ෂයක දේශපාලනඥයන් ගෙන් සමාජයට රටට යහපතක් බලාපොරොත්තු විය නොහැක. අද දවසේ සහ හෙට දවසේදීද විද්‍යාමාන වන්නේ ජන්දය පාවිච්චි කිරීමේදී දුර දිග නොබලා අඳ බාලයින් සේ කටයුතු කිරීමේ ප්‍රතිවිපාකය. ප්‍රතිපත්ති මත නොසිට තීන්දු තීරණ ගැනීමේ ප්‍රතිවිපාකය.




හිරු ගිනි ගනියි
බක් මහ මඟ ලකුණු තියා
එරබඳු පිපෙයි
ගම්දොර රතු තිලක තියා
කොවුලන් ඇවිත් දුක්බර
විරු ගීත ගයා
හදවත දවයි
සුසුමක් උණුසුමට දරා...

මහී මව් බරට
ලද ගැරහුම් තුටිනී
දනී විදගත්ත බව
මව්බිම නමිනී
වරා සැපත
දුක වැළඳූ සොහොයුරනී
නුඹේ නමට
කවදත් රතු මල් පිපුණී...

මගෙ මව්බිමට
පින් මදි වුණ රැකගන්න
නුඹ, උත්තමය
මතු උපදින පරපුරට
රතු ලේ දරන
ඒ පරපුර, හෙට රටට
වටහා දෙනු සැකක් නෑ
නුඹ ගැන සබඳ...



## සිව්දෙසින්

### පිළිකා රෝගී කාන්තාවන්ගෙන් වැඩි දෙනෙකු පියයුරු පිළිකාවලට ගොදුරුවූවන්...

පිළිකා වැළඳුනු කාන්තාවන්ගෙන් වැඩි දෙනෙකු පියයුරු පිළිකා රෝගීන් බව ලෝක සෞඛ්‍ය සංවිධානය පවසයි.

එම රෝගී තත්වය සංවර්ධනය වෙමින් පවතින රටවල මෙන්ම සංවර්ධිත රටවලද පොදුවේ දැකිය හැකි බව එම සංවිධානය වැඩිදුරටත් පවසයි.

2011 වසරේදී ලොව පුරා කාන්තාවන් 508 000ක් පියයුරු පිළිකා හේතුවෙන් මරණයට පත්ව ඇති බව පැවසේ. ලෝක සෞඛ්‍ය සංවිධානයේ වාර්තාවන්ට අනුව ශ්‍රී ලංකාව තුළ 2014 වසරේදී පිළිකා හේතුවෙන් මරණයට පත්ව ඇති කාන්තාවන් ගණන 7 200කි. ඉන් 18.8%ක් පියයුරු පිළිකා රෝගීන්ය.

ශ්‍රී ලංකාව තුළ පුරුෂයන් 50 දෙනෙකු පමණ වාර්ෂිකව පියයුරු පිළිකාවලට ගොදුරුවන බව පිළිකා රෝග පිළිබඳ විශේෂඥ වෛද්‍ය මහේන්ද්‍ර පෙරේරා පවසා ඇත.

පූර්ව රෝග ලක්ෂණ හඳුනාගැනීමේ වැඩසටහන් මදකම පියයුරු පිළිකාවක් වැළඳී දිවි බේරා ගැනීමේ හැකියාව අවම වීම කෙරෙහි බලපාන ප්‍රධාන හේතුවක් බව ලෝක සෞඛ්‍ය සංවිධානය පෙන්වා දෙයි.



### කාන්තාවන්ගේ ඇඳුම තීරණය කරන පොතක්...

කාන්තාවක් ඇඳිය යුතු හා ඇඳිය නොයුතු ඇඳුම් ඇතුළත් පොතක් තජිකිස්ථාන් ආණ්ඩුව එළිදක්වා ඇත.

එරට සංස්කෘතික අමාත්‍යාංශයෙන් එළිදක්වා ඇති එම පොතේ අවුරුදු 7 සිට 70 දක්වා කාන්තාවන්ට සුදුසු යැයි හැඟෙන ඇඳුම්වලින් සැරසුන නිරූපිකාවන්ගේ ඡායාරූප ඇතුළත් කර ඇත.

රැකියාවට යන විට, ජාතික හා රාජ්‍ය නිවාඩු දිනවලට, මංගල උත්සවවලට මෙන්ම සති අන්තයට සුදුසු ඇඳුම් පවා මෙම පොතින් නිර්දේශ කර ඇත.

තජිකිස්ථානයේ ජනගහනයෙන් වැඩි කොටසක් මුස්ලිම් ජාතිකයන් වන අතර එම පොතෙහි අවසන් පරිච්ඡේදයේ තජික් කාන්තාවන්ට ඇඳීමට නොසුදුසු ඇඳුම් පිළිබඳව සඳහන් කර ඇත. කළු පැහැති ඇඳුම්, හිස් ආවරණ සහ හිජාබය නොසුදුසු ඇඳුම් ලෙස වර්ග කර ඇත.

තවද බටහිර සම්ප්‍රදායේ ඇඳුම්, කෙටි සාය, පපුව නිරාවරණය වන ඇඳුම් සහ පිට පෙනෙන ගවුම් ඇඳීම එම පොතට අනුව නුසුදුසුය.

දැනුම, සමාජය හා චින්තනය 26

# ජාතිවාදය ගැන සමාජ විද්‍යාත්මක කියවීමක්

මානව වර්ගයා දැන් දිවි ගෙවන්නේ, 21වැනි සියවසේ දෙවැනි දශකයේ අග භාගයේය. මිනිසා 21වැනි සියවසට පා තැබුවේ විද්‍යාවේ හා තාක්ෂණයේ මහා දියුණුවක් හා දැනුමක් සහිතව ඒ පිළිබඳ පුරසාරම්ද දොඩමිනි. මෙයට වසර ලක්ෂයකට පමණ පෙර මුගුරක් අතින්ගෙන සිටි නිරුවත් මානවයා මේ වන විට විද්‍යාවේ හා තාක්ෂණයේ මහා ප්‍රාතිහාර්ය පෙන්වමින් සිටී. ඔහු ඉර හඳ තාරකා ගවේෂණය කරමින් අභ්‍යවකාශයේ සැරිසරමින් සිටී. මිනිස් සිරුරේ ඕනෑම ඉන්ද්‍රියක් (හදවත පවා) බද්ධ කිරීමට ඔහු දැන් සමත්ය. අවකාශයේ පවතින විවිධ විද්‍යුත් තරංග සොයාගත් ඔහු ඒවා මගින් අභ්‍යවකාශයට පවා හඬ හා රූප සම්ප්‍රේෂණය කරමින් සිටී. ඔහු තමන්ගේ උපත සිදුවූ ආකාරය හෙවත් පරිණාමවාදය පමණක් නොව විශ්වයේ උපත පවා සොයාගෙන උගෙන ගෙන ඇත. සිය දැනුම මගින් ලොව සියලු රහස් හෙළිකර ගැනීමට හේ සමත්ව සිටී. එහෙත් ඔහු 21වැනි සියවසේදී පවා විටෙක මිලේච්ඡයෙකු සේ ක්‍රියාකරයි. ඒ ඇයි?



### වාර්ගික හා ආගමික උමතුව

ලොව පුරා මිනිස්සු තම වර්ගය නිසා, ජාතිය නිසා, ආගම නිසා, ගෝත්‍රය නිසා එකිනෙකා මරා ගනිමින් සිටිති. අප්‍රිකානු රටක්වූ රුවන්ඩාවේ මෙයට වසර කිහිපයකට පෙර, හුටු හා ටුට්සි නැමති ගෝත්‍ර දෙක අතර වූ ගෝත්‍රවාදී සටන්වලින් විශාල ප්‍රමාණයක් මියගිය අතර දස දහස් ගණනක් අනාථ විය. එය ගෝත්‍රික සටන් පිළිබඳ මෑතදී දුටු ඛේදජනකම උදාහරණය වේ. එසේම යුගෝස්ලාවියාව බිඳවැටීමත් සමග බොස්නියාව තුළ ජාතිවාදී ගැටුම් ඇවිළී ගිය අතර සර්බියානුවෝ මුස්ලිම්වරුන් මරා දමමින් ස්ත්‍රීන් දූෂණය කරමින් මහා සංහාරයක් සිදුකළෝය. එය නම් කෙරුණේ 'වාර්ගික පවිත්‍රකරණය' ලෙසය. මැදපෙරදිග ඉස්ලාම් ආගමේ පාර්ශව දෙකක් වන ෂියා හා සුන්නිවරු දශක ගණනාවක් තිස්සේ එකිනෙකා මරා ගනිමින් සිටිති. 1980 දශකයේ පැවති ඉරාන - ඉරාක දස අවුරුදු යුද්ධය පිටුපසද වූයේ මෙම ගැටුමය.

අපේ පෘථිවියේ ජීවත්වන සතුන් අතර බුද්ධිමත් හා තාර්කික හැකියාවක් ඇති සත්වයා වන මිනිසා, මිලේච්ඡත්වය පසුකර සභ්‍යත්වයට පා තැබුයේ යයි තුඹුම ආඩම්බර වන මිනිසා, සිය දැනුම උපයෝගී කරගෙන මිනිසා ගැනම හැදෑරීම සඳහා මානව විද්‍යාව, සමාජ විද්‍යාව, ජෛව විද්‍යාව වැනි විද්‍යාවන් බිහිකර ඒවා තම දරුවන්ට උගන්වන මිනිසා ඒ අතරම මිලේච්ඡයකුසේ ආගමික අන්තවාදය මුල්කරගෙන එකිනෙකා මරාගන්නේ ඇයි? ජාතිවාදය හෝ වර්ගවාදය හේතුකරගෙන එකිනෙකා මරාගන්නේ ඇයි? සියලු දේ විද්‍යාත්මකව තර්කානුකූලව අධ්‍යයනය කරන මිනිසාම ජාතිය හා ආගම පිළිබඳ ප්‍රශ්නවලදී අන්තවාදී ලෙස හැසිරෙමින් මිනිසුන් ඝාතනය කරමින්, දේපළ ගිනි තබමින් මානව වර්ගයාට නිගාදෙන ලෙස හැසිරෙන්නේ ඇයි? මෙය අප අධ්‍යයනය කළ යුතු වටහා ගත යුතු අත්‍යාවශ්‍ය කරුණකි.

### ආගමික හා ජාතිවාදී ගැටුම් අහම්බයන්ද?

ලොව කොතනක හෝ ජාතිවාදී ගැටුමක්, ආගමික අන්තවාදී ගැටුමක් ඇති වුවහොත් ඊට පාදක වූයේයයි කවුරුත් දන්නා කවුරුත් කතාකරන 'හේතුවක්'ද තිබේ. එම 'හේතුව' දෙස බලන විට සිදුවූ ගැටුම හුදු 'අහම්බයක්' ලෙස පෙනියාමටද ඉඩ තිබේ. සැබැවින්ම මෙම ජාතිවාදී, ආගමික අන්තවාදී ගැටුම් අහම්බයන්ද? නැතිනම් සරල හේතුවක් මත සිදුවන දෙයක්ද? නැත. මේවා අහම්බ නොවන අතර කවුරුත් පවසන 'හේතුව' සැබෑ හේතුවද නොවේ. එය 'ආසන්න සිදුවීම' වේ. මේ සඳහා හොඳම උදාහරණය පසුගියදා මහනුවර 'ගිනිගත්' ගැටුමේ 'හේතුව' දෙස බැලීමෙන් වටහා ගත හැක.

මහනුවර දිගන ප්‍රදේශයේ මුස්ලිම් වෙළඳසැල්, නිවාස ආදිය ගිනිබත් කරමින් ඇවිළුණු ජාතිවාදී ගැටුමට 'හේතුව' ලෙස ප්‍රකාශ වූයේ, ඊට දින කීපයකට පෙර තරුණයන් පිරිසක් විසින් පහරදෙනු ලැබීමෙන් රියදුරෙක් මිය යාමය. මෙහි විශේෂය වූයේ පහරදුන් තරුණයන් 'මුස්ලිම්' වීමත් මියගිය පුද්ගලයා 'සිංහල' වීමත්ය. මෙය හුදු රියදුරෙකුට පහරදී මරා දැමීමට එරෙහිව පැන නැගී ගැටුමක් නොවේ. මන්ද එම දිනවලම හලාවත ප්‍රදේශයේ පුද්ගලයෙකු ළමයකු පැහැරගෙන ගොස් අපහරණය කර මරා දැමූ පුවතක් ද වාර්තා විය. අදාළ පුද්ගලයා අත්අඩංගුවටද ගන්නා ලදී. සංවේදීකම අතින් ගත්විට වඩාත් සංවේදී සිදුවීම නුවර තෙල්දෙනියේ පහරදීමෙන් රියදුරා මියයාම නොව හලාවත ළමයා පැහැරගෙන ගොස් අතවර කර මරා දැමීමය. එහෙත් මහනුවර 'ඝාතනයට' එරෙහිව ක්‍රියාත්මක වූ මහසොහොන් බලකායද ඇතුළු ජාතිවාදී බලකායවල්වල හදවත් හලාවත සිදුවීම අරභයා උණු වූයේ නැත. ඒ මියගිය ළමයා මෙන්ම ළමයා ඝාතනය කළ පුද්ගලයාද 'සිංහල' වීමය. අපේ රටේ මිනිස් ඝාතන, රිය අනතුරු, පැහැරගෙන යාම්, ස්ත්‍රී දූෂණ ළමා අපචාර නිතර සිදුවේ. එහෙත් එම සිදුවීම්වලදී මනුෂ්‍යත්වය නිහඬය; ගොළුය; බිහිරිය. එහෙත් එම කිසියම් සිදුවීමක පාර්ශව දෙක ආගම් දෙකක නම් ජාතිකත්ව දෙකක නම් රටක් ගිනි තැබීමට එය ප්‍රමාණවත්ය. එබැවින් ජාතිවාදී ආගම්වාදී ගැටුම් පිටුපස පෙන්වන බොරු හේතුව වෙනුවට සැබෑ හේතු සොයා ඉගෙන ගැනීම ජනතාවන් අතර සාමය සංහිඳියාව ප්‍රාර්ථනා කරන කාටත් හොඳය.

"අපේ රටේ මිනිස් ඝාතන, රිය අනතුරු, පැහැරගෙන යාම්, ස්ත්‍රී දූෂණ ළමා අපචාර නිතර සිදුවේ. එහෙත් එම සිදුවීම්වලදී මනුෂ්‍යත්වය නිහඬය; ගොළුය; බිහිරිය. එහෙත් එම කිසියම් සිදුවීමක පාර්ශව දෙක ආගම් දෙකක නම් ජාතිකත්ව දෙකක නම් රටක් ගිනි තැබීමට එය ප්‍රමාණවත්ය. එබැවින් ජාතිවාදී ආගම්වාදී ගැටුම් පිටුපස පෙන්වන බොරු හේතුව වෙනුවට සැබෑ හේතු සොයා ඉගෙන ගැනීම ජනතාවන් අතර සාමය සංහිඳියාව ප්‍රාර්ථනා කරන කාටත් හොඳය."

### ප්‍රමාණය ගුණය බවට පත්වීම

මාක්ස්වාදයට අනුව ප්‍රකෘතිය හා සමාජය තේරුම් ගැනීමේ පොදු ආකාර අතර එකකි, 'ප්‍රමාණාත්මක වෙනස්කම් ගුණාත්මක පරිවර්තන බවට පත්වීම' නැමැති න්‍යාය. ඉන් කියවෙන්නේ ඕනෑම ඵලයක් යනු හදිසි, අහම්බයක් නොව ප්‍රමාණාත්මක වර්ධනය වෙමින් තිබූ දෙයක් එහි එක් අවස්ථාවක ගුණාත්මක වෙනසකට භාජනය වීමක් වන බවත් ඊට කිසියම් ආසන්න සිදුවීමක් පාදක විය හැකි බවත්ය. මෙය භෞතික උදාහරණ කිහිපයකින් පැහැදිලි කර ගැනීම පහසුය. ජලය යනු ද්‍රවයකි. ජලයට තාපය ලබා දුන් විට එය රත්වීමට පටන්ගෙන ප්‍රමාණාත්මකව (ටිකෙන් ටික) රත්වේ. මෙම තාපය ලබාදීම අඛණ්ඩව සිදු කළ හොත් එහි එක් අවස්ථාවකදී එනම් සෙන්ටිග්‍රේඩ් අංශක 100දී ජලය වෙනස් ගුණයක් වූ වාෂ්ප (වායු) බවට පත්වේ. 'ජලය' 'වාෂ්ප' වන්නේ එකවිට නොව ප්‍රමාණාත්මකව සිදුවූ වෙනස්කම් (රත්වීම) ගුණාත්මක තැනකට පැමිණීම නිසාය. එයට ආසන්න හේතුවක් තිබුණත් නැතත් ජලය සෙන්ටිග්‍රේඩ් අංශක 100 දක්වා රත්කළ හොත් වාෂ්ප වේ. මේ සඳහා තවත් උදාහරණයක් ලෙස බැලුමක් ගෙන බලමු. බැලුමකට දැරිය හැකි වායු පීඩන ප්‍රමාණයක් තිබේ. බැලුමකට ක්‍රමානුකූලව (ප්‍රමාණාත්මකව) වායුව ඇතුල් කළ විට එය ටිකෙන් ටික පිම්බේ. එලෙස පිම්බෙන බැලුම පුපුරා යාමේ තත්වයට ළඟාවෙන තෙක් වායුව ඇතුල් කළ විට ගුණාත්මක පරිවර්තනයක් ලෙස බැලුම පුපුරා යයි. එම අවස්ථාවේදී ඉදිකටු තුඩක් හෝ කටුවක් වැදීම බැලුමේ පුපුරා යාමට අවශ්‍ය උදව්වක් සැපයේ. එහෙත් ඉන් තේරුම් ගත යුතු වන්නේ 'බැලුම' පුපුරා ගියේ ඉදිකටුව නිසා නොවන බවයි. බැලුමට වායුව පුරවා නොතිබුණේ නම් 'ඉදිකටු තුඩක්' නිසා එය පුපුරා යන්නේ නැත. ජාතිවාදය හා ආගමික අන්තවාදයද එසේය. ඒවා පුපුරා යන්නේ, කාලයක් තිස්සේ සමාජය තුළ ජාතිවාදී හා ආගමික අන්තවාදී මත පතුරුවා මිනිස් ඔළු කුහර තුළ ඒවා පුපුරා යන මට්ටම දක්වා ගෙන ආ විටය. එවිට මිනිස් ඝාතනයක් නොව 'ඇගේ හැපීමක් වුව' ඊට ප්‍රමාණවත්ය.

### ජාතිවාදය හා මානව චින්තනය

ජාතිවාදය, වර්ගවාදය, කුලවාදය, ආගමික අන්තවාදය වැනි මනෝභාවයක් පවතින්නේ, මිනිසුන්ගේ චින්තනය තුළය. මිනිසුන් එම මනෝභාවයන්ගෙන් උමතුවට පත්කිරීමට පුළුවන. එම මනෝභාවයන් පිළිබඳ ප්‍රශ්නයේදී මිනිසුන්ගේ දැනුම, උගත්කම ආදිය අදාළ වන්නේ නැත. තර්කන ක්‍රම අදාළ වන්නේද නැත. අතාර්කිකවම හා අන්ධ ලෙස මිනිසා එම මනෝභාවයන් තුළ කටයුතු කරයි. මෙවැනි මනෝභාවයන් අද දක්වාම මිනිස් චින්තනය තුළ පවතින්නේ ඇයි? මිනිසා එම මනෝභාවයන්ට වඩාත් සංවේදී වන්නේ ඇයි? එම කරුණ අප අධ්‍යයනය කළ යුතු කරුණු වේ. එසේම මිනිස් චින්තනය තුළට ජාතිවාදී හා ආගමික අන්තවාදී විෂ එන්නත් කරන්නේ කවුද? ඔවුන් එය එසේ කරන්නේ ඇයි? යන කරුණුද අප අධ්‍යයනය කළ යුතුය. එය උඩින් පල්ලෙන් නොව ඓතිහාසිකවත් විෂය මූලිකවත් පවත්නා තත්වයන්ගේ අන්තර් සම්බන්ධය තුළින් තබා විමසා බැලිය යුතුය. ඒ සඳහා ආරම්භයක් හෝ ගත යුතුය. සංවාදයක් ඇරඹිය යුතුය. එම සංවාදය ගොඩනැගීම වෙනුවෙන් ලිපි මාලාවක් මගින් අපි මුණගැසෙමු.



"මාධ්‍ය මගින් කරන්නේ බොරු කියන එක පමණක් නොවේ. සාවද්‍ය පරාවර්තනයන් ඇති කිරීමයි. බොරුව හා සාවද්‍ය පරාවර්තනයන් යනු වර්ග දෙකක්. බොරුව දැනුම මත සෘණාත්මක බලපෑමක් ඇති කරනවා. සාවද්‍ය පරාවර්තනයන් චින්තනය මත සෘණාත්මක බලපෑමක් ඇති කරනවා. එය තොරතුරු වසන්කිරීමට හෝ විකෘති කිරීමට සමාන නැහැ. එමගින් සිදුවන්නේ සිතීමට ඇති හැකියාව මොට කිරීමයි."

**ෆිදෙල් කස්ත්‍රෝ**
**'මගේ ජීවිතය' කෘතියෙන්**

# 71 අරගලය: කැප කිරීමේ සහ පරිත්‍යාගයේ සදාතනික ආදර්ශය



මිනිස්සු ජීවිතයට ආශා කරති. එම ආශාව නිසාම ජීවිතය පවත්වා ගෙන යන්නට බොහෝ දේ කරති. එවා බොහෝමයක් කේන්ද්‍රගත වන්නේ තම පෞද්ගලික අපේක්ෂා, බලාපොරොත්තු ඉලක්ක ආදිය සපුරා ගැනීමට බව ඉතා පැහැදිලිය. එම නිසාම බොහෝ මිනිස්සු නිරතුරුවම අනෙකා අභිබවා යාමේ තරඟකාරිත්වයකට යොමු වී සිටිති. ඒ තුළ ඇත්තේ ආත්මාර්ථකාමී පෞද්ගලිකත්වය ඉස්මතුවීමක් මිස අන් යමක් නොවේ. එහෙත් පෞද්ගලිකත්වය වෙනුවට පොදු බවත් ආත්මාර්ථය වෙනුවට පරාර්ථයත් එකම අරමුණ කරගනිමින් යමෙකු කටයුතු කරන්නේද තමන්ගේ එම කාර්ය පිළිබඳව කිසිදු විටක පසුතැවීමක් කම්පාවක් හෝ බලපොරොත්තු අතහැර ගැනීමක් සිදු නොකොට තම කාර්ය ජයග්‍රහණය කරවීම සඳහා සෑම විටම හැකි උපරිමයෙන් කටයුතු කරන්නේද ඔහු හෝ ඇය සාමාන්‍ය ව්‍යවහාරයට අනුව විශිෂ්ටයෙකු වනු ඇත. එසේම මෙකී පොදු බව වෙනුවෙන් යමෙකු තම ජීවිතය පරිත්‍යාග කරන්නේද ඔහු හෝ ඇය ඒකාන්ත වශයෙන්ම ශ්‍රේෂ්ඨයෙකු වනු ඇත. 71 අරගලයත් අරගලය තුළ ක්‍රියාකාරී වූ පිරිසත් ඒ වෙනුවෙන් ජීවිත පරිත්‍යාග කළ දස දහසක් පමණ වන සහෝදර සහෝදරියනුත් ලාංකේය දේශපාලන ඉතිහාසයේ කිසිදා නොමැකෙන මතකයන් බවට පත්වී ඇත්තේ එම නිසාය.

### අරගලයේ පසුබිම

1970 දශකය ආරම්භ වන්නේ පැවති එජාප පාලනය වෙනුවට සිරිමාවෝ බණ්ඩාරනායකගේ නායකත්වයෙන් නව පාලනයක් ස්ථාපිත වීමෙනි. එවකට ලාංකේය භූමිය තුළ ක්‍රියාත්මක වූ සම්ප්‍රදායික "වම" සිරිමාවෝ බණ්ඩාරනායක සමඟ එක්විය. ඔවුන්ට අනුව ඉතා කෙටි කලකින් ලාංකේය භූමිය තුළ සෞභාග්‍යය උදා වනු ඇත. නමුත් කාලය ගෙවී ගියද උදාවූ සෞභාග්‍යක් නැත. ඒ වෙනුවට ජනතාවගේ ජීවත්වීමේ අයිතිය විවිධ ක්‍රම මගින් උදුරා ගන්නට විය. පැවති එක්සත් ජාතික පක්ෂය ගෙනගිය මර්දනයම, කිසිදු අඩුවකින් තොරව ඔවුන්ද ගෙන යන්නට විය. එයට එරෙහිවන්නන් හට ඔවුන්ගේ නීතිය යොදා ගනිමින් මර්දනය මුදා හරින ලදී. ප්‍රජාතන්ත්‍රවාදයේ අවම අයිතීන් වන භාෂණයේ සහ ප්‍රකාශනයේ නිදහස අහිමි කරමින් කටයුතු කරන්නට විය. ඒ අනුව අත්අඩංගුට ගැනීම් රඳවා තබා ගැනීම් මෙන්ම පහරදීම් ද සිදුකරන ලදී. ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් පෙරට එන්නට ලාංකේය සමාජයට නායකත්වයක් අවශ්‍ය විය. එම නිසාම "දණින් වැටී ජීවත්වනවාට වඩා දෙපයින් සිට මියයාම වඩා උතුම්ය" යන කියමන සනාථ කරමින් ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් මහා බලවේගයක් ක්‍රියාත්මක විය. ඔවුන්ගේ එකම අරමුණ වූයේ ධනපති ක්‍රමය පෙරළාදමා ජනතාවගේ ප්‍රජාත්නත්‍රවාදී අයිතීන් වඩාත් සුරක්ෂිත වන නව සමාජ ක්‍රමයක් ස්ථාපිත කිරීමයි. එනම් සමාජවාදය ගොඩනැගීමයි.

### අරගලයෙන් පසු

ආණ්ඩුවේ මර්දනය හමුවේ මෝදුවෙමින් තිබූ පීඩනය දවැන්ත පුපුරායාමක් ලෙස පෙරට ආ 71 අරගලය ආණ්ඩුවේ කෲර මර්දනය හමුවේ පරාජයට පත්වුවද එම අරගලය ලාංකේය සමාජයට අලුත් අත්දැකීම් රාශියක් එක්කරන ලදී. අරගලයෙන් පසු ලාංකේය දේශපාලනයේ වෙනස්කම් රාශියක් සිදුකිරීමට ධනපති පාලක පැලැන්තියට සිදුවිය. එහි එක් සංධිස්ථානයක් වන්නේ, 72 ජනරජ ව්‍යවස්ථාව සම්මත කිරීමයි. ඒ වන තෙක්ම ලංකාවේ පාලකයන් කවුරුන් වුවද ඔවුන්ගේ වගකීම තිබුනේ බ්‍රිතාන්‍ය රැජිණටය. ඒ තහවුරු වූයේ, අරගලයෙන් පසු රෝහණ සහෝදරයා ඇතුළු කණ්ඩායමට පවරන ලද නඩුවේ එක් ප්‍රධාන චෝදනාවක් ලෙස බ්‍රිතාන්‍ය මහ රැජිණගේ ආණ්ඩුව පෙරළා දැමීමට කුමන්ත්‍රණය කරන ලදැයි සඳහන් වීමෙනි. 1948 ලංකාවට දුන්නා යැයි සඳහන් කළ නිදහසේ සැබෑ නිරුවත මෙහිදී හෙළිදරව් විය. 71 අරගලය නොවන්නට තවමත් එය එසේම පවතින්නටද ඉඩ තිබුණි. එපමණක් නොව, 1975දී අක්කර 50ට අයිතිය සීමා කරමින් ඉඩම් ප්‍රතිසංස්කරණය සිදුකිරීමත් 71 අරගලය නිසාම සිදු වූවකි. ලාංකේය සමාජය තුළ පාලක පැලැන්තියේ සැබෑ තතු හෙළිදරව් කිරීමටද 71 අරගලය ඉවහල් විය. එසේම එතෙක් අවධානය යොමුකොට නොතිබූ අපේ රටේ තරුණ තරුණියන්ගේ ප්‍රශ්න පිළිබඳව අවධානය යොමු කිරීමට පාලක පැලැන්තියට බලකිරීමක්ද 71 අරගලයෙන් සිදුවිය. කලා සංස්කෘතික ක්ෂේත්‍රයේ නව විකල්ප හා වමේ දෘෂ්ටිය සහිත නිර්මාණ බිහිවීමේලාද අප්‍රේල් අරගලය කළ බලපෑම විශාලය.

### කැපකිරීමේ සහ පරිත්‍යාගයේ ආදර්ශය

71 අරගලය තුළ විශේෂතා රාශියක් ඇති අතර, එහි ප්‍රධානම දේ වන්නේ අරගලය තුළ ක්‍රියාත්මක වූ සහෝදර සහෝදරියන්ගේ කැපකිරීමත් පරිත්‍යාගයත් සහ ආදර්ශයත්ය. පෞද්ගලික අරමුණු සහ අපේක්ෂාවන්වල සිරකර සිටි මිනිසුන් වෙනුවට පොදු අරමුණු සහ අපේක්ෂාවන් වෙනුවෙන් ක්‍රියාත්මක වන මිනිසුන් රාශියක් අරගලය තුළ ක්‍රියාත්මක විය. කමල බන්දු සහෝදරයා තම සිරුර විදුලි කියතකින් දෙබෑකරන විටදීත් 'ලාංකේය විප්ලවයට ජයවේවා' යැයි පවසමින් තමන්ගේ මරණය විප්ලවයට පන්නරයක් දෙමින් එකතු කරන්නට සමත්විය. මනම්පේරි සහෝදරිය හමුදා නිලධාරීන් රාශියක් තමන් දූෂණය කර මරා දැමීමට කටයුතු කරන විටදීත් 'මම වරදක් නොකළ බව අම්මාට පවසන්න' යැයි සඳහන් කරමින් තමන්ගේ කරාබු යුගල නැගැණියට දෙන ලෙස පවසා එය ගලවා දීමට තරම් ධෛර්යයක් සහ අධිෂ්ඨානයක් තිබුණි. නොච්චියාගම රත්නායක, තෙල්දෙනියේ සිසිර වීරකෝන්, බලංගොඩදී මරා දැමූ සනී ආරියතිලක යන සහෝදරවරුද එලෙස මරණය ඉදිරියේ ධෛර්යයෙන් මුහුණ දුන් සහෝදර සහෝදරියෝ අතර ඉදිරියෙන් වූහ. එපමණක් නොව අරගලය තුළදී ජීවිත පරිත්‍යාග කළ බොහෝ සහෝදර සහෝදරියන් කිසිදු විටෙක පෞද්ගලික වරදාන වරප්‍රසාද අපේක්ෂාවෙන් කටයුතු නොකරන ලදී. ඔහුන්ගේ එකම අපේක්ෂාව වූයේ ලාංකේය සමාජයට වඩා යහපත් හෙටක් උදා කිරීමයි. ඒ වෙනුවෙන් තමන්ට කළ හැකි ඉහළම කැපකිරීම සිදුකිරීමයි. පටු පෞද්ගලිකත්වයේ ඇද බැඳ තබා සිටින බොහෝ මිනිසුන් සහ ගැහැනුන් අතර එවැනි තත්වයන්ට ඇද නොවැටී යහපත් අරමුණක් වෙනුවෙන් තමන් ක්‍රියාත්මක විය යුත්තේ කෙසේද යන්න ඔවුහු ජීවිත ආදර්ශයන්ගෙන් ඔප්පු කර පෙන්වූහ.

71 අරගලයේ ශ්‍රේෂ්ඨත්වය වඩ වඩාත් අපට දැනෙන්නේ වර්තමාන සමාජයේ දේශපාලනය වැටී තිබෙන ඛේදජනක තත්වය දෙස බලන විටය. 71 අරගලයෙන් ලද පන්නරය හා ආදර්ශය නිසා ජවිපෙ වර්තමාන දේශපාලන ගොහොරුවට නොවැටී සිටීමට සමත්ව සිටියද ධනපති හා සුළු ධනපති දේශපාලනය ජරාජීර්ණ වී තිබේ. වත්මන් දේශපාලනය තුළ ප්‍රතිපත්ති නැත; ගරුත්වයක් නැත; ආදර්ශ නැත. දේශපාලනය පාදඩකරණයට ලක්ව තිබේ. විටෙක ශුද්ධ වූ දේ ලෙස සැලකූ සියල්ල දැන් කෙළෙසී ඇත. වර්තමානයේ ධනපති, සුළු ධනපති දේශපාලනය තුළ සියල්ලෝ දේශපාලනයට එන්නේ දේවල් ගොඩ ගැසීම හා ඒ සඳහා බලය පාවිච්චි කිරීම, එකම අරමුණ කරගෙනය. මහ දවාලේ සිදුකරන හොරකම්, වංචා, අල්ලස් ගැනීම්, ලිංගික අපචාර, පාතාල ක්‍රියාකාරකම් ආදියෙන් දේශපාලනය දූෂ්‍ය වී තිබේ. බලය සඳහා පැති මාරුකිරීම්, මුදලට හා තනතුරුවලට තමන්ව විකුණා ගැනීම හා අන් අය මිලදී ගැනීම දේශපාලනයේ 'ජාතික ක්‍රීඩාව' බවට පත්ව තිබේ. මේ සියලු ජඩකම් හා දුෂ්ටකම් සිදුකොට කිසිවක් සිදු නොවූ පිරිසිදු මිනිසුන් ලෙස පෙනී සිටීමට, දේශප්‍රේමීන් ලෙස පෙනී සිටීමට සමහරුන් දරන උත්සාහය පිළිකුල් සහගතය. දේශපාලනය ප්‍රතිපත්ති ගර්හිත, නග්න ආර්මාර්ථයෙන් පිරුණු එකක් බටව පත්ව තිබේ. දේශපාලනඥයා එලෙස පිරිහීමට ලක්ව තිබෙන විට ඡන්දදායකයාද එවැනි දේශපාලකයන් පසුපස ගොස් තමන්ටද යමක් ලබා ගැනීමට උත්සාහ කරන අයගේ තත්වයට පිරිහී තිබේ.

ලාංකේය දේශපාලනයේ පවතින මෙම ඛේදජනක තත්වය වෙනස් කළ යුතුව තිබේ. දේශපාලනය ආත්මාර්ථයෙන් තොර මහජන සේවාවක් බවට, දේශපාලනය පෞද්ගලික අරමුණුවලින් තොර, ජනතාව වෙනුවෙන් කැපවීමේ දේශපාලනයක් බවට පත් කළ යුතුය. එම අසීරු කාර්යයේදී ලාංකේය දේශපාලනයට එම ආදර්ශය සැපයීමේ වගකීම වමේ ව්‍යාපාරය ලෙස ජනතා විමුක්ති පෙරමුණට පැවරී තිබේ. එහිදී ජනතා විමුක්ති පෙරමුණේ පරමාදර්ශය වනු ඇත්තේ අන් කිසිවක් නොව, 1971 අප්‍රේල් අරගලයේ විරුවන්ගේ කැපකිරීමේ පරිත්‍යාගයේ පරමාදර්ශයන්මය.

71 අරගලය ලාංකේය දේශපාලනය තුළ මෙන්ම ලාංකේය සමාජය තුළත් සදා නොමැකෙන සටහන් රාශියක් ඉතිරි කර ඇත. එම නිසාම අරගලයෙන් පසු එයට ද්‍රෝහි වූවෝ පවා වසර 47කට පසුවත් තමන්ට වටිනාකම් එකතුකරගැනීම සඳහා 71 අරගලයට තමන්ද සම්බන්ධවූ බව පුවත්පත් පිටු පුරා පවසති. එයින් තහවුරු වන්නේ 71 අරගලයට හිමි වටිනාකම මිස අන් යමක් නොවේ. වර්තමානයේද අපේ පක්ෂයටත් බොහෝ මඟපෙන්වීම් සඳහා 71 අරගලය ඉවහල් වනු ඇත. සමාජයේ පෞද්ගලිකත්වයේ සහ පටු අරමුණු මත ක්‍රියාත්මක වන බහුතරයක් ගැහැනුන් සහ මිනිසුන් අතර එවැනි තත්වයන්ට පත්නොවී පංතියේ ජයග්‍රහණය වෙනුවෙන් පක්ෂය පවරන ඕනෑම කාර්යයක් කිසිදු වරදානයක්, වරප්‍රසාදයක් හෝ ලාභ ප්‍රයෝජනයක් ගැන නොසිතා මෙන්ම පවරන වගකීම තමන්ව බබලවා ගැනීමට ආභරණයක් ලෙස යොදා නොගෙන එය වගකීමක් ලෙස පමණක් ගෙන කටයුතු කිරීමට පක්ෂයකට පළමු පාඩම කියා දුන්නේ 71 අරගලය බව නොරහසකි. එසේම ඉන් වසර 47ක් ඉක්ම යන මේ මොහොතේ 71 අරගලයේ ජීවිත පරිත්‍යාග කළ සහෝදර සහෝදරියන්ගේ උස් ප්‍රාර්ථනාව වූ සමාජවාදී සමාජයක් ලාංකේය භූමිය තුළ ස්ථාපිත කිරීම සඳහා වත්මන් පරපුරේ ධෛර්යවන්ත අධිෂ්ඨානශීලී ක්‍රියාකාරිත්වය ඉල්ලා සිටිනු ඇත.

71 අරගලයේ පාඩම් නූතන පරම්පරාවන්ගේ ජීවිතවලට එකතුකර ගැනීමට සමත්වීම 71 අරගලයට කළ හැකි ඉහළම සාධාරණය වනු නිසැකය.

> ලාංකේය දේශපාලනයේ පවතින මෙම ඛේදජනක තත්වය වෙනස් කළ යුතුව තිබේ. දේශපාලනය ආත්මාර්ථයෙන් තොර මහජන සේවාවක් බවට, දේශපාලනය පෞද්ගලික අරමුණුවලින් තොර, ජනතාව වෙනුවෙන් කැපවීමේ දේශපාලනයක් බවට පත් කළ යුතුය. එම අසීරු කාර්යයේදී ලාංකේය දේශපාලනයට එම ආදර්ශය සැපයීමේ වගකීම වමේ ව්‍යාපාරය ලෙස ජනතා විමුක්ති පෙරමුණට පැවරී තිබේ. එහිදී ජනතා විමුක්ති පෙරමුණේ පරමාදර්ශය වනු ඇත්තේ අන් කිසිවක් නොව, 1971 අප්‍රේල් අරගලයේ විරුවන්ගේ කැපකිරීමේ පරිත්‍යාගයේ පරමාදර්ශයන්මය.

ජනතා විමුක්ති පෙරමුණේ මහජන නියෝජිතයින් විසින් පළ කළ අදහස් වෙනුවෙන් නියමුවා වේදිකාව වෙන්වෙයි.

2018 මාර්තු 07

# අතුරුදහන් කිරීම්වලින් ආරක්ෂා කිරීමේ පනතට විරුද්ධ බලය ලැබුණු විට අතුරුදහන් කරන්න බලන් ඉන්න අයයි

(බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුතිය පනත් කෙටුම්පත පිළිබඳ විවාදයට සහභාගි වෙමින්)

## පාර්ලිමේන්තු මන්ත්‍රී සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා



අද දින සාකච්ඡා කරන මාතෘකා කිහිපය අතරින්, විශේෂයෙන්ම "බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුතිය පනත් කෙටුම්පත" ගැන කෙටියෙන් අදහසක් දක්වනවා.

මම ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරයෙක් වාගේම එහි සාමාජිකයෙක්. බලහත්කාරය නිසා අතුරුදහන් වීම පිළිබඳව ඉතිහාසයක් අපට තිබෙනවා. අපි දන්නවා, අද මේ පාර්ලිමේන්තුවෙත් ඉන්නවා කියලා, එදා 'කළු බළල්ලු', 'කහ බළල්ලු', 'ප්‍රා', 'ස්‍රා', 'කොළ කොටි' ආදී නම්වලින් ඇවිල්ලා රාජ්‍ය බලය බලහත්කාරයෙන් පාවිච්චි කරලා, රාජ්‍ය බලයට එහා ගිය බලයක් පාවිච්චි කරලා අතුරුදහන් කිරීම්වලට ලක් කළ අය. ඇත්තටම මම කැමැති නැහැ, මගේ දරුවෙක්වත්, මාවත්, මා වාගේම සාමාන්‍ය ජනතාවත් තව කවුරු හෝ විසින් බලහත්කාරයෙන් අතුරුදහන් කරනවාට. සුනාමියක් ආවොත් කරන්න දෙයක් නැහැ. සුනාමිය කියන්නේ ස්වාභාවික විපතක්. හැබැයි, තව කෙනෙකුගේ බලය විසින් තව කෙනෙකු අතුරුදහන් කරන්න කාට හෝ පුළුවන්ද? ජාතිවාදයෙන් ඔළුව අවුල් කරගෙන කථා කරන සමහර අයට විවිධ හේතු තියෙන්න පුළුවන්. නමුත් මට හැඟෙන දේ තමයි, තමන්ට රාජ්‍ය බලය ලැබුණු වෙලාවක මිනිසුන් අතුරුදහන් කරන්න බලාපොරොත්තු වන කට්ටියට තමයි මේ පනත් කෙටුම්පතට විරුද්ධ වෙන්න පුළුවන් වන්නේ කියන එක.

මොකද, තමන්ට රාජ්‍ය බලය අරගෙන සාමාන්‍ය ජනතාව, වැඩ වර්ජනය කරන අය, දේශපාලන ක්‍රියාකාරීන් අතුරුදහන් කරන්න කැමැත්තෙන් ඉන්නා කෙනෙකුට මේකට විරුද්ධ වෙන්න පුළුවන්. මම කියන්නේ නැහැ, මෙම නීතිය පාර්ලිමේන්තුවෙන් සම්මත වුණු නිසාම ඊට පසුව අතුරුදහන් කිරීම් නතර වෙනවා කියලා. එහෙම වෙන්නෙත් නැහැ. හැබැයි, 1988 - 89 කාලයේ ඉතිහාසය අපිට මතකයි. අඩු තරමේ එසේ අතුරුදහන් වීම අපරාධයක් කියලාවත් සැලකුවේ නැහැ. එසේ අතුරුදහන් වීම ඔප්පු කළත්, ඒක අපරාධයක් කියලා සැලකුවේත් නැහැ. අපේ රටේ එවැනි ඉතිහාසයක් තිබුණා; සිවිල් යුද්ධ නිසා ඇති වුණු ඉතිහාසයක් තිබුණා. අනාගතයේ එහෙම විය යුතු නැහැ. අනාගතයේ එහෙම නොවෙන්න ජාත්‍යන්තර වශයෙන් ඇමෙරිකාවෙන් ගෙනෙන නීතියක් හෝ තිබෙනවා නම් කමක් නැහැ. ඒකට රට නොවෙයි, ප්‍රශ්නය. ලංකාවේ නීතියක් නැත්නම්, ජාත්‍යන්තරව හෝ සම්මුතියක් තිබෙනවා නම් ඒක හොඳයි කියලා පිළිගන්න ඕනෑ. ජාතිවාදී නරුම මානසිකත්වයෙන් එළියට ඇවිල්ලා. ඒ නිසා අපි මේ ගැන තවදුරටත් සාකච්ඡා කරන්න ඕනෑ කියලා මා කියනවා.

මගේ රටේ ජනතාව මොන පක්ෂයකට අයිති වුණත් මම අදහස් කරන, මම පිළිගන්නා දේශපාලන මතය පිළිනොග න්නා කෙනෙකු වුණත්- බලහත්කාරයෙන් අතුරුදහන් වෙනවාට මම කැමැති නැහැ. අපිට එහෙම කැමැති වෙන්න පුළුවන්ද? සාමාන්‍ය, සරල අදහසින් ගත්තොත් බලහත්කාරයෙන් පුද්ගලයෙක් අතුරුදහන් කරන්න තව කෙනෙකුට පුළුවන්ද? ඒකට කැමැති වෙන්න පුළුවන්ද? මේ තුළ තිබෙන නීති රීති, අණපනත් හෝ වගන්ති ගැන නොවෙයි, මම මේ කියන්නේ. හරයෙන් ගත්තොත්, කෙනෙක් තව කෙනෙකුව බලහත්කාරයෙන් අතුරුදහන් කිරීමට එකඟ වෙන්න පුළුවන්ද?

> මගේ රටේ ජනතාව මොන පක්ෂයකට අයිති වුණත් මම අදහස් කරන, මම පිළිගන්නා දේශපාලන මතය පිළිනොගන්නා කෙනෙකු වුණත්- බලහත්කාරයෙන් අතුරුදහන් වෙනවාට මම කැමැති නැහැ. අපිට එහෙම කැමැති වෙන්න පුළුවන්ද? සාමාන්‍ය, සරල අදහසින් ගත්තොත් බලහත්කාරයෙන් පුද්ගලයෙක් අතුරුදහන් කරන්න තව කෙනෙකුට පුළුවන්ද? ඒකට කැමැති වෙන්න පුළුවන්ද? මේ තුළ තිබෙන නීති රීති, අණපනත් හෝ වගන්ති ගැන නොවෙයි, මම මේ කියන්නේ. හරයෙන් ගත්තොත්, කෙනෙක් තව කෙනෙකුව බලහත්කාරයෙන් අතුරුදහන් කිරීමට එකඟ වෙන්න පුළුවන්ද?

අපි අද බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම ගැන කථා කරනවා. බලහත්කාරයෙන් මිනී මරද්දී මට කනගාටු ඒ ගැනයි. අද අපේ රටේ එක තැනක මිනිසුන් බියෙන් ජීවත් වෙනවා. ඔවුන්ට රිය ගත කරන්න බැහැ. මොකද, සිංහල කෙනා මුස්ලිම් කෙනා මරයිද, මුස්ලිම් කෙනා සිංහල කෙනා මරයිද කියලා බයෙන් ඔවුන් ඉන්නේ. මිනිස්සු මරණයට බයෙන් ජීවත් වෙද්දී, අපි මේ පාර්ලිමේන්තුවේදී බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම ගැන කථා කරනවා. ඒක තමයි ලොකුම විහිළුව. මොකද, අපි කථා කරනවා, "ඔයා බලහත්කාරයෙන් අතුරුදහන් කරන්න ඉඩ දෙන්නේ නැහැ" කියලා. හැබැයි, අපි බලහත්කාරයෙන් මරනවා. බලහත්කාරයෙන් අතුරුදහන් කරන්නේ නැහැ කියලා කථා කරනවා. හැබැයි අද අපි, මිනිහෙක් තව මිනිහෙක්ව බහලහත්කාරයෙන් අතුරුදහන් කරීමට විරුද්ධ වීම ගැන, පක්ෂ වීම ගැන මේ පාර්ලිමේන්තුවේ කථා කරද්දී, බලහත්කාරයෙන් මරනවා. සිංහල කෙනා මුස්ලිම් කෙනා මරන්න හොයනවා. මුස්ලිම් කෙනා සිංහල කෙනා මරන්න හොයනවා. මේ පාර්ලිමේන්තුවේදී අපි බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම වැළැක්වීම ගැන නීති කථා කරනවා. විහිළු නේද? අපි විහිළුවට ලක් වෙලා නේද? මේ පාර්ලිමේන්තුව විහිළුවක් නොවෙයිද?

2018 මාර්තු 08

# ජාතිකත්වයන් දෙස සැකයෙන් බලන රටකට ඉදිරියට යන්න බැහැ

(විදේශීය ටෙලි නාට්‍ය බදු සංශෝධන කෙටුම්පත පිළිබඳ විවාදයට සහභාගි වෙමින්)

## පාර්ලිමේන්තු මන්ත්‍රී නලින්ද ජයතිස්ස සහෝදරයා



ජාතිවාදී තැටිය රත් වෙලයි තිබෙන්නේ. පිරිසක් එකතුවෙලා ඒ තැටියට ගින්දර දමනවා. එහි සිංහල අන්තවාදීන් ඉන්නවා; මුස්ලිම් අන්තවාදීන් ඉන්නවා; දෙමළ අන්තවාදීන් ඉන්නවා. මේ අය ගින්දර දමමින් තැටිය රත් කරනවා. තැටියට වතුර බින්දුවක් වැටුණොත් -මොකක් වුණත්- ඒකෙන් හානියක් වෙනවා. ඒ නිසා අපි දැන් බලන්නට ඕනෑකම තිබෙනවා. මෙන්න මේ තැටිය රත් කරන අයත් ඉවත් කරගෙන තැටිය නිවා ගන්නේ කොහොමද කියලා. එවැනි දැක්මක් තිබෙනවා නම් සිනමාව, ටෙලි නාට්‍යය, කලාව තුළින් ජනතාව අතර සමගිය ඇති කරන්නට, ජාතීන් අතර සංහිඳියාව ඇති කරන්නට, මනුෂ්‍යත්වය පිළිබඳව ගැඹුරු අදහසක් මේ සමාජයට දෙන්නට මේ මාධ්‍යයන් පාවිච්චි කරන්න අපිට පුළුවන්කම තිබෙනවා.

අපේ ලාංකීය -දේශීය- සිනමාව අවුරුදු 70ක් පහු කරලා තිබෙනවා. හැබැයි, යුද්ධය අවසන් වෙලා අවුරුදු දහයක් ගත වෙලා තිබියදීත්, මේ රටේ ජාතීන් අතර තිබෙන සැකය, අවිශ්වාසය තුරන් කරන්නට අපේ සිනමාව කොච්චර මැදිහත් වුණාද? අපේ ටෙලි නාට්‍ය ක්ෂේත්‍රය ඒ වෙනුවෙන් කොච්චර මැදිහත්වෙලා තිබෙනවාද? 2008 අවුරුද්දෙන් පස්සේ, "අබා" චිත්‍රපටයෙන් පටන්ගෙන වර්තමානයේ ප්‍රදර්ශනය වන "කල" සිනමා පටය දක්වා දිගින් දිගටම විකාශනය වුණේ එකම දෘෂ්ටි වාදයක් පදනම් කර ගත් සිනමා පට. ඒක ඇතුළත කොහේවත් ජාතික සමගිය ගොඩ නගන දේවල් තිබුණේ නැහැ. ඒක ඇතුළත ජාතීන් අතර අවිශ්වාසය දුරු කරන දේවල් තිබුණේ නැහැ. ඒක ඇතුළත "හැම දෙනාම සමාන මට්ටමේ පුරවැසියන්" කියලා කියන යෝජනාවන් තිබුණේ නැහැ. අතරින් පතර පුංචි පුංචි චිත්‍රපට ටිකක් ආවා තමයි. හැබැයි, රටක් හැටියට අපි බරපතළ තත්වයකට මුහුණ දීලා තිබෙනවා. ඕනෑ වෙලාවක පළුදු කරන්න පුළුවන්. ඕනෑ වෙලාවක කිචි කවලා ඇහැ ඇරවලා ගන්න පුළුවන්. ඕනෑම වේලාවක මූඩිය ඇරලා එළියට ගන්න පුළුවන් භූතයා යටපත් කරන්නේ කොහොමද කියන කාරණය පිළිබඳව ගැඹුරු සංවාදයක් මේ කලාව හරහා අපි කළේ නැහැ.

පසුගිය කාලයේ අපේ රටේ පැවතුණු චිත්‍රපටි කර්මාන්තය දිහා බැලුවොත් එය ඔප්පු වනවා. මේ රටේ පෞද්ගලික අංශය, ව්‍යාපාරිකයන් වැනි අය මුදල් ආයෝජනය කළේ මම කලින් කියපු ඓතිහාසික, ජාතිකවාදී, විවිධ අර්ථ කථනයන් සහිත, වැල යන අතට මැස්ස ගහන වර්ගයේ චිත්‍රපටිවලටයි. රාජ්‍යත්වය, යුදවාදය, බලහත්කාරයෙන් මිනිසුන් පීඩාවට පත් කිරීම තමයි ඒ චිත්‍රපටිවලින් උත්කර්ෂයට නැංවුවේ. ඒවාට තමයි මේ ව්‍යාපාරිකයන් ආයෝජනය කළේ. ඒවා තමයි ලාභ ලැබුවේ. ඒ නිසා තමයි "අබා" වාගේ චිත්‍රපටයකට රුපියල් ලක්ෂ 800ක් විතර කෙනෙකු ආයෝජනය කරන්නේ. හැබැයි, අඩු ගණනේ යුද්ධය අවසන් වුණාට පස්සේවත් මේ රටේ තිස් වසරක යුද්ධයක් නැවත ඇති නොවන්නට, ආයුධ අතට නොගන්නට, ජනතාව අතර මනුෂ්‍යත්වය වගා කරන්නට අවශ්‍ය කරන නිර්මාණ බිහි වුණා නම් එහෙම නිර්මාණ බිහි වුණේ අතේ ඇඟිලි ගණනටත් වඩා අඩුවෙනුයි. අපි තවම කථා කරන්නේ මහාචාර්ය සුනිල් ආරියරත්න මහතා අධ්‍යක්ෂණය කරපු "සරුංගලය" චිත්‍රපටය ගැනයි. අපි තවම කතා කරන්නේ ධර්මසේන පතිරාජ මහතා අධ්‍යක්ෂණය කරපු "පොන්මනී" ගැනයි. මෑත කාලයේ අශෝක හඳගම වාගේ අධ්‍යක්ෂවරු, විමුක්ති ජයසුන්දර වාගේ නව පරපුරේ අධ්‍යක්ෂවරු, ප්‍රසන්න විතානගේ වැනි අධ්‍යක්ෂවරු බිහි කළ නිර්මාණ අතළොස්සක් තිබෙනවා. හැබැයි, ඒ නිර්මාණ අබිබවා යන ආකාරයට චිත්‍රපට කර්මාන්තයත්, ටෙලි නාට්‍ය කර්මාන්තයත් යොදා ගෙන තිබෙන්නේ රටේ පවතින මේ ජාතිවාදී ප්‍රවණතාව ඉස්මතු කරන්නටයි.

අපි හේතුවට පිළියම් කරන්නේ නැතිව ඵලය අල්ලා ගෙන මොනවා කළත් වැඩක් වෙන්නේ නැහැ. මේ තිබෙන ගැටුම් අවම කරන්න නම්, මනුෂ්‍ය ඝාතන නතර කරන්න නම්, මේ තිබෙන දේපළ විනාශය නැති කරන්න නම් අපිට මෙන්න මේ ජාතිවාදී දෘෂ්ටිවාදය තීරණාත්මකව පරාජයට පත් කරන්නට වුවමනා කරනවා. එය පරාජය කිරීම ගෙදරින් පටන් ගන්න පුළුවන්. හය හමාරේ ඉඳල රෑ නවය හමාර වනතුරු තිබෙන හොඳම කාල වේලාව රූපවාහිනියේ හැම channel එකක්ම අද වෙන් කරගෙන තිබෙන්නේ විවිධ ආකාරයෙන් එන විදේශීය ටෙලි නාට්‍ය වෙනුවෙනුයි. අද සමහර නාලිකා ප්‍රවෘත්ති විකාශනයත් රෑ 9.55ට, 9.50ට දාගෙන තිබෙනවා. ඒ ටෙලි නාට්‍යවලට ඉඩකඩ ලබා දෙන්නට. දරුවන් හදන, දරුවන්ට ගෙදරදී අධ්‍යාපනයක් ලබා දෙන තරුණ මව්වරුන්ට යම්කිසි අදහසක් කා වද්දන්න පුළුවන් හොඳම belt එක තමයි අපි මේ නිස්කාරණේ මුදල් වෙනුවෙන් නාස්ති කරගෙන යන්නේ.

ඒක රූපවාහිනී ආයතනයට ලාභ ලබා දෙන්නට පුළුවන්. හැබැයි, මතක තබා ගන්න, මේ රටේ ජනතාව මේ විධියට ඇන කොටා ගෙන -සිංහල මනුෂ්‍යයා දෙමළ මනුෂ්‍යයා දෙස, සිංහල මනුෂ්‍යයා මුස්ලිම් මනුෂ්‍යයා දෙස, මුස්ලිම් මනුෂ්‍යයා දෙමළ මනුෂ්‍යයා දෙස, මුස්ලිම් මනුෂ්‍යයා සිංහල මනුෂ්‍යයා දෙස සැකයෙන්, අවිශ්වාසයෙන් බලන රටකට ඉස්සරහට යන්න බැහැ. ඒ කියන්නේ, කවර හෝ පුංචි සිදුවීමකින් අවුළවන්නට පුළුවන් රටකට ඉස්සරහට යන්න බැහැ. රටක් හැටියට අපි ලජ්ජා වන්නට ඕනෑ. කොත්තුවක තිබෙන පිටි ගුලියකට රටේ මෙච්චර විනාශයක් කරන්න පුළුවන් නම්; පාරේ සිදුවන බයිසිකල් අනතුරකට නැත්නම් රථවාහන අනතුරකට රටේ මෙච්චර දේපළ 15වැනි පිටුවට

> මේ රටේ ජනතාව මේ විධියට ඇන කොටා ගෙන -සිංහල මනුෂ්‍යයා දෙමළ මනුෂ්‍යයා දෙස, සිංහල මනුෂ්‍යයා මුස්ලිම් මනුෂ්‍යයා දෙස, මුස්ලිම් මනුෂ්‍යයා දෙමළ මනුෂ්‍යයා දෙස, මුස්ලිම් මනුෂ්‍යයා සිංහල මනුෂ්‍යයා දෙස සැකයෙන්, අවිශ්වාසයෙන් බලන රටකට ඉස්සරහට යන්න බැහැ. ඒ කියන්නේ, කවර හෝ පුංචි සිදුවීමකින් අවුළවන්නට පුළුවන් රටකට ඉස්සරහට යන්න බැහැ. රටක් හැටියට අපි ලැජ්ජා වන්නට ඕනෑ.

කවුළුව හැර තබමි

# මිනිසත් බවට නිගා නොකරනු!



"ජාතිවාදය යනු ජාතික හුදෙකලාභාවය,සෙසු ජාතීන් සැක කිරීමට පක්ෂ වීම හා ජාතීන් අතර සතුරුභාවය ප්‍රකාශ කරන ධනේශ්වර මතවාදයේ හා දේශපාලනයේ මූලධර්මයකි." යනුවෙන් ලෙනින්වාදය අපට උගන්වයි. ඒ අනුව මේ ධනේශ්වර සමාජ ක්‍රමය මුළුමනින්ම විනාශකරන තුරු ජාතිවාදයේ මූලබීජයන්ද එසේම පවතිනු ඇත. එය අද විශේෂයෙන්ම අප වැනි පසුගාමී ධනේශ්වර රාජ්‍යයන්හි පාලකයන් තම පැවැත්ම සඳහා පාවිච්චි කරන වෙළඳ භාණ්ඩයකි, මෙවලමකි. ඒ සඳහා වරින්වර විවිධ අනුපාතයන්ගෙන් සහ විවිධ අනුකලනයන්ගෙන් යුතුව ඔවුහු එය පාවිච්චි කරති. ලංකාවේ පසුගිය දිනවල අවුළුවාලන ලද ජාතිවාදී ගින්නද එයට හොඳම උදාහරණයකි.

ලෝකයේ 'අමිශ්‍ර','පිරිසිදු' ජාතීන් කොතනකවත් නැත. සිටියේද නැත. එය අද විද්‍යාවෙන් තහවුරු කර ඇති සත්‍යයයි. ජාතීන් එසේ මිශ්‍ර වූයේ නැතිනම් 'මුහුන්' වූයේ නැත්නම් මිනිස් වර්ගයා මෙලොවින් වඳවී ගොස් බොහෝ කල්ය යනුවෙන් විද්‍යාඥයෝ ප්‍රකාශ කරති. එය විද්‍යාවෙන් නැවත නැවතත් තහවුරු කර ඇත.

සතුන් සහ ශාක වර්ගවල හැර මිනිසා වෙන් වෙන් වශයෙන් වර්ග කළ නොහැකි බව බුදුරදුන්ද වරක් ප්‍රකාශ කර තිබේ.

මිනිසා වඩ වඩා දියුණු සත්වයකු බවට පත් වූයේද වඩා බුද්ධිමත් වූයේද එසේ මිශ්‍ර වීම නිසා බව විද්‍යාවෙන් තහවුරු කළ නොබිඳිය හැකි සත්‍යයකි. මිනිසා පැවත එන්නේ 'හෝමෝසේපියන්' (බුද්ධිමත් මිනිසා) නැමැති එකම කුලයකින් බව විද්‍යාව සොයාගෙන තිබේ.

අද වන විට ලෝකයේ පැවති භාෂා දහස් ගණනක් අභාවයට ගොසිනි. ලෝකය වඩා පහසුවෙන් ගනුදෙනු කළ හැකි දියුණු එකම භාෂාවක් දෙසට එකම මිනිස් යායක් දෙසට ගමන් කරමින් සිටින බව විද්‍යාඥ මතයයි. මෙය මාක්ස් එංගල්ස් විසින් කොමියුනිස්ට් ප්‍රකාශනයෙන් මීට වසර 170කට පෙරම පෙන්වාදුන් සත්‍යයයි. එහෙව් මිනිස් සමාජයක ජාතිවාදී මත වපුරා මිනිසුන් එකිනෙකා මරා ගැනිමට සලසා තිබෙන්නේ කවුරුන්ද? එහි වාසිය කාටද? මිනිසුන් ගමන් කළ යුත්තේ ම්ලේච්ඡත්වයෙන් ශිෂ්ටත්වයට නොවේද?

# ඉතිහාසයේ ගල් දොර බිඳ දැමූ ඔවුහු!



විශ්ව උන්නතිකාමීත්වය, පවතින තත්වයෙන් විසටනයවීම, මානවවාදී බව මේවා සමාජ සංවර්ධනය වෙනුවෙන් සටන් වදින මිනිසුන් තුළ තිබිය යුතු මූලික ගුණයන්ය. ඉතිහාසයේ සැබෑ විරුවන් වන්නේ එවැනි මිනිසුන්ය. අපි මේ කතා කරන මිනිසුන්ද එවැනි ව්‍යවහාරික අරුතකින් ලාංකේය සමාජය වෙනස් කිරීම වෙනුවෙන් සටන් කළ සැබෑ විරුවන්ය. ඔවුන් නම් අප්‍රේල් විරුවන්ය.

ෆැක්ටරියක තොග ගණන් නිපදවා වෙළඳපොළට දමන වෙළඳ භාණ්ඩ මෙන් එස්.එම්.එස්. විරුවන් නිපදවන රටක සමාජයේ ඇත්ත විරුවන් සොයා යෑම අසීරු අභ්‍යාසයකි. අප්‍රේල් විරුවන් ගැන කතා කිරීමද එවැනි අසීරු අභ්‍යාසයකි.

ඔවුහු සටන් වැදුනෝ තමාද ආදරණීය මිනිසෙකු වී අනෙකාවද එවැනි ආදරණීය මිනිසෙකු බවට පත් කිරීම සඳහාය. එහෙත් තවමත් අප්‍රේල් විරුවන්ට ලැබිය යුතු ඉතිහාසයේ ඒ ගෞරවනීය ස්ථානය මේ සමාජය තුළ ලැබී නොමැත. එය ලබාදිය හැක්කේද මේ නරුම සමාජ ක්‍රමය වෙනස් කිරීම මගින්ම පමණි.

එය අදටත් ඔවුන්ගේ උත්තුංග අරමුණු වෙනුවෙන් සටන් වදින සමාජ ව්‍යාපාරයේ වගකීමකි. එහි සැබෑ සටන්කරුවන්ගේ වගකීමකි.

අප්‍රේල් විරුවෝ තමන් කළ ඓතිහාසික මෙහෙවර වෙනුවෙන් කිසිදු දෙයක් පෞද්ගලිකව අපේක්ෂා නොකළෝය. උසස් මිනිස් සමාජයක් නිර්මාණය කිරීම වෙනුවෙන්ම සටන් වැදුණු ඔවුන් ඒ වෙනුවෙන් තම ජීවිතද අත්හළහ.

ලාංකේය ඉතිහාසයේ පළමු වතාවට එවන් මානවීය අරුතකින් සටන් කළෝ ඔවුහුය. එවැනි අරුතකින් මේ සනීභූත සමාජයට පළමු ප්‍රහාරය එල්ල කළෝද ඔවුහුය. ඔවුන් ස්වකීය භෞතික අවශ්‍යතා ඓතිහාසික අවශ්‍යතාවයට ද්විතීයික කළෝය. ඔවුහු මේ සමාජය පරමාදර්ශී නව රටාවකට පරිවර්තනය කිරීම සඳහා සටන් වැදුණු සත්‍යයේ විරුවෝය. ඔවුහු අලුත් මාවතකට පළමු දොරටුව විවෘත කළහ. එම මාවතේ සියලු බාධක සිඳ බිඳ ඉදිරියටම යාම හැර අන් විකල්පයක් අප හමුවේ නොමැත.

# ලාංකේය මගියාගේ දේශපාලන අර්බුදය!



අද ලංකාවේ මිනිසාගේ වැඩිම කාලයක් කා දමන්නේ මාර්ග තදබදය විසිනි. අද ලංකාවේ වැඩකට හෝ ගමනක් යනවා කියන්නේ මරණවා වැනි වැඩකි. මුළු සමාජ දේහයම අවුල් ජාලාවක් බවට පත්ව ඇති රටක මීට වඩා දෙයක් බලාපොරොත්තු විය නොහැක. අද ලාංකේය ගමන් මගියා වැඩියෙන්ම ප්‍රකෝප කරවන, වෛරය අවුස්සන මිනිස්සු දෙන්නෙක් සිටිති. ඒ ප්‍රයිවට් බස් කොන්දොස්තර සහ ඩ්‍රයිවර්ය.

ලාංකේය මගියාද දියුණු පුරවැසියෙකු නොවන නිසා ඔහු තම කෝපය නිතරම පිටකරන්නේ ඉහත කී මිනිසුන් දෙදෙනා පිටිනි. ඔවුන් දෙදෙනාද මේ සමාජ ක්‍රමයේම නිර්මිතයන් නිසා ඔවුන් තුළද විනයක් හෝ ශිෂ්ටත්වයක් නොමැත. ලාංකේය සමාජ අර්බුදයේ සැබෑව සොයා ගැනීමට ඉහත අර්බුදය වුවද ප්‍රමාණවත්ය.

එහෙත් ලාංකේය මිනිසා තමා මුහුණ දෙන අර්බුදයේ සැබෑ හේතු සොයා ගැනීමට තවමත් අසමත්ය.

මෙතරම් ඔහු පිස්සු කෙළින්නේ එනිසා විය යුතුය. නවීන මෝටර් රථ, මහා මාර්ග, දුම්රිය මාර්ග ආදිය ලංකාවට පිටින් පැමිණි නවීකාරකයන් මිස ලාංකේය සමාජ සංවර්ධනය සමග ඓන්ද්‍රීයව බැඳුණ දේ නොවේ.

ඉතාම සුඛෝපභෝගී නගරාන්තර බස් රථවලටත් පොරකකා නගින මගීන් අප දකින්නේ ඒ නිසාය.

දියුණු රටවල මගී ප්‍රවාහනය යනු ආර්ථික හා නිෂ්පාදන ක්‍රියාවලිය සමඟ සැලසුම් සහගතව බැඳුණු ක්‍රියාදාමයකි. ලංකාවට එවන් භෞතික ඓතිහාසික නිෂ්පාදන ආර්ථිකයක් නොමැත. ලාංකේය මිනිසාට ගමනක් යාම යනු මරුවා සමඟ වාසයට යාමක් වන්නේ මේ නිසාය. මගී අයිතින් හෝ පුරවැසි අයිතීන් ගැන ඔවුන්ගෙන් බහුතරයකට අවබෝධයක්, වැටහීමක් නොමැත. ඊට අවශ්‍ය දේශපාලන විඥානය ඔහුට නැත. ඔහු වියුක්ත සිතන්නෙකු බවට පත්වී ඇත්තේ එනිසාය. ලාංකේය මිනිසාගේ අර්බුදය තේරුම් ගැනිමට පැයක බස් ගමනක් ප්‍රමාණවත්ය. ඔහුට අර්බුදයේ ඵලය මිස හේතුවක් නොදැනේ; නොවැටහේ. ඵලය සමඟ පොර බදන්නේ එනිසාය. වඩා වැදගත්, හේතුව සොයාගැනීමය. එයට දේශපාලන අවබෝධය අවශ්‍යමය.

# පොලිටිකල් පංතිය

පොලික්ක කීප දවසක්ම පීරියඩ් එකට ආවෙ නැති හින්ද ළමයි හිටියෙ, සිත් සේ. සිත් සේ කියන්නෙ වැඩි දෙනෙක් නිදි. ඒත් අද නින්දක් නිදියලා ඇහැරෙන්න කලින් කවුද මේසෙකට හයියෙන් තට්ටු කරනව ඇහිල කීප දෙනක් ඔළුව උස්සලා බැලුවම පොලිටික්ක...

"ගුඩ් මෝනිං සර්" වසන්තිය කලින්ම ඇහැරිල.

"වෙරි ගුඩ් මෝනිං සර්, අද සර්..." අනුරුද්දියත් මොකද්ද කියන්න ඇවිල්ල ගිල්ල.

"ඇයි ළමයිනේ මේ උදේ වරුවෙ නිදියන්නේ?" පොලිටික්ක ප්‍රශ්නයක් එන්න කලින් ප්‍රශ්නෙකින් දමලා ගැහුව.

"නිදා ගත්තෙද සර්...?" කනිය ප්‍රශ්නෙ තමන්ටම ගත්ත. "ශරීරය එලදායී වැඩකට යොදවන්න ඕනෙ හින්ද. මොකද මොළේට නින්ද අවශ්‍යයි." කනිය විද්‍යා පොත පෙරළගෙන.

"නින්ද අවශ්‍යයි තමයි, ඒත් උදේ නිදියන එක මහ කාලකණ්ණි වැඩක්නෙ." පොලිටික්කගෙ කැත හිනාවෙ සද්දෙට හිස්ටීරියාවත් දොරෙන් එබිලා බැලුවා.

"නෑ සර්. ටැලන්ට් ෂෝ බලන්න නිදි මැරුවාම උදේ තමයි නිදා ගන්න හොඳම." කනිය නින්දේ අයිතිය වෙනුවෙන් පෙනී හිටිය.

"සර් කලින් දවස්වල ආවෙ නෑනෙ. උගන්නපු පාඩම් මෙනෙහි කරන්නයි අපි ඩෙස්වල ඔළුව ගහගත්තෙ." අනුරුද්දිය නිදහසට කරුණු කියනව..."ඉතින් දන්නෙම නැතුව නින්ද ගියා..."

"අනෙක මෙනෙහි කරන්න උගන්නපු දේකුත් නෑනෙ!" මංජුව හීනියට කියල දැම්ම; පොලික්කට ඇහුණද දන්නෙ නෑ.

"මොකද්ද මංජු කිවුවෙ?" වෙලාවට පොලිටික්කට ඇහිල නෑ.

"නෑ සර්, මං කිවුවෙ අලුත් අධිකරණ තුනක් එනව කියල." මංජුව අහම්බෙන් වමට කැපුවෙ බේරෙන්න.

"මං කියන්න හිටියෙ ඔය ළමයින්ට..." පොලිටික්ක ඉබ්බා දියට දැම්මා වගේ. "එහෙම අධිකරණ දාන්න බෑ. නීතියේ සමානාත්මතාව උල්ලංඝනය වෙනව."

"එහෙනම් කෝ වැරදි තියෙනව නම් නඩු දාන්න එපායෑ කියල කට්ටිය පොර ටෝක් දැම්මෙ?" චමිය ඇහුවෙ අඩ නින්දෙ වගේ.

"ඇත්තට කියපු දෙයක් නෙමෙයිනෙ. ආණ්ඩුවත් එක්ක ඩීල් දාපු නිසා නඩු වැටෙන්නෙ නෑ කියල ටක්කෙට දැනන් හිටිය නිසා තමයි කිවුවෙ." සමන විග්‍රහයක් පටන්ගත්තා. "දැන් ඡන්දෙන් පස්සෙ ආණ්ඩුව තාප්පෙට හිරවෙලා නිසා මොනව හරි කරන්න බලනව. ඒත් ඕවා කොච්චර දුරට කෙරෙයිද කියන එක වෙනම ප්‍රශ්නයක්. එතකොට කට්ටිය නීතියේ සමානාත්මතාව ගැන කියනව. වෙනම අධිකරණ දානවට විරුද්ධව ශ්‍රේෂ්ඨාධිකරණෙට යනවා. ඇයි අවුරුදු දහය විස්ස නඩු ඇදෙන කොට ජීවිත කාලෙත් ඉවරයිනෙ. අගවිනිසුරු ශිරාණි බණ්ඩාරනායක පාර්ලිමේන්තුවෙ කැන්ගරු උසාවියට කැඳවලා ගෙදර යවපු මිනිස්සුනෙ මේ."

"නැහැ සමන්. ඔයාට තේරුණේ නැහැ...." පොලිටික්ක තව මොනවද කියන්න හැදුව.

"නැහැ සර්, හොඳට තේරෙනවා. අද කට්ටියටම දුමින්දගෙ ලෙඩේ. ඔක්කොම මතක නෑ. ඔක්කොම කිවුවට ඔක්කොම නෙමෙයි, රජ සැප, කුමාර සැප මතකයි. සල්ලි රහ මතකයි. බලයෙ හයිය මතකයි. ඒකනෙ එන්න දඟලන්නෙ. කරපු මිනීමැරුම්, හොරකම් විතරයි මතක නැත්තෙ. තාජුඩීන් කවුද දන්නෙ නෑ. ලසන්ත වික්‍රමතුංග අඳුරන්නෙ නෑ. ඇවන්ගාඩ් කොම්පැනියක් තිබිල නෑ. රජයේ වියදමින් දෙමව්පියන්ට සොහොන් හදල නෑ. මිග් යානා වැඩි මිලට අරන් නෑ. උදයංග වීරතුංග නෑයො නෙමෙයි. ජනාධිපතිවරණෙට එන්න පිටපොට ගහන ගෝඨා මහත්තයා නඩුකාරයො අල්ලගෙන නීතියෙන් රිංගනව. තමන්ගෙ නිර්දෝෂීභාවය ඔප්පු කරන්න උසාවියට එනව වෙනුවට තමන්ට විරුද්ධව නීතිමය කටයුතු කෙරෙන එක අත්හිටුවන්න තහනම් නියෝග ගන්නව. ලැජ්ජා නෑ. ප්‍රංශෙ සාකෝසිල හිරේ. මෙහෙ වෙන්නෙ වෙන වැඩ." සමන දිගඅරින කොට පොලිටික්ක හිතුවෙ ළඟ නවන ක්‍රමයක්.

## වැඩකරන ජනතාව...

03 පිටුවෙන්



බෝතලයෙන් බත්පැකට් එකෙන් ඇද බැඳගෙන ඉන්නේ. ඒ බැමිවලින් ඔවුන් ගලවාගන්න දැවැන්ත මතවාදී අරගලයක් ඕනෑ. ඒක ලේසි, පහසු ඉක්මනින් කළ හැකි දෙයක් නොවෙයි. ජනමාධ්‍ය ගත්තත් 99%ක්ම ධනපති පංතියේ ප්‍රාග්ධන වුවමනාවට තමයි කටයුතු කරන්නෙ. ඔවුන් ඔවුන්ගේ දේශපාලන පක්ෂවලට ඕන විදිහට අපේ පංතියට මතවාදය හදනවා.

ඒ නිසා වැඩකරන පංතියේ දියුණු කොටස්වලට සිද්ධවෙනවා, මේ අභියෝගය භාර අරගෙන අත්නොහරින අඛණ්ඩ අරගලයක් කරන්න. වැඩකරන පංතිය ගත්තොත් සාතිශය බහුතරයක් ජීවන අරගලයට කොටුවෙලා හිරවෙලා ඉන්නේ. එතැනින් එහා ගිය පංති අරගලයට ඔවුන් සම්බන්ධ කරගැනීම අපේ වගකීමක්. ඇත්තම කීවොත් ඒක අපේ වැඩේ. තවත් විදිහකට කියනවා නම් නිල් පාටින්, කොලපාටින්, කුරහන් පාටින් මැයි දින කරන්න බැහැ. අත, අලිය, බුලත්කොලේ, පොහොට්ටුව, සීනුව යටතේ මැයි දින සැමරීම වැරදි දෙයක්. ඩී එස්, ඩඩ්ලි, බණ්ඩාරනායක, සිරිමා,ජේආර්, චන්ද්‍රිකා, මහින්ද, රනිල්, මෛත්‍රී වගේ අය සමග මොන මැයි දින සැමරුම්ද? මේ හැමෝම වැඩකරන ජනතා ප්‍රමුඛ පීඩිත පංතිය පෙලන මේ දුෂ්ට ක්‍රමය පවත්වාගෙන ආපු අය සහ ඉදිරියටත් ගෙන යන අය. දේශපාලන අර්ථයෙන් ගත් විට ඔවුන් වැඩකරන ජනතා ප්‍රමුඛ පීඩිත පංතියේ හතුරන්. මැයි දිනයේ පාට රතු පාට. ලකුණ දෑකැත්ත සහ මිටිය. නායකයෝ මාක්ස්, එංගල්ස්, ලෙනින් වගේම වැඩකරන ජනතා ප්‍රමුඛ පීඩිත පංතිය වෙනුවෙන් සටන් කරපු අය සහ සටන් කරන අය. ඉතින් අපිට තමයි වගකීම තියෙන්නේ, අපේ පංතියේ ජනතාව තමන්ට හතුරු ධනපති පංතියේ මැයි දින සැමරුම් වලට සහභාගි වන එක වැළැක්වීමට. ඒ වෙනුවෙන් අපේ පංතිය දැනුවත් කිරීම අත්‍යාවශ්‍යයි.

***නියමුවා:- වැඩකරන ජනතාව පොදු ජනතාවට අමතරව ගැටලු ගණනාවකට මුහුණ දෙමින් සිටිනවා. ඒ සම්බන්ධයෙන් ඔබගේ අවධානය කොහොමද?***

***ලාල්කාන්ත සහෝදරයා:-*** මේ ආණ්ඩුව වැඩකරන ජනතාවගේ විශ්‍රාම වැටුප අහෝසි කළා. ඒ වගේම ජීවන වියදම මාසෙන් මාසයට ඉහළ යමින් තියෙනවා. 2015 ජනවාරි 08 දිනෙන් පසු පවුලක මාසික වියදම රුපියල් 6000කින් පමණ වැඩිවෙලා තියෙනවා. සමහර ක්ෂේත්‍රවල අතිකාල කප්පදුවක් තිබෙනවා. මේ හැම එකකින්ම කියවෙන්නේ කප්පාදුවක් තමයි. මේ පාලකයෝ වෙන මොනව කරන්නද? ඔවුන්ට පුළුවන්ද ජනතාවට ජීවිත දෙන්න? අපි මුලින්ම කථාකරපු අර්බුදයට ඇදල දම්මාට පස්සෙ මොකුත්ම ලැබෙන්නේ නැහැ. කල් නොයවා පවතින මේ දේශපාලන ක්‍රමය පරාජයට පත්කළ යුතුමයි. අලුත් දේශපාලන ක්‍රමයක්, අලුත් දේශපාලන බලයක් ගොඩනැගීම පමණයි මෙයට උත්තරය වන්නේ. අපි මුළු අවධානයම යොමු කරල තියෙන්නේ එය ජයග්‍රහණය කරවීම සඳහා.

***නියමුවා:- වැඩකරන ජනතාව ප්‍රමුඛ පීඩිත පංතිය ජ.වි.පෙ. මැයි දින පෙළපාලිය හා රැලිය සමග එක්විය යුතුයැයි ඔබ කියන්නේ ඇයි?***

***ලාල්කාන්ත සහෝදරයා:-*** සැබෑ අර්ථයෙන් මැයි දිනය සමරන්නේ ජනතා විමුක්ති පෙරමුණ පමණයි. වෙනත් කිසිම තැනක් සැබෑ අර්ථයෙන් මැයි දිනය පවත්වන්නෙ නැහැ. ඒ අර්ථයෙන් ගත්තත් වැඩකරන ජනතාව ප්‍රමුඛ පීඩිත පංතිය අනිවාර්යයෙන් එක්විය යුත්තේ ජනතා විමුක්ති පෙරමුණේ මැයි දින පෙළපාලය හා රැලිය සමගයි. ඒ වගේම වැඩකරන පංතියේත් පොදු ජනතාවගේත් අයිතීන් වෙනුවෙන් අවුරුද්ද පුරාමත් හැමදාමත් සටන්කරන්නේ ජනතා විමුක්ති පෙරමුණ පමණයි. ඒ නිසාත් වැඩකරන පංතිය ප්‍රමුඛ පීඩිත ජනතාව එක්විය යුත්තේ ජවිපෙ සමග පමණයි. පවතින දේශපාලන පක්ෂ ඔක්කම වාගේ කුණුවෙලා ගඳගහද්දී ජනතාවට අලුත් බලාපොරොත්තුවක් ඉතිරි කරලා තියෙන්නේ ජනතා විමුක්ති පෙරමුණ පමණයි. ඒ වගේම සංවිධානාත්මක බවත් විනයත් සහිතව අර්ථයක් ඇතිව මැයි දින පවත්වන්නේ ජනතා විමුක්ති පෙරමුණ පමණයි. ඒ අර්ථයෙන් ගත්තත් වැඩකරන ජනතාව ප්‍රමුඛ පීඩිත පංතිය එක්විය යුත්තේ ජවිපෙ සමග පමණයි.

ඇස් පේනවනම්, කන් අහෙනවනම් ඔවුන් අනිවාර්යෙන් තීන්දුවක් ගත යුතුයි. තමන්ට වින කටින තමන්ගේ අයිතීන් උදුරාගන්න දවසින් දවස තමන්ව පීඩාවට පත්කරන ශ්‍රී ලංකා, යූඇන්පී, පොදු පෙරමණු මැයි දින පෙළපාලි සහ රැලි වර්ජනය කළ යුතුයි. තම අයිතීන් දිනා ගැනීමට ඔවුන් සියලු දෙනාම ජනතා විමුක්ති පෙරමුණේ මැයි දින රැලිය සහ පෙළපාලිය සමග එක්විය යුතුයි. ඒ සඳහා අපි වැඩකරන ජනතාව ප්‍රමුඛ පීඩිත ජනතාවට ආරාධනා කරනවා, මෙවර ජ.වි.පෙ. මැයි දින පෙළපාලියට හා රැලියට සහභාගි වන්න කියලා.

## රටේ ආර්ථිකයේ...

07 පිටුවෙන්



අවස්ථාවේදීම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන විසර්ජන පනත මගින් සීමාවන් පනවා ඇත. උදාහරණ ලෙස 2018 වසරේදී ණය ලෙස ලබාගත හැකි උපරිම සීමාව රු. බිලියන 1813කුත් මිලියන 818,000න් ලෙස උපරිමයක් දක්වා ඇත. එසේම ණය වියදම් කළ හැකි අවශ්‍යතාවයන්ගේ සීමාවන්ද පනවා ඇත. 2003 අංක 3 දරන මුල්‍ය කළමනාකරණ (වගකීම්) පනතද මෙයට අදාළ වේ.

නමුත්, දැන් ආණ්ඩුවේ අවශ්‍යතාවය වී ඇත්තේ එවැනි සීමාවන් නැතිකර ගැනීමය. ඒ සඳහා විසර්ජන පනතේ කවර සීමාවන් තිබුණද, එම සීමාවන් නොතකා ණය ගත හැකි ලෙස නව පනතක් පාර්ලිමේන්තුවේ ඉදිරිපත් කර තිබේ. සක්‍රීය බැරකම් කළමනාකරණය කිරීමේ පනත ඉටු කරන්නේ එම අවශ්‍යතාවයයි.

මෙහි අපූර්ව දේ වන්නේ, රජයේ ණය අවශ්‍යතාවයන්ට සීමා බාධක නොතකා ණය ගැනීමට හැකියාව මෙන්ම, එසේ ණය ගැනීමට මැදිහත් වන මහා බැංකුවේ හෝ අදාළ අමාත්‍යාංශයේ නිලධාරියෙකු එම ණය ගැනීමේ කටයුත්ත නිසා කිසිදු අධිකරණයක කුමන හෝ ආකාරයකින් වැරදිකරුවෙකු කිරීමට ලක් නොවී, එම වගන්තිය යොදා ඇත්තේම අර්ජුන මහේන්ද්‍ර වැනි ණය මුවාවෙන් රාජ්‍ය ධනය ඉදිරියේදීත් මංකොල්ල කන ගජ මිතුරන්ට නීතියේ රැකවරණ ලබාදීමය.

රජය ආර්ථිකයෙන් නිදහස් කර, ආර්ථිකය රජයේ බැඳීමෙන් ඉවත් කර, අධිරාජ්‍යවාදී ප්‍රාග්ධනයට නිදහසේ අප වැනි දුබල රටවල් තව තවත් දුර්වල කිරීමට අධිරාජ්‍යවාදීන් යොදන උපක්‍රම එබඳුය. මීට කලින් ඉතිහාසයේ රාජ්‍යයන් ඍජුව ආක්‍රමණයේ උපක්‍රම යොදා ගත් බලවතුන්ම අද ඒ අවශ්‍යතාවයම ඉටුකර ගන්නේ තමන්ට අවනත දුබල පාලකයන් යොදා ගනිමිනි.

අවසානයේ ණයවල සීමා ලිහා දමන පාලකයන් විසින් ඉතිහාසයේ ඔවුනගේ කාර්ය කොටස ඉටුකර යනු ඇත. නමුත්, ජනතාවට සදාකල් එම පාලකයින් නිර්මාණය කරන අර්බුදවල පංගුව, තම කොටස ගෙවීමට සිදුවනු ඇත.

## ජාතිකත්වයන් දෙස සැකයෙන් බලන...

13 පිටුවෙන්



විනාශයක්, මනුෂ්‍ය ඝාතනයන්, දේපළ හානි සිද්ධ කරන්න පුළුවන් නම්; රටේ සිදුවන ස්ත්‍රී දූෂණයකට, රටේ කෙරෙන ළමා අපචාරයකට රටේ මෙච්චර හානියක් කරන්න පුළුවන් නම්, අපි කවර රටක්ද නිර්මාණය කර තිබෙන්නේ කියන එක ගැන. ඒවාට තරාතිරම නොබලා, ජාතිය, කුලය, ගෝත්‍රය නොබලා දඬුවම් කරන්න ඕනෑ. ඒකට තමයි පොලිසියක් තිබෙන්නේ.

හැබැයි, අද මේ රටේ හදා තිබෙන දෘෂ්ටිවාදය නිසා, මේ මතවාදය නිසා, රටේ මහා ගැටුමක් නිර්මාණය කරන්නට මෙවැනි ඕනෑම සරල සිදුවීමකට පුළුවන්කමක් ලැබෙනවා. එම නිසා අපි පටන් ගන්නවා නම් පටන් ගන්න තිබෙන්නේ, මේ වරදකරුවන් නීතිය හමුවට පමුණුවන අතරේම, කොහොමද මේ ජාතිවාදී ප්‍රවණතාව පරදවන්නේ කියන කාරණයෙන්, එවැනි අවස්ථාවක අපට ප්‍රයෝජනයට ගන්නට පුළුවන් ඉතා හොඳ මාධ්‍යයක් අපි අතහරිමින් යන්නේ. ජනමාධ්‍යවලින්, චිත්‍රපටවලින්, ටෙලි නාට්‍යවලින්, ගීතවලින් පසුගිය කාලයක් තිස්සේ ජනතාවගේ මනසට දාපු මේ මතවාද තමයි තැන් තැන්වල පුපුරා යන්නේ. ඒක එක වෙලාවක ඡන්ද බවට පත් වෙන්නට පුළුවන්. සමහරවිට ඡන්ද ජයග්‍රහණ ලබාගන්නට පුළුවන්. හැබැයි, රටක් හැටියට සමාජයක් හැටියට ඒක බරපතළ අනතුරක්.

එම නිසා අපි යෝජනා කරන්නේ, දැන්වත් අපි ඒ කටයුත්ත පටන් ගනිමු කියායි. යුද්ධයෙන් පස්සේ අවුරුදු දහයක් ගත වෙලා තිබෙනවා. ඒ කාලය තුළ අපි ජාතික සමගියක් හදන්න කටයුතු කළේ නැහැ. මිනිසුන් භය කරන්නට පුළුවන් ආකාරයට අලුත් සතුරන් සොය සොයා අපි යනවා. මේ රටේ ඉපදුණු, මේ රටේ ජීවත් වන, මේ රටේ මියයන හැම ශ්‍රී ලාංකික පුරවැසියකුටම 'ශ්‍රී ලාංකීය' කියන හැඟීම දනවන්නේ කොහොමද? ඔවුන් මේ රටේ සංවර්ධනයට දායක කර ගන්නේ කොහොමද? අනෙකා දෙවන පෙළ පුරවැසියෙකු ලෙස නොසිතා ඔවුන් තමන්ගේ සමානයන් හැටියට සිතන්නට පුරුදු කරන්නේ කොහොමද? එවැනි මානසිකත්වයක් වර්ධනය කර ගන්නා ආකාරයට අපේ මාධ්‍ය යොදා ගනිමු; අපේ දරුවන්ගේ ඔළුවලට ඒ ආකල්ප ඇතුළත් කරමු.

## සමාජවාදය සහ...

09 පිටුවෙන්




ඔල්ගා කෝබට් (Olga Korbut) 1972 මියුනිච් ඔලිම්පික් උළෙලේ කාන්තා ජිම්නාස්ටික් තරගාවලියේ රන් පදක්කම්ලාභිනිය යි. එතැන් සිට ඇය සෝවියට් දේශය වෙනුවෙන් ක්‍රීඩා කර රන් පදක්කම් 04ක් සහ රිදී පදක්කම් 01ක් දිනා දුන්නාය. සෝවියට් දේශය බිඳ වැටීමෙන් පසු ඇය 1991දී එක්සත් ජනපදයට සංක්‍රමණය වූවා ය. ඉන්පසු ඇයට වසර 61දී ජීවත් වීමට නොහැකිව රන් පදක්කම් 04න් දෙකක් සහ රිදී පදක්කම විකුණා දැමීමට සිදු විය. ඒ, 2017 වසරේ පෙබරවාරි 28 වන දිනය. ඇය පදක්කම් ඩොලර් 333,504කට වෙන්දේසි කළාය. ධනවාදය විසින් ඇයට අත්කර දුන්නේ එවැනි ඉරණමකි. 2017 වසරේ ජාත්‍යන්තර කාන්තා දිනය පැවැත්වූයේද ඉන් සතියකට පසු උදාවූ මාර්තු 08 වනදාය.

එසේ ම අභ්‍යවකාශයට පිවිසි ප්‍රථම කාන්තාව වූ වැලන්ටිනා තෙරෙස්කෝවා බිහි වූයේද සමාජවාදී සෝවියට් දේශයෙනි.

මේ සියලු කරුණුවලින් තහවුරු වන්නේ, සැබෑ කාන්තා නිදහසත් කාන්තා අයිතීනුත් ලබා දිය හැක්කේ සමාජවාදයට පමණක් බවය.

## ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදය...

05 පිටුවෙන්

බාධාවන් නැතුවාම නොවේ. ඊළඟ ජනාධිපතිවරයාට උදව්කර ඔහු යටතේ බලය හා වරප්‍රසාද භුක්තිවිඳීමට හීන මවන අන්ත ජාතිවාදී හා පාදඩ කණ්ඩායම්වල ප්‍රධානීන් මීට බාධාකිරීමට ඉඩ තිබේ. එහෙත් එකී බාධා මැද වුවද විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරගැනීම සඳහා දැන් පවතින ඉඩ යොදාගැනීම මඟහැර යා නොහැකි කාර්යයක්ව තිබේ. ඒ, මෙම දේශපාලන බල තුලනය දිගුකල් පවතින්නේ නැති නිසාය.

මෙහිදී වමේ හා ප්‍රගතිශීලී බලවේගයන් වෙත පැවරෙන වගකීම විශාලය. ධනවාදයේ නූතන අර්බුදය හා අරාජිකත්වය තුළ බිහිවිය හැකි ප්‍රජාතන්ත්‍ර විරෝධී, ඒකාධිපති පාලනයක් බිහිවීම වැළැක්වීම ඉන් ප්‍රධාන කාර්යය වේ. එසේම එය වළක්වමින් ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදය තවදුරටත් පුළුල්කර ගැනීම සඳහා විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරගැනීමද එම බලවේගයන්ගේ වගකීම වේ. එබැවින් මේ අවස්ථාව අත්නොහැරීමට මේ සියලු බලවේග වගබලා ගත යුතුය.

ජාතිවාදී අන්තවාදී පාදඩ ඒකාධිපති පාලනයක් නිර්මාණය කිරීමේ දෙසට පෙළගැසී ඇති ලංකාවේ ධනේශ්වර දේශපාලනයේ අර්බුදය හා අරාජිකත්වය එවැන්නක් බිහිවීමේ දිශාවට වර්ධනය වීමට ඉඩ නොතබා, මෙම අර්බුදයේ සාධකම උපයෝගී කරගනිමින් ප්‍රජාතන්ත්‍රවාදය පුළුල් කිරීම සඳහා විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමට යොදා ගැනීම අපගේ අරමුණ විය යුතුය. එබැවින් ජාතිවාදී හා අන්තවාදී කල්ලි කණ්ඩායම්වලින් කුමන බාධක ආවද, කුමන විග්‍රහයන් ඉදිරිපත් වුවද මේ විශේෂ මොහොතේ ලංකාවේ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කර ගැනීම සඳහා පෙරමුණ ගැනීමත් ඒ වෙනුවෙන් වහ වහා ක්‍රියාත්මක වීමත් වමේ ව්‍යාපාරයේ වගකීම වී තිබේ. එය අනාගතය සඳහා කරගනු ලබන විශාලතම ජයග්‍රහණය වන බව නොඅනුමානය.

## තඹුත්තේගමදී ගොවි...

16 පිටුවෙන්

ව්‍යාපෘතියකදී ජනතාව ඊට එරෙහි වන්නේ ඒ නිසාය. එය සාධාරණය. වගකිව යුතු ආණ්ඩුවක් නම් කළ යුතුව තිබුණේ, එක්කෝ අදාළ බලධාරීන් මැදිහත් වී ගොවි ජනතාවට කරුණු අවබෝධ කරදී ඔවුන්ගේ සැකය දුරු කිරීමය. නැත්නම් මෙම ජල ව්‍යාපෘතිය හානිකර වූවක් නම් නවතා දැමීමය. එහෙත් ආණ්ඩුව කටයුතු කළේ එසේ නොවේ. අධිකරණ වාරණ නියෝග ගත් ආණ්ඩුව, පොලීසිය ලවා උද්ඝෝෂණය කළ ගොවි ජනතාවට එලව එලවා පහර දුන් අතර අවසානයේ 50කට ආසන්න ප්‍රමාණයක් රක්ෂිත බන්ධනාගාරගත කළේය. ඒ අතර ජල ව්‍යාපෘතිය තාවකාලිකව නතර කළ බවද කියයි. එය මුලින්ම සිදුකළේ නම් මේ කිසිදු ගැටලුවක් මතුවන්නේ නැත. ගොවි ජනතාව පහර කන්නේ හෝ සිරගත වන්නේ නැත. එහෙත් ආණ්ඩුව කටයුතු කළේ 'මහදැනමුත්තාගේ' ක්‍රමයටය.

පොදු ජනතාවගේ ගැටලුවට ඇහුම්කන් නොදීමත් තම ගැටලු සඳහා උද්ඝෝෂණ ක්‍රියාමාර්ගවල නිරතවන ජනතාව අධිකරණ නියෝග මත මර්දනය කිරීමත්, ඔවුනට කඳුළු ගෑස් ජල ප්‍රහාර හා බැටන් ප්‍රහාර එල්ල කරවීමත් අපේ රටේ සියලුම ආණ්ඩුව ජානගත ලක්ෂණය වී තිබේ. විපක්ෂයේ සිටින විට ජනතාව ගැන කිඹුල් කඳුළු හෙළන ධනපති නායකයන් බලය අතට ගත්විට හැසිරෙන්නේ බැටන් පොලුවලින් වෙඩි උණ්ඩවලින් ප්‍රශ්න විසඳිය හැකි යැයි සිතාය. මේ ආණ්ඩුවද එවැනි මුග්ධ ආණ්ඩුවක් බව පැහැදිලිය. අපේ රටේ ගොවි ජනතාව ඇතුළු සියලු ජනතාව මෙම සත්‍යය තේරුම් ගත යුතුව තිබේ.

කෙසේ වුවත් රාජාංගන ගොවි ජනතාවගේ හඬට ඇහුම්කන් දෙනවා වෙනුවට ඔවුනට පොලීසිය ලවා පහරදී, සිරගත කරමින් ගොවි ජනයා මර්දනය කිරීමට ආණ්ඩුව ගත් නින්දිත ක්‍රියාමාර්ග යළිත් දැඩි පිළිකුළෙන් යුතුව හෙළා දකින අපි, අත්අඩංගුවට ගත් ගොවි නායකයින් ඇතුළු ගොවි ජනතාව වහාම නිදහස් කරන ලෙසත් ගොවි ජනයා මර්දනය කිරීම වහාම නවතන ලෙසත් ගොවි ජනතාවගේ ජීවන වෘත්තියට හානිකර ක්‍රියාමාර්ග වහා නවතන ලෙසත් ජනතාවගේ අවබෝධයෙන් හා කැමැත්තෙන් තොරව මෙම සැක සහිත ජල ව්‍යාපෘතිය ක්‍රියාවට නොනගන ලෙසත් ආණ්ඩුවට බලකරමු.

# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com




ජාතික සමගිය ගොඩනැගුමට මහානාහිමියන් බැහැදැක...




ජාතිවාදය පැරදවීමට පෙරමුණ ගෙන...




රෝමයේදී කාන්තා දින සැමරුමට සහභාගි වෙමින්...



පළාත් පාලන මන්ත්‍රීවරුන්ගේ හමුවේදී...



මහින්ද ජයසිංහ සහෝදරයා ලෝක ගුරු සංගම් සම්මේලනයේ ආසියානු උප සභාපතිවරයා ලෙස...

# සිංහල, දෙමළ, මුස්ලිම් වීමට පෙර අපි සියලු දෙනා මනුෂ්‍යයින්

## ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහෝදරයා



ආණ්ඩුව බලය තහවුරු කර ගැනීම සඳහාත් පරාජිත කණ්ඩායම් බලය ලබාගැනීම සඳහාත් ජාතිවාදය පතුරුවමින් සිටින බවට චෝදනා කළ ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහෝදරයා, ජාතිවාදී භූතයා බෝතලයෙන් එළියට ගැනීම තරම් යළි බෝතලයට ඇතුල් කිරීම පහසු දෙයක් නොවන බවත් අපි සියලු දෙනා සිංහල, දෙමළ, මුස්ලිම් වීමට පෙර සියලු දෙනා මනුෂ්‍යයින් බව තේරුම් ගත යුතුව ඇති බවත් පෙන්වා දුන්නේය.

ඔහු මෙසේ පැවසුවේ පසුගිය 06වැනි දින ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන කාර්යාලයේදී පවත්වන ලද ජනමාධ්‍ය හමුවකදීය. මෙහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ අනුර දිසානායක සහෝදරයා මෙසේද පැවසීය.

"ජාතිවාදී ප්‍රවණතාවයන් ඕපපාතිකව ඇතිවෙන්නේ යැයි අපි හිතන්නේ නැහැ. ක්‍රියාකාරීව ඉතාම අවබෝධයෙන් යුක්තව ජාතිවාදයට අවශ්‍ය වටපිටාව නිර්මාණය කරන කණ්ඩායමක් ඉන්නවා. ඒ වගේම එහි තිබෙන දේශපාලනය නොදැන අනවබෝධයෙන් එම ජාතිවාදී ප්‍රවණතාවයන්වලට ගොදුරු වෙන කණ්ඩායමක් සිටිනවා. රටේ ප්‍රධාන දේශපාලන පාර්ශ්වයන් දෙකටම මෙම ජාතිවාදී ප්‍රවණතාවය අවශ්‍ය වෙලා තිබෙනවා. සිය ආර්ථික අසමත්භාවය, ආණ්ඩුකරණයේ අසමත්භාවය, ජනතාවගේ වුවමනාවන් ඉටුකිරීමේදී ඇතිවී තිබෙන අසමත්භාවය, ජනතාවගේ අයිතිවාසිකම් ලබාදීමේදී ඇතිවී තිබෙන අසමත්භාවය නිසා තමන්ට එල්ල වන ජනතා විරෝධය වෙනතකට යොමුකර ගැනීමට ආණ්ඩුවට මෙම ජාතිවාදී ප්‍රවණතාවය වාසිදායකයි. සිංහල, මුස්ලිම්, දෙමළ ගොවි ජනතාව තමන්ගේ කාර්යය සිදුකර ගැනීමට නොහැකිව අපහසුතාවයට පත්වී තිබීම, සිංහල, දෙමළ, මුස්ලිම් තරුණ තරුණියන් තමන්ගේ අධ්‍යාපනයට සරිලන රැකියාවක් නොමැතිවීමෙන් අසීරුතාවයට පත්වී සිටීම ඇතුළු සියලු ජන කොටස් පීඩාවට පත්ව සිටින මොහොතක ආණ්ඩුවට එරෙහිව පෙළ ගැසිය යුතු ජනතාව ජාතිවාදී ප්‍රවණතාවයකට යොමුකොට තිබෙනවා.

ආණ්ඩුව පමණක් නොව පරාජිත දේශපාලන කණ්ඩායම් නැවත බලය අත්පත්කර ගැනීම සඳහා මෙම ජාතිවාදය යොදා ගනිමින් තිබෙනවා. එම පරාජිත කණ්ඩායමට නැවත අපේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ඇතිකරනවා කියා හෝ ආර්ථිකය හදනවා කියා හෝ රටට හොඳ විදේශ ප්‍රතිපත්තියක් ගේනවා කියා ඔවුන් වටා ජනතාව ආකර්ෂණය කරගැනීමට නොහැකිවී තිබෙනවා. එම නිසා ඔවුන් ජාතිවාදී ප්‍රවණතාවය වර්ධනය කරනවා.

අපි ජනතාවගෙන් ඉල්ලනවා ජාතිවාදය හෙළා දකින්න කියලා. අපේ අනාගත පරම්පරාව කුමන හෝ යුද ගැටුමටක මුහුණ දිය යුතු නැහැ. අපි සියලු දෙනා සිංහල, දෙමළ, මුස්ලිම් වීමට පෙර සියලු දෙනා මිනිස්සු බව තේරුම්ගත යුතුව තිබෙනවා. එම නිසා ජාතිවාදී ගැටුම් එපා. ජාතිවාදය පරාජය කිරීමට කටයුතු කරන්න. ජනතා විමුක්ති පෙරමුණේ අපි හැමදාමත් ජාතිවාදය ප්‍රතික්ෂේප කළ පක්ෂයක්. ඉතාම අසීරු අවස්ථාවලදී පවා ජාතිවාදීන්ට එරෙහිව සටන් කරපු ව්‍යාපාරයක්. ජාතික සමගිය වෙනුවෙන් පෙනී ඉන්න පක්ෂයක්. එම නිසා ජාතිවාදී ප්‍රවණතාවයන් පරාජය කරන්න කුමන වර්ගයේ බාධා ආවත් කුමන වර්ගයේ අවලාද ප්‍රහාර එල්ල වුණත් කටයුතු කරන්න අපි සූදානම්."

# ආණ්ඩුව කළ යුත්තේ සමාජ ජාලා තහනම් කිරීම නොව ජනතාවගෙන් එල්ල වන විවේචනවලට පිළිතුරු දීමයි

## සමාජවාදී තරුණ සංගමයේ ජාතික සංවිධායක එරංග ගුණසේකර සහෝදරයා




වර්තමාන ආණ්ඩුව බලයට පත් කිරීමට සමාජ මාධ්‍ය ජාලා විසින් වැඩි කාර්යභාරයක් සිදුකළ බවත් එසේ බලයට ආ ආණ්ඩුවට ඔවුන්ගේ වැරදි පෙන්වා දෙන විට, බැඳුම්කර හොරු ගැන කතා කරන විට, මුදල් ඇමතිට විවේචන එල්ල කරන විට ජාතිවාදය පදනම් කරගනිමින් සමාජ මාධ්‍ය වාරණය කිරීමට උත්සාහ ගන්නා බවත් පැවසූ සමාජවාදී තරුණ සංගමයේ ජාතික සංවිධායක එරංග ගුණසේකර සහෝදරයා, ආණ්ඩුව කළ යුත්තේ සමාජ ජාලා තහනම් කිරීම නොව ජනතාවගෙන් එල්ල වන විවේචනවලට පිළිතුරු දීම යැයි ප්‍රකාශ කළේය.

ඔහු මේ බව කියා සිටියේ, පසුගිය 14වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පැවැත්වූ ජනමාධ්‍ය හමුවකදීය. මෙහිදී වැඩිදුරටත් කරුණු දැක්වූ එරංග ගුණසේකර සහෝදරයා මෙසේද කියා සිටියේය.

"මේ ආණ්ඩුව ප්‍රධාන වශයෙන් ක්‍රීඩාවන් දෙකක් කළා. පළමුවැන්න තමයි, පරණ හොරු එකකත් අලුත් හොරු එක්කත් සෙල්ලම් කිරීම. දෙවැනි එක තමයි සිංහල, මුස්ලිම් ජාතිවාදය සමග සෙල්ලම් කිරීම. ඒ අනුව අද මුළු රටම ජාතිවාදී පෙට්‍රල්වලින් තෙත් වෙලා තිබෙනවා. මේ වනවිට මහනුවර සිදුවීම යම් තරමකට සමනය වීමක් සිදුවෙලා තිබෙනවා. නමුත් අපි විශ්වාස කළ යුතු නැහැ, එයින් මෙම ජාතිවාදී ප්‍රවණතාවයන් නතර වෙයි කියලා. මොකද ආණ්ඩුව කරන සෙල්ලමත් එක්ක ජාතිවාදී ප්‍රවණතාවයන් මතුවීම නතර වෙයි කියලා කියන්න බැහැ.

සමාජවාදී තරුණ සංගමයත් අප නියෝජනය කරන දේශපාලන පක්ෂයත් රටේ ජාතික සමගිය ඇතිකිරීම වෙනුවෙන් අඛණ්ඩව පෙනී ඉන්නවා."




# තඹුත්තේගමදී ගොවි ජනතාවට එල්ල කළ ප්‍රහාරය හෙළා දකිමු!

## ජ.වි.පෙ. දේශපාලන මණ්ඩලය



රාජාංගන පානීය ජල ව්‍යාපෘතියකට එරෙහිව උද්ඝෝෂණය කළ ගොවීන්ට ආණ්ඩුව පොලීසිය යොදවා කරන ලද පහරදීම හෙළා දකිමින් ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන මණ්ඩලය පසුගිය 02වැනිදා නිවේදනයක් නිකුත් කළේය. එම නිවේදනය සම්පූර්ණයෙන් මෙසේය.

රාජාංගන පානීය ජල ව්‍යාපෘතියක් පිළිබඳ ගැටලුවක් මුල්කරගෙන ඊට විරෝධය දැක්වීම සඳහා පසුගිය 28දා ගොවි ජනතාව තඹුත්තේගමදී පැවැත්වූ උද්ඝෝෂණයට ආණ්ඩුව පොලීසිය ලවා ප්‍රහාර එල්ල කොට ගොවි-ගෙවිලියන් 50කට ආසන්න ප්‍රමාණයක් රක්ෂිත බන්ධනාගාර ගතකර ඇත. තම ගැටලුවකට ආණ්ඩුවේ බලධාරීන්ගේ අවධානය යොමුකර එය විසඳා ගැනීම සඳහා උද්ඝෝෂණය කළ ජනතාවට පොලීසිය ලවා ආණ්ඩුව එල්ල කළ අමානුෂික ප්‍රහාරය අපි දැඩි පිළිකුළෙන් යුතුව හෙළා දකිමු.

අපේ රටේ ආණ්ඩු හැමවිටම ජනතාවගේ දැස් වසා ජනතාවට හානිකර ව්‍යාපෘති අරඹා ඇති බව ජනතාව අත්දැකීමෙන් දනී. ජලය පිළිබඳ ප්‍රශ්නයේදී ගොවි ජනතාවට අයිති ජල සම්පත සමාගම්වලට විකිණීම ආණ්ඩුවල ප්‍රතිපත්තිය වී තිබේ. තමන් නොදන්නා රහසිගත ජල

15වැනි පිටුවට





නියමුවාහි පළ වූ
දැනුම, සමාජය හා චින්තනය
ලිපි පෙළ කෘතියක් ලෙස
ළඟදීම ඔබ අතට...
නියමුවා ප්‍රකාශනයයකි



බත්තරමුල්ල, පැලවත්ත, පන්නිපිටිය පාරේ 464/20 හි පදිංචි එම්.ටිල්වින් සිල්වා වන මා විසින් අංක 43/20, නුගගහ පෙදෙස, පිළියන්දල පාර, මහරගම පිහිටි නියමුවා ප්‍රකාශන ආයතනයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.